# පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 38

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**අට වැනි පාර්ලිමේන්තුව**
**(තෙවන සැසි වාරය)**

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවන වාර්තාව

(2017.07.01 සිට 2017.09.30 දක්වා)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා** විසින්

2019 ජනවාරි මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

*2019 ජනවාරි මස 24 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

# <u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>
# <u>අට වැනි පාර්ලිමේන්තුව (තෙවන සැසි වාරය)</u>

2019 ජනවාරි මස 11 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (1) හි විධිවිධාන ප්‍රකාරව 2019 ජනවාරි මස 10 වැනි දින පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව විසින් අටවැනි පාර්ලිමේන්තුවේ තෙවන සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 16 දෙනා පත් කරන ලදී.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., (සභාපති)
2. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.,
3. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා, පා.ම.,
4. ගරු සුජීව සේනසිංහ මහතා, පා.ම.,
5. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.,
6. ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.,
7. ගරු වසන්ත අලුවිහාරේ මහතා, පා.ම.,
8. ගරු රන්ජන් රාමනායක මහතා, පා.ම.,
9. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.,
10. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම.
11. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා, පා.ම.,
12. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා, පා.ම.,
13. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
14. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
15. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.,
16. ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා, පා.ම.,

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>**
**<u>අට වැනි පාර්ලිමේන්තුව (දෙවන සැසි වාරය)</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අට වැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසි වාරය තුළදී, එනම් 2017 ජූලි මස 01 දින සිට 2017 සැප්තැම්බර් මස 30 දින දක්වා විමර්ශනයට ලක් කරන ලද ආයතනයන් සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු මෙම වාර්තාව තුළින් ඉදිරිපත් කරන ලබන අතර, අටවැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සභාපතිත්වයෙන් යතු පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 26 දෙනා ගෙන් සමන්විත විය.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., (සභාපති)
2. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.,
3. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා, පා.ම.,
4. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා, පා.ම.,
5. ගරු සුජීව සේනසිංහ මහතා, පා.ම.,
6. ගරු වසන්ත අලුවිහාරේ මහතා, පා.ම.,
7. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.,
8. ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.,
9. ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම.,
10. ගරු රන්ජන් රාමනායක මහතා, පා.ම.,
11. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.,
12. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම.,
13. ගරු අනුර දිසානායක මහතා, පා.ම.,
14. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා, පා.ම.,
15. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
16. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
17. ගරු බිමල් රත්නායක මහතා, පා.ම.,
18. ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා, පා.ම.,
19. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා, පා.ම.,
20. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.,
21. ගරු එස්. ශ්‍රීතරන් මහතා, පා.ම.,
22. ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා, පා.ම.,
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.,
24. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා, පා.ම.,
25. ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම.,
26. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා, පා.ම.,

# <u>පටුන</u>

පිටු අංක

සභාපතිතුමාගේ සටහන ....................................................................................vii

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවන සැසි වාරයේ පළමුවන වාර්තාව හැඳින්වීම ...................................................................................................ix

කොළඹ විශ්වවිද්‍යාලය ........................................................................................1

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය...........................................3

වී අලෙවි මණ්ඩලය.............................................................................................13

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය ......................19

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ......29

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම..................................................................................33

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය...............................39

සබරගමුව විශ්වවිද්‍යාලය .......................................................................................59

මිල්කෝ පුද්ගලික සමාගම ......................................................................................61

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය .......................................................97

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව .................................................................................101

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව............................................................109

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ..............................................................121

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම ..........................................................125

මාර්ග සංවර්ධන අධිකාරිය....................................................................................161

රුහුණ විශ්වවිද්‍යාලය............................................................................................169

කැලණිය විශ්වවිද්‍යාලය.........................................................................................171

වාර්තාවේ ඇතුළත් ආයතනයන්හි බදු පෙර ලාභය / (අලාභය) හෝ අතිරික්තය / (ඌණතාවය).................................................................................................173

## සභාපතිතුමාගේ සටහන

මෙම පාර්ලිමේන්තුව හමුවේ අද ඉදිරිපත් කරන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අටවන පාර්ලිමේන්තුවේ 7 වන කමිටු වාර්තාව, රාජ්‍ය මූල්‍ය පාලනය කෙරෙහි පාර්ලිමේන්තුව සතු වගකීම හා බලතල ක්‍රියාත්මක කිරීමේ තවත් සුවිශේෂ වූ අවස්ථාවකි.

විශේෂයෙන් පාර්ලිමේන්තුව කෙරෙහි මහජනතාවගේ ඇති විශ්වාසයත්, ගෞරවයත් බොහෝ දුරට පලුදු වී ඇති මෙවැනි වකවානුවක පාර්ලිමේන්තුවේ ස්ථාවර කාරක සභාවක් ලෙස එහි සියලු පක්ෂ - විපක්ෂ මන්ත්‍රීවරුන් පොදු කටයුත්තක් ලෙස රාජ්‍ය ව්‍යාපාර ආයතනවල මූල්‍ය විනය ආරක්ෂා කිරීමට විශේෂ අවධානය යොමු කළ යුතු අංශ ගණනාවක් පිළිබඳව 2017.07.01 සිට 2017.09.30 දක්වා කාලය තුළ අප විමර්ශනයට ලක් කළ මෙම වාර්තාවේ අඩංගු ආයතන 13ට අදාළවද බොහෝ කරුණු දක්වා ඇත. සමහර ආයතනවල පැවති විශේෂත්වය නිසාම එම ආයතන මෙම කාල සීමාව තුළම අවස්ථා කිහිපයකම කැඳවීමට සිදුවිය. ශ්‍රී ලංකන් ගුවන් සමාගම, මිල්කෝ ආයතනය එවැනි ආයතන වේ.

කෝප් (පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව) පිළිබඳව සහ පාර්ලිමේන්තුව පිළිබඳව ජනතාව තුළ විශ්වාසය හෝ අවිශ්වාසය ගොඩ නැගෙන්නේද? ගෞරවය හෝ අගෞරවය ඇති වන්නේද? යන්න තීරණය වන්නේ ජනතාව අපගේ භාවිතාව, ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය කෙරෙහි ඇති කර ගන්නා විශ්වාසය මත පමණි.

මෙම වාර්තාව මඟින් හෙළිදරව් කරන කරුණු වලින් පමණක් විගණකාධිපතිවරයාගේ හෝ අපගේ කාරක සභා කාර්ය මණ්ඩලයේ කැපවීම මත පමණක් රට තුළ දූෂණයට එරෙහිව පාර්ලිමේන්තුව හෝ කෝප් කමිටුව ක්‍රියාත්මක වන්නේ යැයි විශ්වාසයක් ගොඩ නැගිය නොහැක.

ඒ සඳහා මෙම කාරක සභාවේ නිර්දේශ හා නියමයන් ක්‍රියාවට නැගීමට බලය සහ හැකියාව ඇති විධායකය ඍජුව මැදිහත් විය යුතුය. මෙම වාර්තාවේ මතු කර ඇති කරුණු කෙරෙහිද රජයේ දේශපාලන නායකයන්ගේ අඩු අවධානය යොමු වන්නේ නම් එය පාර්ලිමේන්තුවේ සහ කාරක සභාවේ වෑයම දිය කර හැරීමක් වනු ඇත.

මෙම වාර්තාව සකස් කිරීමේදී දායක වූ අප කාර්ය මණ්ඩලයට සහ විගණකාධිපතිතුමා ඇතුළු සියලු නිලධාරීන්, භාෂා පරිවර්තන කටයුතු සිදු කල සියලු දෙනාවත්, කාරක සභාවේ සභික සියලුම මන්ත්‍රීවරුන්ටත් මගේ ගෞරවනීය ස්තුතිය පල කරමි.

සුනිල් හඳුන්නෙත්ති
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

## අටවැනි පාර්ලිමේන්තුවේ තෙවන සැසි වාරය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවන සැසි වාරයේ පළමුවන වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි අටවැනි පාර්ලිමේන්තුව තෙවන සැසිවාරයේ පළමුවන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුළුව, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යටතේ පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

ඒ අනුව, 2017.07.01 දින සිට 2017.09.30 දක්වා කාල සීමාව තුළ කමිටුවේ විමර්ශනයට ලක්වූ පහත සඳහන් ආයතන 17 අතරින් කාරක සභාව විසින් ඉදිරියේදී සභාගත කිරීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාල සම්බන්ධ විශේෂ වාර්තාවේ ඇතුළත් කිරීමට නියමිත විශ්වවිද්‍යාලයන් හැර අනෙකුත් ආයතනයන්ට අදාල නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත

**2017.07.01 දින සිට 2017.09.30 දක්වා පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතන හා විමර්ශනයට ලක් කරන ලද කාල සීමාව**

| | ආයතනය | විමර්ශනය කරන ලද දිනය | විමර්ශනයට ලක් කරන ලද කාල සීමාව/කරුණ |
|---|---|---|---|
| 1 | කොළඹ විශ්වවිද්‍යාලය | 2017.07.04 | 2012,2013 හා 2014 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 2 | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 2017.07.05 | 2011,2012,2013 හා 2014 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 3 | වී අලෙවි මණ්ඩලය | 2017.07.06 | 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා වර්තමාන කාර්ය සාධනය |
| 4 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2017.07.07 | 2017.04.06 දින කාරක සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය |
| 5 | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 2017.07.25 | 2013,2014 හා 2015 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 6 | ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 2017.07.26 | 2015/2016 වර්ෂයේ කාර්ය සාධනය |

| | | | |
|---|---|---|---|
| 7 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ගමනාගමන මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය | 2017.08.08 | 2010 හා 2011 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| | | 2017.09.08 | 2017.08.08 දින කාරක සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය |
| 8 | සබරගමුව විශ්වවිද්‍යාලය | 2017.08.09 | 2012,2013 හා 2014 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 9 | මිල්කෝ පුද්ගලික සමාගම | 2017.08.11 | 2015/2016 වර්ෂයේ කාර්ය සාධනය |
| | | 2017.08.22 | කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය |
| | | 2017.09.06 | කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය |
| 10 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 2017.08.22 | 2012,2013,2014 හා 2015 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 11 | ප්‍රාදේශිය සංවර්ධන බැංකුව | 2017.08.23 | 2012,2013 හා 2014 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 12 | ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 2017.08.24 | 2012 හා 2013 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 13 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 2017.08.25 | 2012,2013 හා 2014 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 14 | සී/ස ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම | 2017.09.06 | 2016 වර්ෂයේ කාර්ය සාධනය |
| | | 2017.09.20 | වර්තමාන කාර්ය සාධනය |
| 15 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2017.09.19 | 2011,2012,2013 හා 2014 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 16 | රුහුණ විශ්වවිද්‍යාලය | 2017.09.21 | 2011,2012,2013,2014 හා 2015 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |
| 17 | කැලණිය විශ්වවිද්‍යාලය | 2017.09.22 | 2011,2012,2013,2014හා 2015 යන වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්ය සාධනය |

# කොළඹ විශ්වවිද්‍යාලය

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 ජූලි මස 04 වන දින**

## සටහන

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය සතු විශ්වවිද්‍යාල සියල්ල වෙන වෙනම කාරක සභාව ඉදිරියට කැඳවා, එකිනෙක විශ්වවිද්‍යාලයන්හි පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡා කර එම ගැටලු හඳුනාගැනීමටත්, ඒ අනුව සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම උන්නතිය උදෙසා එම හඳුනා ගත් ගැටලු සම්බන්ධයෙන් පොදුවේ ගතයුතු ක්‍රියාමාර්ග හා නිර්දේශ ඇතුළත් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කාරක සභාව තීරණය කර ඇත.

එසේ හෙයින් කොළඹ විශ්වවිද්‍යාලය 2017 ජූලි මස 04 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවා සිදු කරන ලද විමර්ශනයට අදාල තොරතුරු කාරක සභාව විසින් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාව මගින් ඉදිරිපත් කරනු ඇත.

## ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

(නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 ජූලි මස 05 දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. අධිකාරියට අයත් විෂය පථය**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ විෂය පථයට අයත් වෘත්තීය පුහුණුවට අදාල විභාග පැවැත්වීම වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් ද සිදු කිරීම පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය.

විභාග පැවත්වීම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මගින් සිදු කරන අතර ඒ සම්බන්ධ නියාමන කටයුතු වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදුවිය යුතු බවත් (NVQ) සහතික නිකුත් කිරීම සඳහා විභාග පැවැත්වීම කොමිෂන් සභාවෙන් බැහැරව වෙනම පැවැත්විය යුතු බවත් කාරක සභාවේ අදහස විය.

**නිර්දේශ**

i. අදාල පනත සංශෝධනය වන අවස්ථාවේදී මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කිරීම.

**02. සේවක පුරප්පාඩු පැවතීම සහ ආයතනයේ ප්‍රධාන තනතුරු කිහිපයක් වැඩ බැලීමේ පදනම මත ක්‍රියාත්මක වීම.**

ප්‍රධාන නිලධාරීන් කිහිප දෙනකු වැඩ තහනමට ලක් වීම නිසා එම තනතුරු සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දීමට සිදුව ඇති බවත් අනිකුත් පුරප්පාඩු ඉතා ඉක්මනින් පිරවීමට කටයුතු යොදා ඇති බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ට අදාලව කරගෙන යන විමර්ශනවල ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් සති 02 ක් ඇතුළත කාරක සභාව වෙත යොමු කිරීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ඉහත නිර්දේශ මගින් ඉල්ලා ඇති වාර්තාව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 1-2/03/13/2017 හා 2017.10.11 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 01)**

**03. 2010 වසරේදී රු. 1,134,000/- ක් ගෙවා රේගුවෙන් නිදහස් කළ වාහනය**

උක්ත වාහනය එන්ජිම රහිතව ඔරුගොඩවත්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ මේ වන විට ගාල් කර තිබීම සහ එම වාහනයේ ලියාපදිංචි සහතිකය ආයතනය භාරයේ නොමැති වීම සම්බන්ධව කාරක සභාව ප්‍රශ්න කරන ලදී.

අළුත්වැඩියා කිරීම එල රහිත බවට මේ පිළිබඳව පරීක්ෂා කළ කමිටුවක් මගින් දැනුම් දුන් නිසා එම එන්ජිම අධ්‍යයන කටයුතු සඳහා කිලිනොච්චිය පුහුණු මධ්‍යස්ථානය වෙත ලබා දී ඇති බවත් මෙම රථයට අදාල ලියාපදිංචි සහතිකය ආයතනය භාරයේ නොමැති බවත් ඒ අංකයට වෙනත් අයෙකු වාහනයක් ලියාපදිංචි කරගෙන ඇති බව අනාවරණය වී ඇති බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව 2015 දී පරීක්ෂණයක් පවත්වා තිබෙන අතර මීට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට එමගින් නිර්දේශ ලබා දී තිබුණ නමුත් දැනට එම නිලධාරින් සේවයේ නොමැති නිසා මේ පිළිබඳව වැඩිදුර විමර්ශන සඳහා මූල්‍ය අපරාධ විමර්ශන අංශය (FCID) වෙත යොමු කර තිබෙන බවත් සභාපති වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

<u>**නිර්දේශ**</u>

i. මේ පිළිබඳව සොයා බලා ඉදිරි පියවර ගැනීම සහ සම්පූර්ණ වාර්තාවක් මාසයක් තුළ කාරක සභාව වෙත යොමු කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ඉහත නිර්දේශ මගින් ඉල්ලා ඇති වාර්තාව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 1-2/03/13/2017 හා 2017.09.25 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 04. <u>2017 වසරේදී රු. 16,380,140/- ක් රේගුවට ගෙවා පර්ජෝ වර්ගයේ වාහනයක් ලබා ගැනීම</u>

අධිකාරියට අවශ්‍යතාවක් මෙන්ම ප්‍රතිපාදන ද නොමැති අවස්ථාවක උක්ත ගනුදෙනුව සිදු කිරීම පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කරන ලදී.

මුදල් අමාත්‍යාංශයේ දැනුම් දීමකට අනුව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ඇමතිතුමා විසින් එයට එකඟවීම නිසා මෙම ගනුදෙනුව සිදුවී ඇති අතර ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ද මුදල් අමාත්‍යාංශය මගින් ලබා දී ඇති බව මෙහිදී අනාවරණය විය.

<u>**නිර්දේශ**</u>

i. මෙම වාහනය ලබා ගැනීමට කැමැත්ත විමසා මුදල් අමාත්‍යාංශය නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට එවන ලද ලිපිය කාරක සභාව වෙත යොමු කිරීම

ii. එය ලබා ගැනීමට අමාත්‍යාංශය කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපි ලේඛන කාරක සභාව වෙත යොමු කිරීම.

iii. මෙම වාහනය සම්බන්ධයෙන් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දීම.

iv. මෙවැනි වාහනයක් අවශ්‍ය බවට ඇගයීමක් කළේ නම් එම ඇගයීම් වාර්තා ලබා දීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ඉහත අංක i සිට iii දක්වා වූ නිර්දේශ මගින් කාරක සභාව ඉල්ලා ඇති ලේඛන නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 1-2/03/13/2017 හා 2017.11.10 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 02)**

නමුත් නිර්දේශ අංක iv පරිදි, එවැනි වාහනයක් අවශ්‍ය බවට ඇගයීමක් සිදු කර ඇති බව හෝ එයට අදාල වාර්තා කිසිවක් හෝ කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 05. <u>2016.12.31 දිනට සංචිත 04 ක රු. මිලියන 76 ක් පැවතිම</u>

උක්ත කරුණ පිළිබඳව කාරක සභාව කරුණු විමසා සිටි අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අදාල පනතේ දක්වා ඇති ප්‍රතිපාදන අනුව මෙම අරමුදල් ක්‍රියාත්මක වන බව සහ තාප්පයක් නැවත ඉදි කිරීමට ලද වන්දි මුදලක් ද මෙම සංචිත තුළ ඇතුළත් වන බව සභාපති ප්‍රකාශ කරන ලදී.

මෙම සාකච්ඡාවේදී අනාවරණය වු අනෙක් කරුණ වූයේ භාණ්ඩාගාර නියෝජිතයකු ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ නොමැති බවයි.

<u>**නිර්දේශ**</u>

i. භාණ්ඩාගාර නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීම.

ii. මෙම අධිකාරියට අදාල පනත සංශෝධනය කරන ඉදිරි අවස්ථාවේදී භාණ්ඩාගාර නියෝජිතයකු පත් කිරීමට අදාල වන වගන්ති ඇතුළත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

භාණ්ඩාගාර නියෝජිතයකු දැනට අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට ඉල්ලීමක් කර ඇති බවත්, අධිකාරියේ පනත සංශෝධනය කරන ඉදිරි අවස්ථාවකදී භාණ්ඩාගාර නියෝජිතයකු පත් කිරීමට අදාල වගන්ති ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇති බවත් හා දැනට භාණ්ඩාගාර නියෝජිතයකු නිරීක්ෂණ මට්ටමෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වන බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 06. <u>කොළඹට පැමිණෙන නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සඳහා කුලියට ගත් නිවස</u>

උක්ත කරුණ වෙනුවෙන් රු. 1,800,000/- වන වාර්ෂික කුලිය ගෙවා නිවසක් බදු පදනමට මිලදී ගෙන ඇතත් උක්ත කාර්යය වෙනුවෙන් යොදවා නොමැති බව අනාවරණය විය.

මෙම නිවාසය වෙනුවෙන් ඇති බදු ගිවිසුම අවසන් කිරීමට කටයුතු ආරම්භ කළ බව සභාපති ප්‍රකාශ කරන ලදී.

<u>**නිර්දේශ**</u>

මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් පහත කරුණු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් මාසයක් තුළ කාරක සභාව වෙත යොමු කිරීම.

i. මෙවැනි නිවසක අවශ්‍යතාව පිළිබඳව කරන ලද අධ්‍යයන වාර්තා
ii. මෙම තීරණයට අනුමැතිය ලද අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා
iii. ටෙන්ඩර් කැඳවීම සම්බන්ධව
iv. රජයේ තක්සේරු වාර්තා
v. පිට පළාත් වලින් පැමිණි නිලධාරීන් කොපමණ සංඛ්‍යාවක් මෙහි නැවතී සිට තිබේද?
vi. මෙහි අයිතිකරු ගැන විමර්ශනය කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 1-2/03/13/2017 හා 2017.09.25 දිනැති ලිපිය මගින් ඉහත නිර්දේශ සම්බන්ධයෙන් පහත තොරතුරු කාරක සභාව වෙත වාර්තා කර ඇත.

i. රාජකාරී කටයුතු සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ මූලස්ථානය වෙත පැමිණෙන නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සඳහා වූ නිවසක අවශ්‍යතාවය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර නොමැති බැවින් නිර්දේශ i මගින් ඉල්ලා ඇති වාර්තාව ඉදිරිපත් කර **නොමැත.**
ii. කාරක සභාවේ නිර්දේශ මගින් ඉල්ලා ඇති වාර්තා අතරින් උක්ත නිවස කුලියට ගැනීම සඳහා ආයතනයේ හිටපු සභාපති ඒ.යූ.සී.අතුකෝරල මහතා විසින් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද පාලක මණ්ඩල පත්‍රිකාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
iii. අදාල නිවස කුලියට ගැනීම සඳහා 2016.08.14 දින පුවත්පත්හි පල කරන ලද පුවත්පත් දැන්වීම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
iv. කාරක සභාව වෙත වාර්තා කර ඇත්තේ මෙම නිවස කුලියට ගැනීමේදී රජයේ තක්සේරු වාර්තා ලබා ගෙන නොමැති බවයි.
v. පිට පළාත් වලින් පැමිණි කිසිදු නිලධාරියෙකු මෙම නිවසෙහි නවාතැන් ගෙන නොමැති බවත් 2017.02.01 දින සිට 2017.04.30 දින දක්වා හිටපු උපසභාපතිවරයා මෙම නිවසේ නවාතැන් පහසුකම් ලබාගෙන ඇති බවත් එම වාර්තාව මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

**ඇමුණුම 01**

**2. වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ට අදාලව සිදුකරගෙන යන විමර්ශන වල ප්‍රගතිය**

(1) I. ප්‍රීතිකා රණසිංහ මිය - හිටපු අධ්‍යක්ෂ (මුදල්)

- අධ්‍යක්ෂ (මුදල්) බඳවා ගැනීම් සම්බන්ධයෙන් පැවැත්වූ මූලික විමර්ශනයේ නිර්දේශ මත 2015.08.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් රහිතව අධ්‍යක්ෂ (මුදල්) වශයෙන් සේවය කළ ප්‍රීතිකා රණසිංහ මහත්මියගේ වැඩ තහනම් කර එදිනම චෝදනා පත්‍රය නිකුත් කර ඇත.

- නිපුණතා අභිෂේක වැඩසටහන මාතර (නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය) පැවැත්වූ වැඩසටහන සම්බන්ධව පැවැත්වූ මූලික විමර්ශනයේ නිර්දේශ මත අධ්‍යක්ෂ (මුදල්) වන ප්‍රීතිකා රණසිංහ මහත්මිය වෙත 2016.05.20 දිනැති චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත.

II. ප්‍රදීපා උදාකර මිය - හිටපු අධ්‍යක්ෂ ජනරාල්

- උක්ත සඳහන් අධ්‍යක්ෂ (මුදල්) බඳවා ගැනීම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයේ නිර්දේශ මත අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීපා උදාකර මහත්මියට 2015.08.20 දිනැති චෝදනා පත්‍රය නිකුත් කර ඇත.

- උක්ත සඳහන් නිපුණතා අභිෂේක වැඩසටහන මාතර (නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය) පැවැත්වූ වැඩසටහන සම්බන්ධ මූලික විමර්ශනයේ නිර්දේශ මත 2015.11.09 දිනැති චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත.

- හිටපු සභාපතිවරයා විසින් ඉහත මූලික විමර්ශණ වාර්තාවේ නිර්දේශ අනුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීපා උදාකර මහත්මියගේ සේවය අවසන් කිරීම හෝ රාජකාරි වැඩ තහනම් කර විනය පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා 2015.11.06 දින රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා වෙත ලිපියක් යොමු කර ඇත.

- රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමාගේ ADM/01/08/07/14 හා 2016.02.19 දිනැති ලිපිය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීපා උදාකර මහත්මියගේ රාජකාරී වැඩ තහනම් කරන ලෙසත් මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ සලකා ඇයට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත් දැනුම් දී තිබුණි.

- ඒ අනුව 2016.02.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් රහිතව එම නිළධාරීනියගේ රාජකාරී වැඩ තහනම් කර 2015.11.09 දිනැති චෝදනා පත්‍රය මත විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කර ඇත.

III. එන්.එස්. නිශ්ශංකමිය - හිටපු අධ්‍යක්ෂ (පුහුණු)

- අධ්‍යක්ෂකවරු සහ සහකාර අධ්‍යක්ෂවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයේ නිගමන නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ (පුහුණු) එන්.එස්. නිශ්ශංක මහත්මිය 2016.08.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් රහිතව රාජකාරී වැඩ තහනම් කර 2016.08.29 දිනැති චෝදනා පත්‍රය නිකුත් කර ඇත.

- වැඩ තහනම් කිරීම අභියෝගයට ලක් කරමින් ඇය විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලදී. එම පෙත්සම අගවිනිසුරුතුමා ප්‍රමුඛ තිපුද්ගල විනිසුරුවරුන් ඉදිරියේ සලකා බැලීමෙන් අනතුරුව නිශ්ප්‍රභා කරන ලදී.

(2) උක්ත සඳහන් විධිමත් විනය පරීක්ෂණ සඳහා ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 19.5 උපවගන්තිය යටතේ විනය පරීක්ෂණ සංචිතයේ ඇතුලත් වී සිටින එස්.කේ.ලියනගේ මහතා ඒක පුද්ගල විනිශ්චක සභාව ලෙස පත් කර ඇත.

| විධිමත් විනය පරීක්ෂණ | චූදිත නිලධාරි | ඒක පුද්ගල විනිශ්චක සභාව පත් කල දිනය | විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කල දිනය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ (මුදල්) බඳවා ගැනීම | ප්‍රීතිකා රණසිංහ මහත්මිය හිටපු අධ්‍යක්ෂ (මුදල්) | 2015.09.14 | 2015.10.30 |
| | ප්‍රදීපා උදාකර මහත්මිය හිටපු අධ්‍යක්ෂ ජනරාල් | 2015.09.04 | 2015.10.16 |
| නිපුණතා අභිෂේක වැඩසටහන - මාතර | ප්‍රදීපා උදාකර මහත්මිය හිටපු අධ්‍යක්ෂ ජනරාල් | 2016.04.18 | 2015.05.28 |
| | ප්‍රීතිකා රණසිංහ මහත්මිය හිටපු අධ්‍යක්ෂ (මුදල්) | 2016.08.03 | 2016.08.25 |
| අධ්‍යක්ෂ (පුහුණු) බඳවා ගැනීම | එන්.එස්. නිශ්ශංක මහත්මිය හිටපු අධ්‍යක්ෂ (පුහුණු) | 2016.11.23 | 2016.12.21 |

(3) මේ වන විට අධ්‍යක්ෂ (මුදල්) බඳවා ගැනීම් සම්බන්ධ හිටපු අධ්‍යක්ෂ (මුදල්) ප්‍රීතිකා රණසිංහ මහත්මියගේ හා හිටපු අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීපා උදාකර මහත්මියගේ විධිමත් විනය පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති බවත් එම විධිමත් විනය පරීක්ෂණ වාර්තාව ලබා දීමට කටයුතු කරන බවත් ඒක පුද්ගල විනිශ්චක සභාව විසින් දන්වා ඇත.

(4) උක්ත විධිමත් විනය පරීක්ෂණයන්හි 2017.05.23 දින වන විට ප්‍රගතිය ඒක පුද්ගල විනිශ්චක සභාව විසින් දන්වා ඇත. (ඇමුණුම I)

| විධිමත් විනය පරීක්ෂණ | චූදිත නිලධාරි | විධිමත් විනය පරීක්ෂණ ප්‍රමාද වීමට හේතු |
|---|---|---|
| නිපුණතා අභිෂේක වැඩසටහන - මාතර | ප්‍රදීපා උදාකර මහත්මිය හිටපු අධ්‍යක්ෂ ජනරාල් | පරීක්ෂණ සඳහා සහභාගී නොවීම, රැකවරණ නිළධාරියා මිය යාම නිසා නව රැකවරණ නිළධාරියකු පත් කිරීම හා මසකට එක් වරක් පමණක් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන ලෙස කල ඉල්ලීම යන කරුණු මතද |
| | ප්‍රීතිකා රණසිංහ මහත්මිය හිටපු අධ්‍යක්ෂ (මුදල්) | පරීක්ෂණ සඳහා සහභාගී නොවීම මතද |
| අධ්‍යක්ෂ (පුහුණු) බඳවා ගැනීම | එන්.එස්. නිශ්ශංක මහත්මිය හිටපු අධ්‍යක්ෂ (පුහුණු) | අවසන් සාක්ෂිකරුගේ සාක්ෂිය මෙහෙය වීමට පමණක් ඇත |

(5) නමුත් හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය ප්‍රදීපා උදාකර මහත්මිය, හිටපු අධ්‍යක්ෂ (මුදල්) ප්‍රීතිකා රණසිංහ මහත්මිය හා හිටපු අධ්‍යක්ෂ (පුහුණු) එන්.එස්. නිශ්ශංක මහත්මිය විසින් 2017.06.05 වන දින ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කල ලිපිය අනුව දැනට සිටින ඒක පුද්ගල විනිශ්චය සභාව වෙනස් කිරීම සඳහා 2017.07.21 දින පාලක මණ්ඩල අනුමැතිය සඳහා පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කල අතර ඒ අනුව ඒක පුද්ගල විනිශ්චය සභාව වෙනස් කිරීමට හා නැවත මෙම විධිමත් විනය පරීක්ෂණ කටයුතු මුල සිට ආරම්භ කිරීමට අනුමැතිය ලැබුණි. 2017.08.18 දින පැවති පාලක මණ්ඩල රැස්වීම මගින් පාලක මණ්ඩල සටහන් සම්මත කරන

ලදී. පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 19.5 උපවගන්තිය යටතේ නම් කරන ලද විනය පරීක්ෂණ නිළධාරී සංචිතයෙන් විනය පරීක්ෂණ නිළධාරියෙකු ලෙස ඇතුලත් වී සිටින ඩබ්. එම්.ගමගේ මහතා නිපුණතා අභිෂේක වැඩසටහන මාතර (නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය) පැවැත්වූ වැඩසටහන සම්බන්ධව ඒක පුද්ගල විනිශ්චය සභාව ලෙසද ධර්ම හේවාමද්දුම මහතා, අධ්‍යක්ෂ (පුහුණු) බඳවා ගැනීම් සම්බන්ධ විනිශ්චය සභාව ලෙසද පත් කර ඇති අතර මෙම මස තුල විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ.

ශෙහාන් සෙනවිරත්න
සභාපති

**ඇමුණුම 02**

07 MAR 2017

**Ravi Karunanayake - M.P**
**Minister of Finance**

07 MAR 2017

640

*My Ref: FM/KADS/E/5445/17* *Date: 28.02.2017*

*Hon Mahinda Samarasinghe*
*Minister of Skills Development and Vocational Training,*
*Ministry of Skills Development and Vocational Training,*
*"Nipunatha Piyasa"*
*Elvitigala Mawatha, Narahenpita,*
*Colombo 05*

*Dear Mahinda,*

*Donation of two brand new Peugeot vehicles to the Automotive training institute*

*I have been informed by Carmart that their principals, Automobiles Peugeot, that two 2015 brand new Peugeot 508 vehicles were sent to India for a motor show, but will not be retained in India as the vehicles were sent on a Carnet and then on shipped to Sri Lanka on a no foreign exchange basis.*

*Carmart, together with their principles, Automobiles Peugeot has requested me ~~to consider~~ these vehicles to be donated to a Sri Lankan engineering institute to be used as a work bench to give automotive engineering students hands on experience in working on the latest high-tech cars.*

*I have instructed my team to coordinate with yours to arrange this to be given to the Japan Tech and German Tech institutes respectively.*

*I would appreciate your support as always to clear these vehicles via National Apprentice & Industrial Authority in order to facilitate the donation.*

*Furthermore, I also look forward to hand over these vehicles with your participation on a mutually acceptable date.*

*Thank you.*
*Yours Faithfully,*

*Ravi Karunanayake*
*Minister of Finance*

*Cc: 1. Dr. R.H.S. Samaratunga, Secretary to the Treasury, Ministry of Finance*
*2. Mr. K.D.S. Ruwanchandra, Director General of Budget Department*
*3. Mr. Yasendra Amarasinghe, Chief Executive Officer, Carmart Limited, 424 Union Place, Colombo 02.*

*K-h/a*

Office: +94112484500, +94112484600, +94112484700, +94112434798 Fax No: +94112422507
Website : www.treasury.gov.lk, email : minister@mo.treasury.gov.lk

2-2/03/3(ii)/2017 9/03/2017

Director General of Budget,

Department of National Budget, General Treasury,

Colombo 01.

**Donation of two Brand New Peugeot vehicles to the Automotive Training Institute**

This has reference to the letter no. FM/KAD/E/5445/17 dated 28/02/2017 addressed to Hon.Mahinda Samarasinghe, Minister of Skills Development and Vocational Training by Hon.Ravi Karunanayeka, Minister of Finance with a copy to you on the above subject.(The copy of letter attached)

With the purpose of giving hands on experience to the students of the Sri Lanka Engineering Institutes (German Tec & Japan Tec) on the latest high tech cars, two brand new Peugeot 508 vehicles have been donated by Carmart (Pvt) Limited and clearance should be done by the National Apprentice & Industrial Training Authority (NAITA).

As the Ministry of Skills Development & Vocational Training we have to bear the cost of Tax & demurrage amounting to Rs.32, 798,481/-for clearance as per the letter of Carmart (Pvt) Ltd.

We would appreciate if you could grant an additional allocation to following vote amounting to Rs32, 798,481/- since our budget provision is insufficient to cover the expense to proceed with this donation.

| Vote | Amount (Rs.) |
|---|---|
| 197-01-02-04-2201-NAITA | 16,399,240.50 |
| 197-01-02-13-2201-CGTTI | 16,399,240.50 |

Your early attention in this regard is highly appreciated.

Secretary
Ministry of Skills Development & Vocational Training
o/c

Copy: 1 Chairman, National Apprentice & Industrial Training Authority (NAITA)
2 Chairman, Ceylon German Technical Training Institute (CGTTI)

## වී අලෙවි මණ්ඩලය

(ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 ජූලි මස 06 වන දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

### 01. 2013 වර්ෂය තුළදී සහල් අපනයනය

වර්ෂ 2013 දී සහල් අපනයනය කිරීමේදී මෝල් හිමියන් 32 සඳහා මණ්ඩලයෙන් වී ලබා දී ඇති නමුත්, එම සම්පූර්ණ වී තොගයෙන් කොටසක් පමණක් සහල් බවට පත් කර සතොසට ලබා දී ඇති අතර, ඉතිරි වී තොගය වෙනුවෙන් මණ්ඩලයට තවදුරටත් අය විය යුතු මුදල අය කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක්ද යන්නත්, මෙවැනි වංචා ඉදිරියේදී සිදු වීම වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්නත් කාරක සභාව විසින් විමසන ලදී.

එම වී මෝල් හිමියන් 32 අතුරින් 06 දෙනෙකුට විරුද්ධව 2014 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති අතර ඔවුන් අසාධු ලේඛනගත කර ඇති බවත්, ගිවිසුම් රහිතව එම මෝල් හිමියන් සමඟ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් චූදිත නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, ඉදිරියේදී මෙවැනි වංචා වැළැක්වීම සඳහා වී මෝල් හිමියන්ගේ ව්‍යාපාර ලියාපදිංචිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරන බවටත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. පරීක්ෂණ පැවැත්වීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වී මෝල් හිමියන්ගේ නාම ලේඛනය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

ii. පහත විමසීම් පිළිබඳව වෙන් වෙන් වශයෙන් තොරතුරු ඇතුළත් කරන ලද වාර්තාවක් කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම.

- මණ්ඩලය මඟින් විනය ක්‍රියාමාර්ග ගෙන ඇති එක් එක් කරුණ සම්බන්ධයෙන් චූදිත නිලධාරීන් කවුද?
- ඔවුන්ට විරුද්ධව ගනු ලැබූ විනය ක්‍රියා මාර්ග මොනවාද?

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

i. 2013 වර්ෂය තුළ දී වී අලෙවි මණ්ඩලය විසින් අපනයනය සඳහා වී නිකුත් කර ඇති වී මෝල් හිමියන් අතරින් නියමිත සහල් ප්‍රමාණ ආපසු භාර නොදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වී මෝල් හිමියන්ගේ නාම ලේඛනය 2017.08.22 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙතද පිටපතක් සහිතව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත. එම නාම ලේඛනය පහත පරිදි වේ.

| වී මෝලේ නම | වී මෝල් හිමිකරුගේ නම | පැමිණිලි කර ඇති මුදල් වටිනාකම (රු.) |
|---|---|---|
| ඔකාස් හාල් මෝල | එම්.එස්.එම්. හාරුන් මයා | 10,032,785.00 |
| අබුල් හාල් මෝල | ඒ.කේ.අබුල් මයා | 17,963,913.00 |
| රයිස් ලංකා හාල් මෝල | එම්.එස්.එම්. හාරුන් මයා | 39,239,429.00 |
| නිව් රෝයල් හාල් මෝල | ජේ.එම්. සුබයිර් මයා | 37,630,444.00 |
| ෆාතිමා හාල් මෝල | පී.ජී.එම්.එච්.එම්.සෆ්රිකාන් මයා | 7,762,214.00 |
| කටුකැලියාව හාල් මෝල | එල්.වී.සුනිල් මයා | 6,613,045.00 |
| ජයවික්‍රම හාල් මෝල | ජේ.ඒ.එස්.එම්. ජයවික්‍රම මයා | 15,472,891.00 |
| ඒ.එස්.එම්. හාල් මෝල | එස්.එම්.එම්.ෆවුස් මයා | 9,278,955.00 |

ii. ණය පදනම යටතේ වී නිකුතු කිරීමට අදාල උක්ත සිදුවීම සම්බන්ධයෙන් මූලිකවම වගකිව යුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කේ.ඒ.වී.යූ.එස් පෙරේරා මහතා සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇති බව,

- ඔහුට විරුද්ධව අධිකරණයේ නඩුවක් ගොනු කිරීම.
- ආයතනික මට්ටමෙන් මූලික පරීක්ෂණයක් පවත්වා චෝදනා පත්‍ර නිකුත් කිරීම. (අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් විධිමත් විනය පරීක්ෂණ කටයුතු තාවකාලිකව නතර කොට ඇත.)

iii. සාමාන්‍යාධිකාරී කේ.ඒ.වී.යූ.එස් පෙරේරා මහතා සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණයන්හිදී අනාවරනය වන කරුණු අනුව මෙයට වගකිව යුතු තවත් නිලධාරීන් වෙතොත් ඔවුන් සම්බන්දයෙන් ද විනය ක්‍රියාමාර්ග ගැනීම.

## 02. සත්ත්ව ආහාර සඳහා වී අලෙවි කිරීම

වර්ෂ 2014/15 මහ කන්නයේ හා 2015 යල කන්නයේ කිලෝවක් රු.45 බැගින් මිලදී ගන්නා ලද නාඩු වී තොගයක්, රු.45/- ට විකිණීමේ හැකියාව තිබියදී, වර්ෂ 2016දී කිලෝවක් රු.24/- බැගින් සත්ත්ව ආහාර සඳහා පුද්ගලික සමාගම් වෙත අලෙවි කිරීමෙන් මණ්ඩලයට සිදු වූ රු.මිලි.2487.7ක අලාභය සම්බන්ධවත්, මෙසේ නිකුත් කළ තොගය තුළ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වී පමණක් නොව හොඳ තත්ත්වයේ වී තොග ද අඩංගු වීම පිළිබඳවත්, එම වී තොග සත්ත්ව ආහාර සකස් නොකරන වී මෝල්වල වැඩි මිල ගණන් යටතේ විකිණීම පිණිස පවත්වාගෙන යැම පිළිබඳවත් කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

වී මිලදී ගැනීම හා විකිණීම පිළිබඳ අධිබලැති කමිටුව මඟින් මිල තීරණය කරනු ලැබූ පරිදි, ඒ වන විට වී අලෙවි මණ්ඩලයේ විශාල වී අතිරික්තයක් පැවැති බැවින් ඉදිරි වී අස්වැන්න නෙලන කාලයේ ගබඩා පහසුකම් ලබා ගැනීම සඳහා ඉහත විකිණීම් සිදු කර

ඇති අතර, එහිදී එම වී මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු/නුසුදුසු තත්ත්වය නොසලකා එම තොග නිකුත් කිරීමට කටයුතු කර ඇති බව අමාත්‍යංශ ලේකම් සහ මණ්ඩලයේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

පහත සඳහන් තොරතුරු පිළිබඳ වාර්තාවක් කාරක සභාවටද පිටපත් සහිතව අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය වෙත සතියක් තුළදී යැවීම.

i. ලංකාව තුළ දීප ව්‍යාප්තව පවතින වී ගබඩා කළ හැකි සියලුම ගබඩා පිහිටි ස්ථාන
ii. දැනට එම ගබඩා පවතින්නේ කුමන අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව/පුද්ගලික ආයතනය සතුවද යන වග
iii. එම ගබඩා වල ගබඩා ධාරිතාවය
iv. ඒවායෙහි වී ගබඩා කිරීම සඳහා සුදුසු/ නුසුදුසු භාවය
v. ගබඩා අවශ්‍යතාවය (කුමන ප්‍රදේශවල, කුමන ආකාරයේ ගබඩා අවශ්‍යද යන්න)
vi. සියලුම ගබඩාවල වෙන් වෙන් වශයෙන් මේ වන විට වී ගබඩා කර ඇති ප්‍රමාණය
vii. එම ගබඩාවල තවදුරටත් වී ගබඩා කළ හැකි ප්‍රමාණය
viii. වී ලැබෙන ප්‍රදේශයට අනුව ගබඩා ධාරිතාවෙහි කොපමණ හිඟයක් හෝ අතිරික්තයක් පවතිනවාද යන්න
ix. දැනට පවතින මෙම ගබඩා සංඛ්‍යාව ප්‍රමාණවත්ද යන්න
x. ඉහත (ix) හි සඳහන් ගබඩා සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන්නේ නම්, නව ගබඩා ස්ථාපිත විය යුත්තේ, කුමන දිස්ත්‍රික්කවල, කුමන නගරවල ද යන්න

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශයේ ලේකම්ගේ අංක MRE/3/13/4/2016 හා 2017.08.23 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙතද පිටපතක් සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත යොමු කර ඇත.

## 03. වී ගබඩා ස්ථාපිත කිරීම

වී මිල පාලනය කිරීමට අවශ්‍ය ප්‍රමාණයට මණ්ඩලය මගින් වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන සම්පූර්ණ ගබඩා ධාරිතාව/ ගබඩා අවශ්‍යතාව කොපමණද යන්න පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයක් සහ වී තොග ගබඩා කර තබා ගැනීම, නිකුත් කිරීම හා මිල තීරණය කිරීම සම්බන්ධව විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කර තිබේද යන්න පිළිබඳවත් කාරක සභාව විසින් විමසන ලදී.

මෙවැනි අධ්‍යයනයක් සිදු කර නොමැති බවත්, දැනට මණ්ඩලයට සිදු වන පාඩුව අවම වන පරිදි වී මිලදී ගැනීම, තොග තබා ගැනීම හා විකිණීම ආදී කරුණු සම්බන්ධව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ඒ සඳහා උපාය මාර්ගික සැලසුමක් නිර්මාණය කළ හැකි බවත් මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාව දැනුවත් කරන ලදී.

<u>නිර්දේශ</u>

i. මෙම කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දැනට සකස් කර ඇති සැලැස්ම සතියක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

ii. එය වැඩි දියුණු කිරීමෙන් අනතුරුව සම්පූර්ණ කරන ලද සැලැස්ම පසුව ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙතද පිටපතක් සහිතව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් වෙත 2017.08.22 දිනැතිව යොමු කර ඇති ලිපිය මගින් නව වී ගබඩා ස්ථාපිත කිරීම හා පවත්නා ගබඩාවල ප්‍රමිතිය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති වාර්තා කාරක සභා වෙත ඉදිරිපත් කර ඇත.

ii. වී මිලදී ගැනීම, වී තොග අලෙවි කිරීම සම්බන්ධ කෙටි හා දිගු කාලීන උපාය මාර්ග ඇතුළත් සම්පූර්ණ සැලැස්මක් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශයේ ලේකම්ගේ අංක MRE/03/03/13/4/2016 හා 2017.09.27 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 04. <u>සාමාන්‍යාධිකාරී තනතුර</u>

මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තනතුර මේ වන විට පුරප්පාඩුව පැවතීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින, හිටපු සාමාන්‍යාධිකාරීගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ නඩුවක් හේතුවෙන් සාමාන්‍යාධිකාරී තනතුරට නව නිලධාරියෙකු පත් කිරීමේ හැකියාවක් නොපවතින බව මණ්ඩලයේ මතය විය.

<u>නිර්දේශ</u>

i. සාමාන්‍යාධිකාරී තනතුරේ දැනට පවතින පුරප්පාඩුව නොපමාව සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

සාමාන්‍යාධිකාරී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි වර්තමාන තත්ත්වය 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත වාර්තා කර නොමැත.

## 05. <u>පියවීමට ඇති ණය සහ ලැබීමට ඇති ණය</u>

මණ්ඩලය විසින් භාණ්ඩාගාරයට, ලංකා බැංකුවට හා මහජන බැංකුවට ලබා දිය යුතුව ඇති ණය පියවීමට කටයුතු කරන්නේ කෙසේද යන්නත්, වෙනත් රාජ්‍ය ආයතනයන්ගෙන් මණ්ඩලයට ලැබිය යුතු ණය අය කර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳවත් කාරක සභාව විසින් සාකච්ඡා කරන ලදී.

රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිසා මෙවැනි වගකීමක් ඇති වී ඇති අතර, ඒ සම්බන්ධව ගනු ලැබූ කැබිනට් තීරණයක් අනුව ඉදිරි කටයුතු දැනට කර ගෙන යනු ලබන බවට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් අදහස් දක්වන ලදී.

**නිර්දේශ**

i. ආයතනයේ අරමුණු වලට හානි නොවන පරිදි පාඩු පියවා ගැනීම සඳහා ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කිරීම.

ii. කුඩා හා මධ්‍යම පරිමාණයේ මෝල් හිමියන් මණ්ඩලයට ආකර්ශනය කර ගැනීම සඳහා උපාය මාර්ගික වැඩපිළිවෙළක් සකස් කිරීම.

## 06. වී තොග හානි

පොළොන්නරුව - දකුණ හා වයඹ, අනුරාධපුර සහ අම්පාර කලාප වල ගබඩා 235ක, රු.මිලි. 506ක් වටිනා වී තොග කිලෝ ග්‍රෑම් 16,853,527 ක ඌනතාවයක් හඳුනාගෙන තිබූ අතර, එකී කලාපවල රු. මිලි.17ක් වටිනා වී තොග කිලෝ ග්‍රෑම් 586,107ක් හානි වී තිබූ අතර මෙවැනි හානි සහ ඌනතාවයන් වළක්වා ගැනීම සඳහා තොග සත්‍යාපනය කිරීමේ වැදගත්කමත්, ප්‍රථමයෙන් ලැබෙන තොගය ප්‍රථමයෙන් නිකුත් කිරීම සඳහා ගබඩාවල දැනට පවතින අඩුපාඩු මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

වර්ෂ 2014 දී සිදු කරන ලද තොග සත්‍යාපනයේදී මෙම ඌනතාවය හඳුනාගෙන ඇති අතර, මේ වන විටද තොග සත්‍යාපනය කිරීමක් සිදු කරන බවත් මෙහිදී අසාමාන්‍ය ලෙස තොග හානියට ලක් වීමට වගකිව යුතු නිලධාරීන් අතුරින් නිලධාරීන් 14දෙනෙකුගෙන් රු. මිලි. 9.17ක් අය කර ගැනීමට දැනට කටයුතු කරමින් පවතින බවත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් පැහැදිලි කරන ලදී.

**නිර්දේශ**

i. ප්‍රථමයෙන් ලැබෙන වී තොගය ප්‍රථමයෙන් නිකුත් කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය සතු ගබඩාවල ගබඩා පහසුකම් සකස් වී ඇති ආකාරය පිළිබඳ වාර්තාවක් ලබා දීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

උක්ත වාර්තාව විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරියේදී ලැබීමට නියමිතය.

## රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

(සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය)

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය)

**විමර්ශනය කරන ලද දිනය : 2017 ජූලි මස 07 දින**

2017 අප්‍රේල් මස 06 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කාරක සභාව ඉදිරියට කැඳවන ලද අතර, එහිදී පිළිකා ඖෂධය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කාරක සභාව 2017 මැයි මස 24 වන දින ප.ව 2.30ට යළි රැස්වීමටත් එදිනට පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමයේ නිලධාරීන්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිලධාරීන්, අමාත්‍යාංශ ලේකම් සහ අදාළ නිලධාරීන්, වෛද්‍ය සැපයීම් අංශයේ නිලධාරීන්, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අවසන් වරට හිටපු සභාපති සහ හිටපු ප්‍රධාන විධායක නිලධාරී සහ දැනට සිටින සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහභාගි විය යුතු බව කාරක සභාව තීරණය කරන ලදී.

2017 මැයි මස 24 වන දින ප.ව 2.30ට පැවත්වීමට නියමිතව තිබූ කාරක සභා සැසි වාරය 2017 ජූලි මස 07 වන දින දක්වා කල් තැබූ අතර, ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ඇතුළු අදාළ පාර්ශව කාරක සභාව ඉදිරියට කැඳවන ලද අතර එම විමර්ශනයන්ට අදාළ තොරතුරු මෙමගින් අනාවරණය කෙරේ.

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

### 01. <u>ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් වගකීමකින් තොරව කරුණු ඉදිරිපත් කිරීම.</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදෙස් පරිදි විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් මතභේදයට තුඩු දී ඇති පිළිකා ඖෂධය පිළිබඳ කරුණු විමසීමේදී, එම කරුණු වගකීමකින් තොරව ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයාගේ අත්සන නොමැතිව ඉදිරිපත් කිරීම පිළිබඳව කාරක සභාවේ දැඩි අප්‍රසාදය පළවිය.

**<u>නිර්දේශ</u>**

i. මින් පසු තොරතුරු ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් වීම සහ වගකිව යුතු ලෙස කටයුතු කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් බැහැරට යන ලිපි ලේඛනවල සාමාන්‍යයෙන් යොදනු ලබන්නේ අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සන වන බැවින් අධිකාරිය විසින් විගණන අංශය වෙත යොමු කරන ලද උක්ත ලිපියේ ද ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සන යොදා ඇති බව සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SH/NMRA-COPE/02/2018 හා 2018.03.29 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

නමුත් මෙම කරුණු කාරක සභාව වෙත වාර්තා කිරීම සඳහා අධිකාරිය විසින් සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත 2018.03.16 දින යොමු කරන ලද ලිපිය අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සනින් යුතුව, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති මගින් සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. **(ඇමුණුම 03)**

**02. <u>පිළිකා රෝගය සඳහා ගෙන්වූ Herticad ඖෂධය රුසියාවේ ලියාපදිංචි කළ ආයතනය</u>**

ශ්‍රී ලංකාවේ ඖෂධ ලියාපදිංචි කිරීමේ කටයුතු ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් සිදු කරන ආකාරයට මෙම ඖෂධය රුසියාවේ ලියාපදිංචි කර ඇත්තේ කුමන ආයතනයකද යන්න කාරක සභාව විමසන ලදී.

ඖෂධයක් යම් රටක ලියාපදිංචි කිරීමේ කටයුත්තේදී ඒ සඳහා Certificate of Pharmaceutical Products (COPP) ලබා ගත යුතු අතර බොහෝ රටවල එය නිකුත් කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යංශයට අනුබද්ධ ආයතනයක් මගිනි. නමුත් ප්‍රස්තුත ඖෂධය සඳහා රුසියාවේ මෙම සහතිකය නිකුත් කර ඇත්තේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශය මගින් බව ඖෂධ නියාමන අධිකාරියේ නියාමන ඖෂධවේදී (Regulation Pharmacist) ප්‍රකාශ කරන ලදී.

**03. <u>ඖෂධ අනුමත කිරීමේ තාක්ෂණික කමිටු සංයුතිය</u>**

මෙම ඖෂධය ලංකාවට ගෙන්වීමට අදාළ තාක්ෂණික කමිටුවේ පිළිකා ඖෂධය පිළිබඳ දැනුවත් වූ වෛද්‍යවරුන් සිටියේද නැත්ද යන්න කාරක සභාව විමසා සිටින ලදී.

මෙය කැබිනට් ටෙන්ඩරයක් බැවින් ඒ සඳහා තාක්ෂණික කමිටුව අනුමත කරන්නේ අමාත්‍යංශයේ වෙනම අංශයකින් බව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති ප්‍රකාශ කරන ලදී.

Herticad නම් ඖෂධය,

i. තාක්ෂණික කමිටු කිහිපයකදීම සුදුසු නොමැති බව ප්‍රකාශ කරන ලද බවත්,

ii. එම මතය නොසලකා හැර ඇති බවත්,

iii. එම විරෝධතාව තිබියදීත් එම ටෙන්ඩරය ලබා දී ඇති බවත් ,

iv. එසේම ඖෂධය අවශ්‍ය වූ විට එය ඉල්ලා සිටින්නේ Trastuzumab යන ඖෂධීය නාමයෙන් බවත් කිසි ලෙසකින් වත් Herceptin යන වෙළඳ නාමයෙන් ඉල්ලා නොසිටි බවත් පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිනිය ප්‍රකාශ කර සිටියාය.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

Herticad නම් ඖෂධය සම්බන්ධයෙන් පත් කරන ලද පළමු තාක්ෂණික ඇගයීම් කමිටුවට පිළිකා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙක් සහභාගී වූ බවත් එහිදී එක් වෛද්‍යවරයෙක් Herticad ඖෂධය මිල දී ගැනීම පිළිබඳව එකඟ නොවූ බවත් අනෙක් වෛද්‍යවරුන් දෙදෙනා එකඟ වූ බවත් වාර්තා කර ඇත. ඒ අනුව නැවත විශේෂඥ වෛද්‍යවරුන් පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරන ලද බවත් එහිදීද

මුල් කමිටුවේදී විරුද්ධත්වය ප්‍රකාශ කරන ලද වෛද්‍යවරයා හැර අනෙකුත් වෛද්‍යවරුන් සිව් දෙනා එකඟත්වය ප්‍රකාශ කරන ලද බවත් සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SH/NMRA-COPE/02/2018 හා 2018.03.29 දිනැති ලිපිය මගින් වැඩි දුරටත් වාර්තා කර ඇත. නමුත් එම තාක්ෂණික ඇගයීම් කමිටු විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ කිසිවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

**04.** **<u>විගණකාධිපතිවරයා විසින් පක්ෂග්‍රාහීව කටයුතු කළ බවට ඖෂධ නියාමන අධිකාරියේ නියාමන ඖෂධවේදි ක්‍රිෂාන්ත ද සිල්වා මහතා විසින් චෝදනා කිරීම.</u>**

ඖෂධ ලියාපදිංචියේදී තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීමේ කමිටු රැස්වීම සඳහා අදාළ වෛද්‍යවරුන් නොමැතිව අනුමැතිය ලබා ගෙන ඇති බව විගණන මතය අනුව තහවුරු වී ඇති බව විගණකාධිපති විසින් සඳහන් කළ අවස්ථාවේදී ඉහත සඳහන් වන බරපතල චෝදනාව සිදු කිරීම.

**<u>නිර්දේශ</u>**

i. අදාල නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණයක් පවැත්වීම හා එම වාර්තාව කාරක සභාව වෙත ලබා දීම.

ii. ක්‍රිෂාන්ත ද සිල්වා මහතා කාරක සභාවේදී පිළිතුරු දීම සඳහා රැගෙන එන ලද සහ මේ සම්බන්ධයෙන් ගොනු කර ඇති නඩුවට ඉදිරිපත් කිරීමට සකස් කරන ලද ලිපිගොනු සියල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දීම සහ ඒ පිළිබඳ ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SH/NMRA-COPE/02/2018 හා 2018.03.29 දිනැති ලිපිය මගින් සඳහන් කර ඇත්තේ විගණන නිලධාරීන් වෙත ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් ලබා දෙන ලද ඇතැම් තොරතුරු නොසලකා හරිමින් මෙම වාර්තාව සකස් කර ඇති බව හැඟී ගිය බැවින් ඇතිවූ සිත් වේදනාව මත විගණකාධිපතිවරයා පිළිබඳ නොව අදාල වාර්තාව සැකසූ නිලධාරීන් පිළිබඳව මෙම ප්‍රකාශය සිදු කරන්නනට ඇති බවත්, මේ සම්බන්ධයෙන් ක්‍රිෂාන්ත ද සිල්වා මහතා කෝප් කමිටුවේදී විගණන නිලධාරීන්ගෙන් සමාව ගෙන ඇති බවත්ය.

නමුත් ඖෂධවේදි ක්‍රිෂාන්ත ද සිල්වා මහතා සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිර්දේශ කර ඇති පරිදි විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලද බවක් හෝ විනය පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කිසිවක් හෝ මෙතෙක් කාරක සභාව වෙත වාර්තා කර නොමැත.

එනම් කාරක සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වා නොමැති බව නිරීක්ෂණය වේ.

## 05. **Herticad ඖෂධය ලබා දීමට පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමය විරුද්ධ වීමට හේතු**

මෙම ඖෂධය රුසියාවේ රෝගීන් 44 දෙනෙකුට පමණක් ලබා දීමත් එයින් රෝගීන් 05 දෙනෙකු මිය යාමත්, එසේම මෙම බෙහෙත පැතිරුනු පියයුරු පිළිකා රෝගීන්ට ලබා දෙන බෙහෙතක් වන අතර එය මූලික අවස්ථාවේ පියයුරු පිළිකා රෝගීන්ටත් දීමට සිදු වීම හානිදායක නිසා එයට විරුද්ධ බව සංගමය ප්‍රකාශ කරන ලදී. නමුත් පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමයේ වෛද්‍යවරු කොටසක් මේ ඖෂධය රෝගීන්ට ලබා දෙන බවත්, තවත් කොටසක් එසේ ලබා නෙදෙන බවත් ලබා නොදෙන වෛද්‍යවරුන් සඳහා විනය පරීක්ෂණ වලට මුහුණ පෑමට සිදු වන බවත් සංගමයේ සභාපතිනිය වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

## 06. **Herticad පිළිකා ඖෂධය ලියාපදිංචියෙන් පසු පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමයෙන් පැමිණිලි ඉදිරිපත් කලේද? නැද්ද යන්න විමසීම**

ඔවුන් ලියාපදිංචි කළේ Herceptin වලට බොහෝ සෙයින් සමාන Herticad නමැති ඖෂධය වන අතර එය සෑම තත්වයේම පිළිකා රෝගීන්ට සුදුසු නොවන බවත් එය සුදුසු වන්නේ පැතිරුනු පියයුරු පිළිකා රෝගීන්ට පමණක් බවත් පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිතුමිය ප්‍රකාශ කළාය.

එසේම 44 දෙනෙකු වැනි ඉතා සුළු ප්‍රමාණයක රෝගීන්ට මෙම ඖෂධය ලබා දී කරන ලද සායනික පරීක්ෂණයකින් පසුව එම ඖෂධය සෑම අවධියකම සිටින රෝගීන්ට ලබා දීම සුදුසු නොවන බවත්, ඒ තත්ත්වය අමාත්‍යාංශ ලේකම්ට දිගින් දිගටම දන්වා සිටි නමුත් පූර්ව අවස්ථාවේ පිළිකා රෝගීන්ටත් මෙම ඖෂධය ලබා දෙන ලෙස බල කරමින් රෝහල් අධ්‍යක්ෂ විසින් ලිපි එවන බවත්, වෛද්‍යවරුන්ගේ විශේෂඥ මතයට ලැබිය යුතු නිසි ගෞරවය නොලැබීම කණගාටුදායක තත්ත්වයක් බවත්, එසේම විශේෂඥ වෛද්‍යවරයෙකුට තිබිය යුතු ඖෂධ නිර්දේශ කිරීමේ අයිතිය තමන් වෙත තිබිය යුතු බවත් වැඩිදුරටත් පැවසුවාය.

## ඇමුණුම 03

SECRETARY
19 MAR 2018

2018.03.16

සභාපති,
ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින්
ලේකම්තුමා
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය
කොළඹ 10

Prof. Asita de Silva
MBBS, DPhil (Oxon), FRCP (Lond)
Chairman
National Medicines Regulatory Authority
Sri Lanka

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ MH/FCC/02/COPA/2017දරන ලිපිය මගින් දන්වා ඇති පරිදි, **පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ -රාජ්‍ය ඖෂධ නීති ගත සංස්ථාව"** යන මැයින් ඔබ අමතා පොදුව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් එවා ඇති අංක කෝප්/8/1/2017 හා 2017 අගෝස්තු මස 15 දින දරන ලිපියේ අමුණා ඇති 2017 ජූලි මස 07 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්ථාවේ සඳහන් කරුණු අතරින් ජාතික ඖෂධ නියාමන අධිකාරියට අදාල නිර්දේශ පිළිබඳව අප ආයතනයේ පැහැදිලි කිරීම් අදාල අංක සමග ඔබතුමාගේ දැනගැනීමට පහතින් ඉදිරිපත් කරමි.

01. ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් වගකීමකින් තොරව කරුණු ඉදිරිපත් කිරීම

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් බැහැරට යන ලිපිලේඛනවල සාමාන්‍යයෙන් යොදනු ලබන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සනයි.

මෙම වාර්ථාවේ සඳහන්වන ලිපිය ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් විගණන අංශය වෙත යොමුකරන ලද ලිපියකි. එම නිසා එම ලිපියේද යොදා ඇත්තේ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සනයි.

03. පිළිකා රෝගය සඳහා ගෙන්වූ Herticad ඖෂධය රුසියාවේ ලියාපදිංචි කළ ආයතනය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධවේදියා මෙම කාරක සභාවේදී සඳහන් කලේ Herticad ඖෂධය සඳහා COPP සහතිකය නිකුත්කර ඇත්තේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් බවත් රුසියාවේ එම සහතික නිකුත් කරනු ලබන්නේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් බවත්ය. එය වාර්තාවේ නිර්දේශවලින් හැඟීයන පරිදි ප්‍රස්තුත ඖෂධය (Herticad) සඳහා පමණක් විශේෂ වූ සිදුවීමක් නොවේ.

05. ඖෂධ අනුමත කිරීමේ තාක්ෂණික කමිටු සංයුතිය

මෙම කරුණ සම්බන්ධව විස්තර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර මයා මනාව පැහැදිලි කරන ලදි. ප්‍රථමයෙන් පැවති තාක්ෂණික ඇගයීම් කමිටුවට පිළිකා රෝග පිළිබද විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙක් සහභාගි වූ අතර එක් වෛද්‍යවරයෙක් Herticad ඖෂධය මිල දී ගැනීම පිළිබදව එකග නොවූ බවත් අනිත් වෛද්‍යවරුන් දෙදෙනාම එකග වූ බවත්, ඒ අනුව නැවත විශේෂඥ වෛද්‍ය නිළධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලදුව එහිදී එම විශේෂඥ වෛද්‍යවරයාම එකග නොවූ අතර අනිකුත් විශේෂඥ වෛද්‍යවරුන් සිව් දෙනාම එකග වූ බවත් ප්‍රකාශ කර ඇත. ඒ පිලිබදව මෙම වාර්තාවේ කිසිදු සදහනක් නොමැත.

10. <u>විගණකාධිපති වරයා විසින් පක්ෂග්‍රාහීව කටයුතු කළැයි ඖෂධ නියාමන අධිකාරියේ නියාමන ඖෂධවේදී ක්‍රිෂාන්ත ද සිල්වා මහතා විසින් චෝදනා කිරීම.</u>

විගණන නිලධාරීන් වෙත ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් ලබා දෙන ලද ඇතැම් තොරතුරු නොසලකා හරිමින් මෙම වාර්තාව සකස්කරකර ඇති බව හැගී ගිය බැවින් ඇති වූ සිත්වේදනාව නිසා විගණකාධිපතිවරයා පිළිබද නොව අදාල වාර්තාව සැකසූ නිළධාරීන් පිළිබදව ක්‍රිෂාන්ත ද සිල්වා මහතා මෙබදු ප්‍රකාශයක් කල බව අපගේ හැගීමයි.

රුසියාවේ COPP සහතිකය නිකුත්කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යංශය මගින් නොවන බව සදහන් කරමින් රුසියානු සෞඛ්‍ය අමාත්‍යංශය මගින් ලබා දී ඇති ලිපිය, COPP සහතිකය නිකුත් කිරීමට හැකි ආයතන පිළිබදව ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශය, ඇතැම් ඖෂධ සදහා ප්‍රමුඛතාව ලබාදෙන බව අපගේ වෙබ් අඩවියේ සදහන්ව තිබීම ආදිය එසේ වාර්ථාව සැකසූ නිළධාරීන්ගේ අවධානයට ලක් නොවූ තොරතුරු අතරින් කිහිපයක් පමණි.
අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබුනද ඉහත ප්‍රකාශය පිළිබදව ක්‍රිෂාන්ත ද සිල්වා මහතා විසින් කෝප් කමිටුවේදී විගණන නිළධාරීන්ගෙන් සමාව ගෙන ඇත.

මෙම ඖෂධය සම්බන්ධව අභියාචනාධිකරණයේ පැවති නඩුවට ජාතික ඖෂධ නියාමන අධිකාරිය පාර්ශවයෙන් කරුණු ඉදිරිපත් කිරීමේදී එම කාර්ය පහසු කර ගැනීමට අවශ්‍ය ලිපිලේඛන එකට ගොනුකර තිබූ අතර කෝප් කමිටුව වෙත තොරතුරු දැක්වීමේදී රැගෙන ආවේද එම ලිපිගොනුවයි. එම ලිපි ලේඛණ සියල්ල නඩුවට ඉදිරිපත් කල ඒවා නොවේ. කෙසේ වෙතත් එම ලේඛන සියල්ල නිර්ව්‍යාජ ලේඛන බව වගකීමෙන් ප්‍රකාශ කර සිටිමි.

12. <u>විධිමත් පරීක්ෂණයක් කිරීම</u>

ජාතික ඖෂධ නියාමන අධිකාරිය විගනකාධිපති දෙපාර්තමේන්තුවට සහය නොදැක් වූ බව සදහන් ප්‍රකාශය වගකීමෙන් හා නිහතමානීව ප්‍රතික්ශේප කරමි.

මේ පිලිබඳව කරුණු ලබා ගැනීමට විගණන නිලධාරීන් ජාතික ඖෂධ නියාමන අධිකාරියට පැමිණි මුල් දිනයේම ජෛව විද්‍යාත්මකව සමාන ඖෂධ සහ ප්‍රස්තුත ඖෂධය ලියාපදිංචියට අදාලව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති මහාචාර්ය අසිත ද සිල්වා මහතා ද එහි ප්‍රධාන විධායක නිලධාරී වන මාද ඖෂධවේදී ක්‍රිෂාන්ත ද සිල්වා මහතා ද දීර්ග ලෙස කරුණු පැහැදිලි කරදුන් අතර වහාම අදාල ලිපිගොනුව ලේඛණාගාරයෙන් ගෙන්වා දීමටද කටයුතු කරන ලදි.

ඉන් අනතුරුව මෙම ආයතනයේ ඖෂධවේදී ක්‍රිෂාන්ත ද සිල්වා මහතා අවස්ථා 02 කදී අදාල ලිපිගොනුවේ විගණන නිලධාරීන්ට නිරාකරණය කරගැනීමට තිබූ කරණු පිළිබඳව පැහැදිලි කර දෙන ලදි.

කෝප් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට විගණන නිලධාරීන් සැකසූ වාර්තාවේ එකග විය නොහැකි කරුණු පිළිබඳව දැනුම් දීමට සාධාරණ කාලයක් අවශ්‍ය බව සඳහන් කිරීම නිසා විගණන නිලධාරීන් මෙබදු අදහසක් දරන බව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ හැගීමයි.

තවද මෙම රැස්වීම් සටහනේ අප ආයතනයේ වර්තමාන සභාපති මහාචාර්ය අසිත ද සිල්වා මහතා හා ප්‍රස්තුත ඖෂධය ලියාපදිංචි කරන විට අධිකාරියේ සභාපති ලෙස කටයුතු කල මහාචාර්ය ලාල් ජයකොඩි මහතා විසින් ඉතා පැහැදිලිව ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණු ඇතුලත් වී නොමැතිබව කාරුණිකව දන්වා සිටමි.

1) ජෛව විද්‍යාත්මකව සමාන ඖෂධ නිසා, ජෛව විද්‍යාත්මක ඖෂධ වෙනුවෙන් වැය කිරීමට සිදුවන වියදම විශාල වශයෙන් අඩුවන නිසා ඕනෑම රටකට ඉන් සුවිශාල වාසියක් අත්වන බව සහ මේ නිසා ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල පමණක් නොව ඇමරිකා එක්සත් ජනපදයේ ආහාර හා ඖෂධ ආයතනය, යුරෝපීය ඖෂධ නියාමන ආයතනය වැනි සංවර්ධනය වූ රටවල ඖෂධ නියාමන ආයතන පවා මෙම ජෛව විද්‍යාත්මකව සමාන ඖෂධ පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමුකර ඇතිබව.

2) ජෛව විද්‍යාත්මක සමාන ඖෂධ ලියාපදිංචි කිරීම මගින් රෝගීන් වැඩි සංඛ්‍යාවකට ඉහල සාර්ථකත්වයක් සහිත එහෙත් ඉතා මිළ අධික ඖෂධ කාන්ඩයක ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව හිමිවන බව.

3) සාකච්ඡාවට බදුන්වී ඇති Trastuzumab ඖෂධය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිකර ඇත්තේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ යුරෝපා ඖෂධ නියාමන ආයතනයේ මාර්ගෝපදේශ පාදක කොටගෙන ජෛවවිද්‍යාත්මක සමානතාව ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුවබව සහ මේ සඳහා ඖෂධයේ රසායනික පරීක්ෂණ වාර්ථා දත්ත මෙන්ම ඖෂධයේ භෞතරසායනික ගුනාංග පිළිබඳ දත්තද භාවිතාකර ඇති බව සහ මෙම ඖෂධය ලියාපදිංචියට පෙර ජෛව විද්‍යාත්මකව සමානතාව තීරණය කිරීම සඳහා ඖෂධ වේදාත්මක ඇගයීම ඖෂධවේදීන් විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය තුල

අභ්‍යන්තරවද එහි සායනික වාර්ථාව ඇගයීම මහාචාර්ය අසිතද සිල්වා මහතා විසින් බාහිරවද සිදු කර ඇති බව.

4) පිළිකා වෛද්‍ය සංගමයේ සභාපතිනිය විසින් මෙම ඖෂධය පැතිරුණු පියයුරු පිළිකා රෝගීන්ට ලබා දිය හැකි නමුත් මූලික අවස්ථාවේ පියයුරු පිළිකා රෝගීන්ට ලබා දිය නොහැකි බව පැවසීම විද්‍යාත්මකව පිලිගත් Extrapolation (බහිර් නිවේශනය) නැමති මූලධර්මයට පටහැනි බව සහ මේ පිළිබඳව පිළිකා වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිනිය පවසන කරුණු විද්‍යාත්මක පදනමින් තොර බව.

5) ඉන්දියානු ඖෂධ නියාමන ආයතනය වන මධ්‍යම ඖෂධ ප්‍රමිති පාලන ආයතනය ජෛව විද්‍යාත්මකව සමාන Trastuzumab ඖෂධ සඳහා ලියාපදිංචිය ලබාදීමේදී එම ඖෂධ පැතිරුණු පියයුරු පිළිකා රෝගීන්ට මෙන්ම මූලික අවස්ථාවේ පියයුරු පිළිකා රෝගීන්ටද ආමාශයික පිළිකා රෝගීන්ටද ලබාදිය හැකිබවට අනුමැතිය ලබාදී ඇත්තේ මෙම බහිර්නිවේශනය (Extrapolation) නැමති මූල ධර්මය පදනම් කරගෙන බව සහ මෙම තීරණය ඉන්දියාවේ දිල්ලි මහාධිකරණය මගින්ද නිවැරදි බව තීන්දු කර ඇතිබව.

6) ජෛව විද්‍යාත්මකව සමාන ඖෂධ භාවිතා කලහැකි රෝගතත්ව පිළිබඳව තීරණ ගැනීමේදී ඇමරිකානු ආහාර හා ඖෂධ නියාමන ආයතනය, යුරෝපා ඖෂධ නියාමන ආයතනය වැනි නියාමන ආයතන පවා මෙම මූලධර්මය යොදාගෙන ඇතිබව .

7) ඒවන විට ඖෂධ නියාමන අධිකාරිය තවත් ජෛව විද්‍යාත්මකව සමාන Trastuzumab නිෂ්පාදනයකට ලියාපදිංචිය ලබාදී තිබූ අතර ඒ සඳහා ද ඉහත සඳහන් කල බහිර්නිවේශනය (Extrapolation) නැමති මූල ධර්මය පොදු බව.

8) Herticad නමින් හඳුන්වන ජෛව විද්‍යාත්මකව සමාන Trastuzumabඖෂධය සඳහා ලබාගත් තහනම් නියෝගය දීර්ගකර ගැනීමට Trastuzumab සඳහා ශ්‍රී ලංකාව තුල ඒකාධිකාරයක් පවත්වා ගෙන යමින් තිබූ සමාගම උත්සාහ කල බව සහ අභියාචනාධිකරණය විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද බව.

9) පිළිකා වෛද්‍ය සංගමයේ සභාපතිනිය සදහන් කල පරිදි ඒවනවිට ලෝකයේ Herticad ලබා දී ඇති රෝගීන් සංඛ්‍යාව 44 ක් බව පැවසීම වැරදි සහගත බව හා ඒ වනවිට රෝගීන් 1000කට වඩා එම ඖෂධය ලබා දී තිබූ බව.

10) මෙම ඖෂධය පාවිච්චි කරන ලද විශේෂඥ වෛද්‍යවරුන් ගෙන් විමසා බැලුවද කිසිදු අවස්ථාවක මෙම ඖෂධ ලබාදුන් රෝගීන් තුල කිසිදු අහිතකර බලපෑමක් ඇති වී ඇති බවට වාර්තා වී නොමැති බව හා මෙම ඖෂධය ඒ වන විට මහරගම පිළිකා රෝහල ඇතුළු දිවයින පුරා පිහිටි පිළිකා මර්ධන ඒකකවල මාස 16 ක පමණ කාලයක් රෝගීන් විශාල

සංඛ්‍යාවකට භාවිතා කර තිබුනද එම කිසිදු ආයතනයකින් ඖෂධයේ ආරක්ෂිත බව හෝ ප්‍රත්‍යක්ෂ බව පිළිබදව ජාතික ඖෂධ නියාමන අධිකාරියට පැමිණිලි ලැබී නොමැති බව.

11) මෙම ඖෂධය සම්බන්ධව අභියාචනාධිකරණයේ පැවති නඩුවට ජාතික ඖෂධ නියාමන අධිකාරිය පාර්ශවයෙන් කරුණු ඉදිරිපත් කිරීමේදී එම කාර්ය පහසු කර ගැනීමට අවශ්‍ය ලිපිලේඛන එකට ගොනුකර තිබූ අතර කෝප් කමිටුව වෙත තොරතුරු දැක්වීමේදී රැගෙන ආවේද එම ලිපිගොනුවබව සහ එම ලිපි ලේඛණ සියල්ල නඩුවට ඉදිරිපත් කල ඒවා නොවන බව.

මෙම කරුණු සියල්ල එම රැස්වීම් සටහනට ඇතුලත් නොවීමෙන් මෙම කරුණ සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය ක්‍රියාකල ආකාරය පිළිබදව වැරදි අවබෝධයක් ඇතිවීමට ඉඩ ඇති බව මාගේ හැගීමයි.

මෙහි සදහන් කර ඇති කරුණු පිළිබදව හෝ ජාතික ඖෂධ නියාමන අධිකාරියට අදාල නොවන බව හැගී යන නිසා පිළිතුරු ලබා දී නොමැති කරුණු පිළිබදව වැඩිදුර පැහැදිලිකිරීමක් අවශ්‍ය නම් ඒ පිළිබදව සහයෝගය දැක්වීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය නොපැකිලිව ඉදිරිපත් වන බව කාරුණිකව දන්වා සිටිමි.

ප්‍රධාන විධායක නිලධාරී
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

Dr. Kamal Jayasinghe
MBBS, DFM, MSc-Med.Admn, MBA,DIPPCA
Chief Executive Officer
National Medicines Regulatory Authority
120, Norris Canal Road, Colombo 10

පිටපත

ප්‍රධාන මූල්‍ය නිළධාරි 1,

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය

# <u>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය</u>

(කෘෂිකර්ම අමාත්‍යාංශය)

*(2018.12.28 දින සිට මෙම ආයතනය කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 ජූලි මස 25 වන දින**

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

## 01. <u>අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය</u>

ආයතනයේ පනතට අනුව කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා, පාලක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වුවත් රාජ්‍ය අමාත්‍යතුමාගේ ලේකම්වරයා එහි සභාපතිවරයා ලෙස කටයුතු කිරීම පිළිබඳ කාරක සභාව විසින් විමසන ලදී.

2016 සැප්තැම්බර් 26 දින අංක 1986/6 අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය සම්බන්ධ විෂයය රාජ්‍ය කෘෂිකර්ම අමාත්‍යවරයා යටතට පවරා ඇති බැවින් මෙම සභාපති ධුරය සඳහා රාජ්‍ය ලේකම්වරයා පත් කර ඇති බව අමාත්‍යාංශ ලේකම් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. ඉදිරියේදී ප්‍රශ්න ඇතිවීම වළක්වා ගැනිම සඳහා මේ පිළිබඳ නීතිමය තත්ත්වය නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසා බැලීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නීතිපති මගින් ලබා දී තිබූ උපදෙස් අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 5/32/COPE/HARTI හා 2018.03.27 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත.

## 02. <u>අභ්‍යන්තර විගණන කමිටුව ක්‍රියාත්මක නොවීම</u>

අභ්‍යන්තතර විගණන අංශයේ වැඩ කටයුතු සිදු නොවීම නිසා මාස 06කට ආසන්න කාලයක් තුළ කිසිදු විගණන විමසුමක් නිකුත් කර නොතිබීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.

2017 වසර ආරම්භයේදී අභ්‍යන්තර විගණකවරයා සම්බන්ධයෙන් ගැටලුවක් මතුවීම හේතුවෙන්, පරීක්ෂණයක් පවත්වන තුරු ඇයව සේවයෙන් නිදහස් කර ඇති බවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාව මේ වන විට ලැබී ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බවත් අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරි පැවසීය.

**<u>නිර්දේශ</u>**

i. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කොට අවශ්‍ය පියවර ගැනීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

අභ්‍යන්තර විගණක පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ වාර්තාව 2017.11.20 වන දින පැවැත්වීමට නියමිතව තිබූ පාලක මණ්ඩල රැස්වීමට යොමු කර මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අපේක්ෂා කරන බව කෘෂිකර්ම අමාත්‍යංශයේ ලේකම්ගේ අංක5/32/COPE/HARTI හා 2018.03.27 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා ඇත.

**03. <u>විදේශ ශිෂ්‍යත්වලාභීන් ගිවිසුම් කඩ කිරීම</u>**

විදේශ විශ්වවිද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ ගිවිසුම් කඩ කළ ශිෂ්‍යත්වලාභීන්ගෙන් අය විය යුතු මුදල්වල වටිනාකම රු.15,992,125/-ක් ව පැවතීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.

මේ වන විට ඉතිරිව ඇත්තේ ශිෂ්‍යත්වලාභීන් 10දෙනෙකු පමණක් බවත් ඉන් දෙදෙනෙකු ගෙවීම් සම්බන්ධයෙන් සමථයකට පත්ව ගෙවීම් කරගෙන යන අතර තවත් දෙදෙනෙකු පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීමෙන් අනතුරුව ආයතනයට පක්ෂපාතී ලෙස තීන්දුව ලැබී ඇති බවත් ඉතිරිව ඇති හයදෙනාගෙන් මුදල් අය කර ගැනීම සඳහා උපායශීලී ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බවත් අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරි පැවසීය.

<u>**නිර්දේශ**</u>

i. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කොට අවශ්‍ය පියවර ගැනීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

විදේශ ශිෂ්‍යත්වලාභින් 09 දෙනෙකුගෙන් රු.15,899,840/- ක මුදල් ශේෂයක් අය කර ගැනීමට තිබූ බවත් එම ශේෂය පියවා ගැනීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත බවත් කෘෂිකර්ම අමාත්‍යංශයේ ලේකම්ගේ අංක5/32/COPE/HARTI හා 2018.03.27 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා ඇත.

| ශිෂ්‍යත්ව ලාභීන් සංඛ්‍යාව | මුදල් අය කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය |
|---|---|
| ශිෂ්‍යත්ව ලාභීන් - 01 | හිඟ ශේෂය සම්බන්ධයෙන් සමථයකට පත්ව ගෙවා ගෙන යනු ලබයි. |
| ශිෂ්‍යත්ව ලාභීන් - 02 | නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව ආයතනයට පක්ෂපාතී ලෙස තීන්දු ලැබී ඇති බව |
| ශිෂ්‍යත්ව ලාභීන් - 06 | උපායශිලී ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බලාපොරොත්ත වන බව අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ප්‍රකාශ කිරීම |

## 04. <u>අධ්‍යක්ෂක නිල නිවාසය බාහිර පාර්ශවයක් පරිහරණය කිරීම</u>

අධ්‍යක්ෂක නිල නිවාසය, නිල නිවාස කුලිය අය කර ගැනීමෙන් තොරව හා අනුමැතියක් රහිතව බාහිර පාර්ශවයකට පදිංචියට ලබා දී තිබීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.

2015 වසරේ අධ්‍යක්ෂවරයා නිල නිවාසයේ පදිංචිව නොසිටීම නිසා අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු හට තාවකාලිකව එය ලබා දී ඇති අතර මේ වන විට නිල නිවාසය නිදහස් කර දෙන ලෙස ඔහුට දැනුම් දී ඇති බව අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරි ප්‍රකාශ කරන ලදී.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

උක්ත නිල නිවස නිදහස් කර දෙන මෙන් දැනුම් දීමට කටයුතු කර ඇති බව කාරක සභාවට වාර්තා කර ඇත.

## 05. <u>පරිගණක මිලදී ගැනීම</u>

තාක්ෂණික කමිටුව ප්‍රතික්ෂේප කළ ආයතනයකින් 2015 වර්ෂයේදී රු. මිලියන 1.7ක් වැය කර පරිගණක 17ක් මිලදී ගැනීම සහ එම පරිගණකවල දෝෂයන් හා සේවා කොන්ත්‍රාත්වලට අනුව නියමිත කාලය තුළ සේවා කටයුතු කර නොතිබීම පිළිබඳව කාරක සභාව විසින් විමසීමක් කරන ලදී.

ආයතනයේ ලේඛකාධිකාරීවරයාගේ නිර්දේශය මත මෙම මිලදී ගැනීම් සිදු කළ බව අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරි පැවසීය.

ආයතනය තුළ තාක්ෂණ කමිටුවක් තිබියදීත් බාහිර පාර්ශව විසින් මෙම මිලදී ගැනීම් පිළිබඳ තීරණ ගැනීම ගැන කාරක සභාව සිය නොසතුට පල කළාය.

ඉදිරියේදී මෙවන් තත්ත්වයක් ඇති නොවීමට වග බලා ගන්නා බව අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. මේ පිළිබඳ වාර්තාවක් සති 02ක් ඇතුළත කාරක සභාව වෙත යොමු කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පරිගනක මිලදී ගන්නා ලද බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නීති රීතිවලට අනුකූලව සිය ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු කිරීමට පියවර ගෙන ඇති බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 5/32/COPE/HARTI හා 2018.03.27 දිනැති ලිපිය මගින් කාරක සභාව තොරතුරු ඉදිරිපත් කර ඇත. එනම් සති 02 ක් ඇතුළත ඉල්ලා ඇති වාර්තාව නොව ඒ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට ද මාස 9 ක් ඉක්ම වූ කාලයක් ගොස් ඇත.

නමුත් එම කරුණ තහවුරු කරන්නනා වූ උපකාරක ලේඛන කිසිවක් හෝ කාරක සභාව මගින් නිර්දේශිත පරිදි වාර්තාවක් හෝ 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නෙමැත.

## 06. <u>කාබනික පොහොර භාවිතය</u>

කාබනික පොහොර භාවිතය පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය මගින් සිදු කරනු ලබන්නේ කෘෂි පර්යේෂණ (Agrarian Research) පමණක් බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් තාක්ෂණික පර්යේෂණ (Technical Research) සිදු කරනු ලබන බවත්, මේ වන විට රසායනික පොහොර අඩුවෙන් කාබනික පොහොර සමඟ යෙදීම සුදුසු බවට ජනතාව දැනුවත් කර ඇති බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කරන ලදී..

ක්‍රම ක්‍රමයෙන් ජනතාව රසායනික පොහොර භාවිතයෙන් දුරස් කොට කාබනික පොහොර වෙත නැඹුරු කිරීම සඳහා වන විද්‍යාත්මක පර්යේෂණ මේ වන විට සිදු කරමින් පවතින බවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

## ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම

(විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය)
*(2018.12.28 දිනැති, අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම ආයතනය කිසිදු අමාත්‍යාංශ විෂය පථයකට අයත් නොවේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 ජූලි මස 26 දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම**

2016-2017 කාලය සඳහා ව්‍යාපාරික සැලැස්මක් නොමැති වීමට හේතුව විමසන ලදී.

2017-2022 වසර සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල වෙමින් පවතින බවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා උක්ත සැලසුම් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. ආයතනයේ දැක්ම ගැන අවබෝධයක් ලබා ගැනීම සඳහා ආයතනයේ සංයුක්ත සැලැස්ම සහ ක්‍රමෝපාය සැලැස්ම තුළ ඇතුළත් ඉලක්ක සපුරා ගත් ආකාරය දැක්වෙන වාර්තාවක් කාරක සභාව වෙත යොමු කිරීම.

ii. ප්‍රසම්පාදන සැලැස්ම විගණකාධිපති වෙත යැවීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ආයතනය විසින් සිය ඉලක්ක සපුරා ගත් ආකාරය ඇතුළත් ආයතනයේ කාර්ය සාධන වාර්තාව විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MTDI/I.AUDIT/03 හා 2017.11.14 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**02. 2015 සිට 2017 දක්වා කාලය තුළ ආයතනයේ සංවිධානය වී ඇති ආකාරය වරින් වර බොහෝ වාර ගණනක් වෙනස් කිරීම (Organization Re-alignment )**

කාරක සභාව උක්ත වෙනස් කිරීම්වලට හේතු විමසන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත්තේද යන්න විමසන ලදී.

මෙලෙස වෙනස්කම් සිදු කිරීමට හේතු වූයේ ආයතනික කටයුතු වඩා ඵලදායී අන්දමින් සිදු කිරීමට අවශ්‍ය වූ නිසා බව ඊට පිළිතුරු දුන් ප්‍රධාන විධායක නිලධාරි ප්‍රකාශ කරන ලදී.

ප්‍රධාන වෙනස් කිරීම් සඳහා පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති බවත්, මෙවැනි වෙනස්කම්වලට අනුමැතිය ලබා දීම සඳහා පත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීමේදී (Nomination Committee) එම සෑම වෙනස් කිරීමකටම හේතුව කුමක්ද යන්න ප්‍රධාන විධායක නිලධාරියාගෙන් විමසීමටත් පියවර ගන්නා බව බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. ආයතනය සංවිධානය වී ඇති ආකාරය වෙනස් කළ වාර ගණන, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත් අවස්ථා, ඒ සඳහා අනුමැතිය නොලැබුණු අවස්ථා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවල පිටපත් ද සමගින් සති 02 ක් ඇතුළත කාරක සභාව වෙත යොමු කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නව සමූහ ප්‍රධාන විධායක නිලධාරියා පත්වීමෙන් අනතුරුව ආයතනයේ වර්ධනය උදෙසා සංවිධාන ධුරාවලිය නැවත පෙළ ගැස්වීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇති බවත්, මෙම වැඩ සටහන එකවර ක්‍රියාවට නැංවීමේදී ආයතනයේ ව්‍යාපාර කටයුතුවලට බාධා විය හැකි බැවින් 40/2015 දරන චක්‍රලේඛය **( ඇමුණුම 04)** මගින් පැහැදිලිව කාර්ය මණ්ඩලය දැනුවත් කර උක්ත වැඩ සටහන පියවරෙන් පියවර සිදු කරනු ලබන බවත් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MTDI/I.AUDIT/03 හා 2017.11.14 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 03. <u>සේවක අතිරික්තයක් තිබියදී කොන්ත්‍රාත් පදනම මත පිටතින් සේවාවන් ලබා ගැනීම ( Outsourcing)</u>

උක්ත කරුණ පිළිබඳව කාරක සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර වැඩ වර්ජන අවස්ථාවල පාරිභෝගික සේවාවන් සැපයීම අඩාලවීම වැළැක්වීමට පියවරක් වශයෙන් පිටතින් සේවාවන් ලබා ගැනීම සිදු කරන බව පැවසුවද එය පිළිගත නොහැකි බව කාරක සභාවේ මතය විය.

**<u>නිර්දේශ</u>**

i. ආයතනයට ද ප්‍රයෝජනවත් වන අයුරින් 2016 සහ 2017 වර්ෂයන්හිදී මේ දක්වා පිටතින් ලබාගත් ප්‍රධාන සේවාවන් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය යොදා ගෙන කළ හැකිව තිබුණේද යන්න දැන ගැනීම සඳහා කාර්ය සාධන විගණනයක් (performance audit) සිදු කොට මාස 02 ක් ඇතුළත වාර්තාවක් ලබා දෙන ලෙස අමාත්‍යාංශයේ ලේකම් සහ සමාගමේ සභාපති වෙත දන්වන ලදී.

   ඒ සඳහා විගණකාධිපතිගේ සහාය ලබා දෙන ලෙස විගණකාධිපති හට උපදෙස් දෙන ලදී.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MTDI/I.AUDIT/03 හා 2017.11.14 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 04. <u>යෝජිත සේවකයින් 450 ක් පමණ ස්ව කැමැත්තෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය</u>

**i. ආයතනයට අවශ්‍ය වන සේවකයින් ඉවත් වි යාම වැළැක්වීම.**

මෙම යෝජනා ක්‍රමය සම්බන්ධව සහ එමගින් ආයතනයට අවශ්‍ය වන සේවකයින් ඉවත් වී යාම වැලැක්වීමට ගන්නා පියවර පිළිබඳව කාරක සභාව විමසන ලදී.

ආයතනය තුළ 1500 ක් පමණ අතිරික්ත සේවකයින් පිරිසක් සිටින අතර ඊට විසඳුමක් ලෙස යෝජිත මෙම යෝජනා ක්‍රමය සඳහා රු. බිලි. 01 ක් පමණ වැය වෙන බවත් එක් එක් සේවකයා සම්බන්ධව විශේෂ ලෙස සොයා බැලීමකින් පසුව පමණක් අනුමැතිය ලබා දෙන බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

ii. **වැටුප් සහ ප්‍රසාද දීමනා ලෙස ඉහල වියදමක් දැරීම.**

සමාගම උපයන ආදායමින් 45% පමණ සේවකයින් වෙනුවෙන් වැය කරන බවත් එය ආයතනයට දැරිය නොහැකි තත්ත්වයක් බවත් සභාපති ප්‍රකාශ කරන ලදී. ආයතනයේ ණය බර සහ පාඩු ලැබීමේ තත්ත්වය අනුව මේ පිළිබඳව විශේෂයෙන් සලකා බැලීම.

iii. **ඉංජිනේරු කවුන්සිල් පනතට අනුව තිබිය යුතු සුදුසුකම් වලට සරිලන පරිදි ඉංජිනේරුවන් බඳවා ගැනීම.**

මේ වන විට එම පනතට අනුව තිබිය යුතු සුදුසුකම් වලට සරිලන පරිදි පමණක් බඳවා ගැනීම් කිරීමට කටයුතු යොදා ඇති බව සභාපති ප්‍රකාශ කරන ලදී.

iv. **ෆයිබර් ඔප්ටික් ( Fiber optic) ලයින් භාවිතය වැඩි කිරීම සඳහා විශාල වියදමක් දැරීම.**

දැනට පවතින 100,000ක් පමණ වන පෝට් සෙන්ටර් ප්‍රමාණයෙන් 20,000 ක් පමණක් භාවිතයට ගෙන ඇති අතර 80,000ක් පමණ ඉතිරියක් දක්නට ලැබෙන තත්ත්වය මත තවත් 600,000කින් මෙම ප්‍රමාණය වැඩි කිරීමට හේතු කාරක සභාව විමසන ලදී.

ඉදිරියේදී ඇතිවන අවශ්‍යතාවන් පිළිබඳව සලකා බලා මෙම දියුණු ෆයිබර් ඔප්ටික් ලයින් භාවිතය වැඩි කිරීමට කටයුතු යොදන ලද බව සභාපති ප්‍රකාශ කරන ලදී.

v. **සමාගම සතු ඉඩම්වල අයිතිය මෙතෙක් තහවුරු වී නොමැති බව.**

සමාගම සතුව ඉඩම් 464 ක් ඇති නමුත් ඒවායේ අයිතිය තහවුරු කිරීමට හැකියාවක් නොමැති වීමට හේතුව මෙම ආයතනය සමාගමක් බවට පත් වූ අවස්ථාවේ මේ සම්බන්ධව ගැසට් කිරීමක් සිදු නොකළ නිසා බවත් ඉදිරියේදී ප්‍රදාන පත්‍රයක් මගින් එම අයිතිය සමාගමට ලබා දීම සඳහා අතිගරු ජනාධිපතිතුමා එකඟ වූ බවත් ඒ සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කරමින් පවතින බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

vi. **සමාගම විගණනය කිරීමේ නීතිමය බලය විගණකාධිපති සතු බව.**

භාණ්ඩාගාරයට 49.50 % ක් අයිතිය ඇති අතර ලංකා බැංකුවේ සී බැන්ක් යුනිට් ට්‍රස්ට් සමාගමට 01 % ක හිමිකමක් ඇති බැවින් 50 % කට වැඩි හිමිකාරත්වයක් දැනටමත් රජය සතුව පවතින බව පෙන්වා දුන් කාරක සභාව, එබැවින් විගණකාධිපතිට මෙම සමාගම විගණනය සඳහා බලය ඇති බව දැනුම් දෙන ලදී.

**ඇමුණුම 04**

GCEO's Circular No. 40/2015

GCEO's Office,
Sri Lanka Telecom PLC,
Colombo 01.

23rd September 2015.

To: All Staff

**Organizational Re-alignment of Sri Lanka Telecom PLC**

Sri Lanka Telecom PLC is functioning in an increasingly competitive environment, where the future growth of the company relies on regaining market leadership and capitalizing on new opportunities created by advancements in ICT. An increased focus on delivering a great customer experience and further improving the efficiency of operations are essential for increasing company revenue and managing operational costs.

In order to accommodate the above, the organizational structure will be re-aligned to function as centres of excellence in Marketing, Planning, Sales and Operations.

The new group-level organizational structure is given in the Annex.

Further circulars will follow outlining the new organizational structures of each Group re-aligned under this initiative.

SLT looks forward to increased effectiveness in implementing its strategies and improved focus becoming the undisputed leader in the market, supported by this new organizational structure.

I invite the SLT team to use this as a new beginning to explore new opportunities and take the organization to greater heights.

Dileepa Wijesundera
Group Chief Executive Officer

Page 1 of 2

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

(ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය)

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 08 දින**
**2017 සැප්තැම්බර් මස 08 දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

## 01. අනුමත කාර්ය මණ්ඩලය

2017 මාර්තු මාසයේදී 24,886ක කාර්ය මණ්ඩලයක් අනුමත කරගෙන ඇතත්, 2017 වර්ෂයේ ජුනි 30 වන දින වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 30,524ක් වන බවත්, ඒ අනුව ස්ථිර කාර්ය මණ්ඩලය අනුමත ප්‍රමාණයට වඩා 5,638ක් වැඩි බවත්, නිරීක්ෂණය වූ අතර, එසේ වීමට හේතු කාරක සභාව විමසන ලදී.

වර්ෂ 2015 වන විට 36,000කට ආසන්න කාර්ය මණ්ඩලයක් සිටි බවත්, ඉන් අනතුරුව ස්වේච්ඡා විශ්‍රාම ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දුන් බවත්, ඒ අනුව 3,227ක් වන්දි ලබා ගෙන සේවයෙන් ඉවත් වූ බවත්, තවත් 526ක් වන්දි ලබා ගෙන විශ්‍රාම යාමට නියමිත බවත්, 2015න් පසුව බඳවා ගැනීම් කිසිවක් කර නොමැති බවත්, ඉතිරි අය නියමිත විශ්‍රාම වයස සම්පූර්ණ වීමත් සමඟ විශ්‍රාම යාමට නියමිත බවත්, ඒ අනුව එහි සැලැස්මක් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති බවත්, වර්ෂ 2021 වන විට කාර්ය මණ්ඩලය නියමිත සංඛ්‍යාවට පැමිණෙන බව අපේක්ෂා කරන බවත්, සභාපති පැවසීය.

**නිර්දේශ**

i. මහා භාණ්ඩාගාරයට ලබා දුන් සැලැස්මේ පිටපතක් කාරක සභාවට එවීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/07/06/06/08 හා 2017.10.11 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 02. රියදුරු කොන්දොස්තර අතිරික්තය

සමහර ඩිපෝවල රියදුරු හා කොන්දොස්තර අතිරික්තයක් පවතින අතර, සමහර ඩිපෝවල ඌනතාවයක් පවතින බවත්, මෙය නිවැරදි කිරීමට පියවර ගෙන නොමැති බවත්, 2015 මැයි 01 වන දිනට රියැදුරන් 235ක් හා කොන්දොස්තරවරුන් 528ක් අදාල නොවන කාර්යයන්ගේ නිරත වන බවත් කාරක සභාවේ අවධානයට ලක් විය.

මෙවැනි තත්ත්වයක් තිබුණු බවත්, එම තත්ත්වය තවමත් නිවැරදි වී නොමැති අතර, මෙම තත්ත්වය නිවැරදි කිරීමට උත්සාහ කළ සෑම අවස්ථාවක ම ප්‍රායෝගික ගැටළු මතු වූ බවත්, වර්තමානයේ ඒ සඳහා එක් එක් සේවකයා ලබා ගත් පඩි රහිත නිවාඩු ප්‍රමාණය අනුව ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදයක් සකස් කර මුලින්ම වයඹ පළාතේ අත් හදා බැලීමක් කළ බවත්, ඊට අමතරව වෘත්තීය සමිති සියල්ලම නියෝජනය වන පරිදි මාරුවීම් මණ්ඩලයක් පිහිටුවා ඇති බවත්, සභාපති පැවසූ අතර අනුචිත කර්තව්‍යයන්ගේ නියුතු රියැදුරු 235ක් ස්වේච්ඡා විශ්‍රාම යාම නිසා එය 88 දක්වා අඩු වී ඇති බවත්,

කොන්දොස්තර ප්‍රමාණය 498 දක්වා අඩු වී ඇති බවත්, මේ වසර අවසන් වන විට මේ තත්ත්වය නිවැරදි වන බවත්, සභාපති ප්‍රකාශ කරන ලදී.

සියළුම වෘත්තීය සමිති එකඟතාවයෙන් කමිටුවක් පත් කර ඇති අතර, වසර අවසානයේ මේ සම්බන්ධයෙන් අවසන් විසඳුමකට ඒමට හැකි වනු ඇති බවත් සභාපති තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. ඒ පිළිබඳව කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/07/06/06/08 හා 2017.10.11 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 03. ප්‍රසම්පාදන ක්‍රියාවලිය

මිලදී ගැනීමේ ක්‍රියාවලිය සුදුසු සැලසුමකට අනුව සිදු කර නොමැති බවත්, මේ සම්බන්ධයෙන් කාරක සභාවට එවා ඇති වාර්තාව පිළිගත නොහැකි බවත්, ප්‍රධාන කාර්යාලය භාණ්ඩ ඇනවුම් කළද සැපයුම්කරුවන් විසින් එම භාණ්ඩ ඩිපෝවලට සපයන බවත්, ඇනවුම් කළ ස්ථානය සහ භාණ්ඩ සැපයූ ස්ථානය අතර සම්බන්ධතාවයක් නොමැතිවීම නිසා වෙනස්කම මිලියන 2,000ක් පමණ වන බවත්, ඊට අමතරව භාණ්ඩ සපයා තිබේද යන්න පිළිබඳව කිසිදු සටහනක් නොමැති බව නිරීක්ෂණය වී ඇති බවත්, මෙම තත්ත්වය හඳුනාගෙන තිබේද යන්නත් කාරක සභාව විසින් විමසන ලදී.

පසුගිය වසර 3 තුළ කිසිම සැපයුම්කරුවෙකුට අත්තිකාරම් ගෙවීමක් සිදු කර නොමැති බවත්, සෑම ගෙවීමක්ම කර ඇත්තේ ඉන්වොයිස් ප්‍රධාන කාර්යාලයට ලබා ගැනීමෙන් පසුව බවත්, පසුගිය වකවානුවේ සිදුවූ මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වෙන බවත්, එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්මක් සෑම වසරකම අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන බවත්, සභාපති ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. නව තාක්ෂණය යොදාගෙන පරිගණක පද්ධතියක් භාවිතා කොට මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කිරීම.

ii. පසුගිය කාලයේ සිදුවූ මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් වාර්තාවක් එවීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/07/06/06/08 හා 2017.10.11 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 04. අමතර කොටස් මිලදී ගැනීම

පහත සඳහන් පුද්ගලික සමාගම් 2 න් අමතර කොටස් මිලදී ගැනීමේදී ගමනාගමන මණ්ඩලයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද යන්න කාරක සභාව විමසන ලදී.

i. STEEL Impex Institute

ii. NYMBUS Company Ltd.

මේ සම්බන්ධයෙන් විවිධ ආයතන මට්ටමින් විමර්ශන කටයුතු සිදු වෙමින් පවතින බවත්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ විමර්ශන ගොනුව නීතිපතිට භාරදී ඇති බවත්, ජනාධිපති විමර්ශන ඒකකය සහ අල්ලස් කොමිසමද පරීක්ෂණ පවත්වාගෙන යන බවත් සභාපති පැවසීය.

**<u>නිර්දේශ</u>**

i. මෙම ගනුදෙනුව ආරම්භයේ සිටම විස්තර ඇතුළත් පූර්ණ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/07/06/06/08 හා 2017.10.11 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 05. <u>බස් රථ ආනයනය</u>

බස් රථ 10ක් ආනයනය කරන විට එක් බස් රථයක් නොමිලේ ලැබෙන ප්‍රතිපත්තියක් තිබුණේද යන්නත් එසේ ලැබුනු බස් රථ 18ක් පසුගිය කාලයේ කළුතර දිස්ත්‍රික්කයේ බෙදා දී ඇති බවත්, එය සිදුවී ඇත්තේ කෙසේද යන්නත් කාරක සභාව විමසන ලදී.

මෙම බස් රථ ගමනාගමන මණ්ඩලය නමින් ලැබී නොමැති බවත්, පසුගිය කාලයේ සිදුවූ මේ සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වෙන බවත්, සභාපති පැවසීය.

**<u>නිර්දේශ</u>**

i. බස් රථ ගෙන්වනු ලැබූ කාල සීමාවට අදාලව එම බස් රථ ගෙන්වූ සමාගමෙන් ගමනාගමන මණ්ඩලයට මෙවැනි පරිත්‍යාගයක් කර ඇති බවට ලබා දී ඇති ලේඛනයක් තිබේ නම් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කළුතර දිස්ත්‍රික්කයේ බෙදා හරින ලද බස් රථ, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ආනයනය කරන ලද බස් රථ නොවන බව සඳහන් කරමින්, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/07/06/06/08 හා 2017.10.11 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 06. <u>බස් රථ අලුත්වැඩියාව</u>

බස් රථ 143ක් අලුත්වැඩියාව සඳහා Wesco සමාගමට ලබා දී ඇති බව නිරීක්ෂණය වී ඇති බැවින් එම බස්රථවලට කුමක් සිදුවීද යන්න කාරක සභාව විමසන ලදී.

මෙම බස් රථ නැවත නොලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් Wesco ආයතනයට එරෙහිව නඩුවක් පවරා ඇති බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ</u>

i. කාල වකවානුද ඇතුළුව මේ සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තාවක් එවන ලෙස නියෝග කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/07/06/06/08 හා 2017.10.11 දිනැති ලිපිය මගින් උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**07.** <u>නැවත කැඳවීම</u>

ගමනාගමන මණ්ඩලයේ 2012-2014 කාලයට අදාලව සිටි අධ්‍යක්ෂ මණ්ඩලය, ගමනාගමන මණ්ඩලයේ සභාපති, ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන නීති නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන විධායක නිලධාරී, සහ වෙනත් අවශ්‍ය නිලධාරීන් වේ නම් ඔවුන් ද ඇතුළත්ව 2017 සැප්තැම්බර් මස 08 වන දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නැවත කැඳවන ලෙස නියෝග කරන ලදී.

එසේම ඔවුන් පැමිණීමට නොහැකි බව දැන්වුවහොත් එය ලිඛිතව ලබා ගත යුතු බවත්, කාරක සභාව අවධාරණය කළාය.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාවේ නිර්දේශ පරිදි 2017 සැප්තැම්බර් මස 08 දින ගමනාගමන මණ්ඩලය කාරක සභාව ඉදිරියට කැඳවන ලදී.

***ආයතනය 2017.08.08 වැනි දින කැඳවීමෙන් අනතුරුව 2017.09.08 වන දින ප.ව. 2.30ට නැවත වරක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී. එහිදී පහත කරුණු සාකච්ඡාවට බඳුන් විය.***

**01.** <u>අමතර කොටස් මිලදී ගැනීම</u>

2011 – 2015 අතර කාලය තුළ රු. මිලියන 1500ක පමණ අමතර කොටස් Steel Impex සමාගමෙන් මාස 2 ක අවශ්‍යතාවයට මිලදී ගෙන ඇති බවත්, මෙම ගනුදෙනුවට අදාළව මෙම ආයතනය තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කුමක්ද යන්නත් හා මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනා ගත්තේ කෙසේද යන්නත් කාරක සභාව විමසන ලදී.

තවද Steel Impex ආයතනය අමතර කොටස් සැපයීමේදී සිදුවී තිබූ අඩුපාඩු පෙන්නුම් කරමින් එම ටෙන්ඩරයෙන් කොටසක් Nymbas Automotives සමාගමට ලබා දීම සිදු වූයේ කෙසේද යන්න කාරක සභාව වැඩිදුරටත් විමසන ලදී.

2010 වර්ෂයේ ආයතනයේ දෛනික ආදායම රු. මිලියන 33 – 40 දක්වා අගයක තිබුණු බවත්, 2012 වර්ෂයේදී තමා ධුරයෙන් ඉවත් වන විට දෛනික ආදායම රු. මිලියන 60 දක්වා වැඩි වී තිබුණු බවත්, මෙම කාලය වන විට ආයතනය ඉතාම දූෂිත තත්ත්වයක තිබුණු බවත්, අමතර කොටස් මිලදී ගැනීමේදී සැපයුම් කරුවන් දෙදෙනෙකුගෙන් හෝ

තිදෙනෙකුගෙන් පමණක් ලබා ගත් බවත්, මේ තත්ත්වය ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළ විට එතුමාගෙන් ලැබුණු උපදෙස් අනුව ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය මඟින් අමතර කොටස් මිලදී ගෙන අවශ්‍ය තැන්වලට බෙදා හැරීමට කටයුතු කළ බවත් ඒ සඳහා රේගු බදු සහනය ලැබුනු බවත්, මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවා තිබූ බවත්, පසුව ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයට ඒ බව ලිපියකින් දන්වා තිබුණු බවත්, එම ලිපි දෙකම සභාගත කළ හැකි බවත්, හිටපු සභාපති එම්.ඩී.බන්දුසේන මහතා පැවසූ අතර, මෙම කාරණය කැබිනට් මණ්ඩලයට යොමු කර තීරණයක් ලබා ගන්නා බව අමාත්‍යතුමා දැන්වූ බවත්, පසුව ඉන්දියාව ඇතුළු රටවල් කීපයකට මේ බව දැන්වූ අතර, ඒ සම්බන්ධයෙන් 2011.02.14 දින පුවත් පත් දැන්වීමක් පළ කල බවත්, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් කැඳවා මාස දෙකක අවශ්‍යතාවය හඳුනාගත් බවත් ඊට අමතරව ප්‍රසම්පාදන කමිටුවක් පත් කළ බවත් මේ ගැන අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කලාද යන්න ගැන මතකයක් නොමැති බවත් හිටපු සභාපතිවරයා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියෙන් දැක්වෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවටත් ශ්‍රී ලංගමයටත් අමතර කොටස් මිලදී ගැනීමේදී රේගු බදු සහනය ලබා දෙන ලෙස රේගු දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇති බවත්, ආයතනයට මිලදී ගැනීමේ සීමාව රු. මිලියන 50ක් වන බවත්, ඊට වැඩි වන අවස්ථාවල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බවත්, එය මග හැරීම සඳහා මාස 02 ක අවශ්‍යතාවය ප්‍රයෝජනයට ගෙන ඇති බවත්, ආයතන මට්ටමේ ටෙන්ඩර් මණ්ඩලයක් මඟින් එම තීරණය ගත්තද එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත් විය යුතු බවත්, කාරක සභාව අවධාරණය කළ අතර, ඒ තුලින් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වන බව ප්‍රකාශ කරන ලදී.

i. අවශ්‍යතා හඳුනා ගත් වාර්තාවක් නොමැති වීම.

ii. මාස දෙකක අවශ්‍යතාවය තීරණය කළ ක්‍රමවේදය පැහැදිලි නොවීම.

iii. අධ්‍යක්ෂ මණ්ඩලයට මේ පිළිබඳව වාර්තා කර නොමැති බව පැහැදිලි වීම.

iv. සැපයුම්කරු වන Steel Impex සමාගම තෝරාගත් ක්‍රමය පැහැදිලි නොවීම.

v. භාණ්ඩ කොටසක් සැපයීම සඳහා Nymbas Automotives ආයතනය තෝරා ගැනීමේදී ගිවිසුම අනුව Steel Impex ආයතනය සම්බන්ධයෙන් ගත් පියවර පැහැදිලි නොවීම.

vi. Steel Impex සහ Nymbas Automotives ආයතන සමඟ ඇතිකර ගත් ගිවිසුම පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි වන අතර, ගිවිසුම් ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් වී නොමැති අතර එවැනි ක්‍රමවේදයක් එවකට අනුගමනය නොකිරීම.

vii. අමතර කොටස් සඳහා ගෙවීමේ ප්‍රමාද පොළිය ඇ.ඩො.මිලියන 3.9ක් වී ඇති අතර, 2017.07.21 දින මහාභාණ්ඩාගාරය විසින් මේ සඳහා රු.මිලියන 122ක් ශ්‍රී ලංගමයට ලබා දීමෙන් අනතුරුව Steel Impex ආයතනයට ගෙවීම.

viii. ඇනවුම් කළ පරිදි සියළුම භාණ්ඩ ලැබුණු බවටත්, ඒවා සියල්ලම ඩිපෝවල ප්‍රයෝජනය සඳහා ලබා දුන් බවටත්, බාහිර පාර්ශ්වයන්ට එම භාණ්ඩ නොලැබුණු

බවටත්, සාක්ෂි නොමැති අතර, අනුගමනය කරන අභ්‍යන්තර ක්‍රමවේදය ද පැහැදිලි නොවීම.

**නිර්දේශ**

i. අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර තිබේද යන්න ගැන පරීක්ෂා කර බලා වාර්තා කිරීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

Steel Impex සහ Nymbas Automotives යන සමාගම් 2ට ගෙවීම් කිරීමේදී විනිමය අනුපාත සලකා බලන ආකාරය පිළිබඳ ක්‍රමවේදය ඇතුළත් කරමින් ඉදිරිපත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 05)**

නමුත් Steel Impex සහ Nymbas Automotives යන සමාගම් වලින් භාණ්ඩ මිලදී ගැනීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇති බවට කිසිදු සාක්ෂියක් මේ දක්වා සොයා නොහැකි වූ බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිගේ අංක ශ්‍රීලංගම/ස.කා/මු.කො./කෝප්/2017-09 හා 2017.11.24 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 02. අගයන් ඩොලර්වලින් පවත්වාගෙන යාම

භාණ්ඩ ඇනවුම් කිරීමේදී සැපයුම්කරුවන් සමග අත්සන් කර ඇති ගිවිසුම්වල අගයන් ඩොලර්වලින් පවත්වාගෙන යාමට තීරණය කළේ ඇයිද යන්න කාරක සභාව විමසන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් ගණකාධිකාරීවරුන් සමඟ සාකච්ඡා කරන අවස්ථාවේදී උපදෙස් ලැබුණු ආකාරයට මිල ගණන් ඩොලර් අගයන්වලින් පවත්වාගෙන යාමට තීරණය කළ බව හිටපු සභාපති එම්.ඩී.බන්දුසේන මහතා ප්‍රකාශ කරන ලදී.

මිල ගණන් ඩොලර් අගයන් මත පවත්වාගෙන යාම නිසා අගය වෙනස් වීම මත විශාල මුදලක් අතිරේකව දැරීමට සිදු වන බව කාරක සභාවේ මතය විය.

**නිර්දේශ**

කාරක සභාව විසින් පහත සඳහන් නිර්දේශ ලබා දෙන ලදී.

i. අමතර කොටස් සැපයීමට ඇති අධිකාරී බලය කුමක්ද යන්න දක්වමින් මාසයක් තුළ වාර්තාවක් ඉදිරිපත් කිරීම.

ii. 2011.04.22 දින වන විට Steel Impex සමාගම ඉන්දියාවේ පැවති මට්ටම, එය දැනටත් තිබේද, යන්න දක්වමින් මාසයක් තුළ වාර්තාවක් ඉදිරිපත් කිරීම.

iii. එම වාර්තාව සකස් කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් මෙම ආයතනය නිර්දේශ කිරීමට පාදක කරගත් දත්ත මොනවාද?

iv. සමාගමේ දේශීය නියෝජිත කවුද යන්න වාර්තා කිරීම.

v. මෙවැනි ගනුදෙනුවක් කිරීමේදී රටේ පවතින නීතිමය අවශ්‍යතාව කොපමණ දුරට මෙම ක්‍රියාවලියේදී අනුගමනය කර තිබේද යන්න කුමන අවශ්‍යතා මග හැර

තිබේද යන්න සහ විශේෂයෙන් තීරණ ගැනීමේදී නිලධාරීන් කෙසේ කටයුතු කර තිබේද යන්නත් පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කර වාර්තාවක් සැපයීම.

vi. මෙම ගනුදෙනුවලට අදාල ලිපි ලේඛනවල සුරක්ෂිතභාවය ගැන විශේෂ අවධානය යොමු කිරීම සහ ඒ සඳහා ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

vii. ගිවිසුම් නීතිමය විවරණයකට සහ තාක්ෂණික විවරණයකට නොයාම සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම.

viii. අමතර කොටස් වල මිල පෙර මාසයේ විනිමය අනුපාතයට ගැලපීමට හේතු පිළිබඳ වාර්තා කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාවේ ඉහත නිර්දේශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිගේ අංක ශ්‍රීලංගම/ස.කා/මු.කො./කෝප්/2017-09 හා 2017.11.24 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත පහත තොරතුරු වාර්තා කර ඇත.

i. Steel Impex සහ Nymbas Automotives ආයතනවලට අමතර කොටස් පිරිනැමීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොමැත.

ii. 2014.04.22 දින වන විට Steel Impex සමාගම ඉන්දියවේ පැවති ව්‍යාපාරික තත්ත්වය පිළිබඳ විශේෂ පරීක්ෂණයක් සිදු කර නොමැති අතර, ඉන්දියාවේ DENA BANK විසින් 2011.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද ලිපිය අනුව Steel Impex ආයතනය යහපත් තත්ත්වයකින් ඉන්දියාවේ ව්‍යාපාර කරමින් තිබූ ආයතනයක් බව පිලිගෙන ඇත. **(ඇමුණුම 06)**

iii. තාක්ෂණික ඇගයීම් කමිටුව පහත හේතූන් මත Steel Impex ආයතනය නිර්දේශ කර ඇත.

| ලංසු ඉදිරිපත් කරන ලද ආයතනය | මිල ගණන් සටහන් කර තිබූ අයිතම ප්‍රමාණය | අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ අයිතම ප්‍රමාණය |
|---|---|---|
| ලංකා අශෝක් ලේලන්ඩ් | 329 | 21 |
| DIMO ආයතනය | 60 | 03 |
| ඩග්ලස් ඇන්ඩ් සන්ස් | 187 | 99 |
| නිම්බස් ඔටෝ මෝටිව් | 740 | 206 |
| ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් | 706 | 418 |

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල විසින් අමතර කොටස් 747කට මිල ගණන් කැඳවා ඇති බවත් එහිදී වැඩිම අයිතම ප්‍රමාණයකට මිල ගණන් ඉදිරිපත් කර, ඒ අතරින් වැඩිම අයිතම ප්‍රමාණයකට අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය වශයෙන් Steel Impex ආයතනය හඳුනාගෙන, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව පැවතියේ එකම බැඳුම්කර ගබඩාවක් බැවින් ආයතන කිහිපයකට එකම

බැඳුම්කර ගබඩාවක කටයුතු කිරීමේ අපහසුතාවය සලකා බලා, Steel Impex ආයතනය අවම මිල ගණන් ඉදිරිපත් කර නොතිබූ ඉතිරි අමතර කොටස්ද අවම මිල ගණන් වලට සැපයීම සඳහා Steel Impex ආයතනය එකඟ කරගෙන කටයුතු කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබූ බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.

iv. දේශීය නියෝජිතයකු සිටිය යුතු බවට ප්‍රසම්පාදන කොන්දේසියක් නොතිබූ බවත් කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාව වන විට මෙම ආයතනයට දේශීය නියෝජිතයකු නොසිටි බවත් හා පසුව Steel Impex and industries (Lanka) නමින් ආයතනයක් ලියාපදිංචි කර එම ආයතනය දේශීය නියෝජිතයා ලෙස ශ්‍රී ලංගමට හඳුන්වා දුන් බවත් වාර්තා කර ඇත.

v. කාරක සභාවේ නිර්දේශ මගින් ඉල්ලා ඇති වාර්තාව 2018.01.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැති අතර, එවැනි විශේෂ පරීක්ෂණයක් ශ්‍රී ලංගම විසින් මෙතෙක් සිදු කර නොමැති බව වාර්තා කර ඇත.

vi. මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත ලබා දෙන ලද අදාල ලේඛන වල මුල් පිටපත් නැවත භාරදී ඇති බවත් එම ලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්මික) කාර්යාලයේ සුරක්ෂිතව තැන්පත් කර ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.

vii. කාරක සභාවේ නිර්දේශ මගින් ඉල්ලා ඇති වාර්තාව 2018.01.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැති අතර, එවැනි පරීක්ෂණයක් ශ්‍රී ලංගම විසින් මෙතෙක් සිදු කර නොමැති බව වාර්තා කර ඇත.

viii. ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ අගය සීඝ්‍ර ලෙස වැඩි වීම හේතු කොට ගෙන ආනයන බිල්පත් බේරුම් කිරීමේදී විශාල ගැටළුකාරී තත්ත්වයක් ඇති වන බවට වූ Steel Impex ආයතනයේ ඉල්ලීම සලකා බලා මෙම තීරණය ගෙන ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත. **(ඇමුණුම 05)**

## 03. Steel Impex සමාගමෙන් දුනුකොල මිලදී ගැනීම

එවකට නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (කාර්මික) සහ ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම් ඉහත සඳහන් ටෙන්ඩරය ලබා දීමෙන් පසුව 2013 වර්ෂයේදී Steel Impex ආයතනයෙන් දුනුකොල මිලදී ගැනීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වී ඇති අතර, ඒ බව 2013.04.30 දරන ලිපිය මඟින් ප්‍රථමයෙන් තෝරා ගත් සැපයුම්කරු වන Nandana Auto Products Company (Pvt) Ltd. ආයතනයට දැනුම් දී ඇති බව නිරීක්ෂණය වූ අතර මෙසේ වෙනත් සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේදී ප්‍රථමයෙන් තෝරා ගත් සැපයුම්කරු සමග ඇති කර ගත් ගිවිසුම අවලංගු කළේද යන්න කාරක සභාව විමසන ලදී.

ගිවිසුම අවලංගු කිරීමක් සිදු නොවූ බව එවකට සිටි නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (කාර්මික) පැවසූ අතර ගිවිසුම අවලංගු කිරීම සම්බන්ධයෙන් නීති අංශයේ නිලධාරීන්ගෙන් කිසිම අවස්ථාවක උපදෙස් ඉල්ලා නොතිබූ බව නීති නිලධාරී ප්‍රකාශ කරන ලදී.

ලබා දුන් පිළිතුර පිළිබඳ කාරක සභාව බලවත් අප්‍රසාදය පල කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. 2013.04.30 වන දින Nandana Auto Products Company (Pvt) Ltd. ආයතනයට යවා ඇති ලිපිය සභාගත කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

2018.01.31 දින වන විටත් කාරක සභාව විසින් සභාගත කරන ලෙස දන්වා ඇති උක්ත ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

### 04. <u>රු.මිලියන 66ක් අත්තිකාරම් ලෙස ගෙවීම</u>

ශ්‍රී ලංගමය විසින් දුනුකොල සැපයූ සමාගම වන Nandana Auto Products Company (Pvt) Ltd. ආයතනය වෙත චෙක්පත් 77 මඟින් රු.මිලි. 66ක් ගෙවා ඇති බව නිරීක්ෂණය වීම සහ අත්තිකාරම් මුදල් ගෙවීමට පෙර භාණ්ඩ ලැබුනු බවට තහවුරු කරගෙන නොමැති බව නිරීක්ෂණය වීම.

අත්තිකාරම් මුදල් ගෙවන ලෙස තමා කිසි විටෙකත් උපදෙස් දී නොමැති බවත්, කිසිදු චෙක්පතක අත්සන් කර නොමැති බවත්, වැඩිපුර මුදල් ගෙවා ඇති බව අදාළ සමාගමද පිළිගෙන ඇති බවත්,මෙම ගෙවීම් අනුමත කර ඇත්තේ එවකට සිටි ප්‍රධාන ගණකාධිකාරී බවත්, මේ සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත්,හිටපු සභාපති ශෂී වෙල්ගම මහතා පැවසූ අතර, වර්ෂ 2010 සිට Nandana Auto Products Company (Pvt) Ltd. සමාගම දුනුකොල සැපයීම කර ඇති බවත්, තමාගේ පත්වීමෙන් පසුව විගණනයක් කළ බවත්, ඒ අනුව රු.මිලියන 124ක් වැඩිපුර ගෙවා ඇති බව පෙනී ගිය බවත්, අයිතිකරු සමඟ සාකච්ඡා කිරීමේදී එම වැඩිපුර ගෙවූ මුදල කොටස් වශයෙන් ගෙවීමට එකඟ වූ නමුත් රු.697,000/-ක් පමණක් ආපසු ගෙවා තිබූ බැවින් වාණිජ මහාධිකරණයේ නඩු දෙකක් පවරා ඇති බවත්, අපරාධ විමර්ශන කොට්ඨාශයට ද පැමිණිල්ලක් කර ඇති බවත්, වර්තමාන සභාපති ප්‍රකාශ කරන ලදී.

චවුචර්වල වැය සහතික කරන නිලධාරියා ලෙස සුමිත් හෙට්ටිආරච්චි (මූල්‍ය කළමනාකරු) යන අයද, සංජීව වෛද්‍යාතිලක (ප්‍රධාන මූල්‍ය කළමනාකරු) යන අයද අත්සන් කර ඇති බව නිරීක්ෂණය විය.

ටෙන්ඩරයේ මූල්‍යමය වටිනාකම ගැන අවබෝධයක් නොතිබුනු බව සහ නිසි ක්‍රමවේදයකට අනුව ගෙවීම් කර නොමැති බව සුමිත් හෙට්ටිආරච්චි මහතා විසින් පිළිගන්නා ලදී.

### 05. <u>බස් රථ 2,200ක් මිලදී ගැනීම</u>

බස් රථ 2,200ක් මණ්ඩලය විසින් මිලදී ගැනීමේදී නොමිලේ ලැබෙන බස් රථ 18ක් කළුතර ප්‍රදේශයේ පාසැල් වෙත බෙදා හැර ඇති බව පසුගිය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අනාවරණය වී ඇති අතර, බස් රථ 2,200ට අමතරව සැපයුම්කරු විසින් ලබා දුන් වෙනත් බස් රථ ප්‍රමාණයක් ශ්‍රී ලංගමයට ලැබුනේද යන්න කාරක සභාව විමසන ලදී.

මෙම බස් රථ 2,200 මිලදී ගැනීමට තීරණය කළේ වර්ෂ 2013 – 2014 කාලයේදී බවත්, එම ටෙන්ඩරය සම්බන්ධව කටයුතු කළේ අමාත්‍යාංශය මඟින් බවත්, හිටපු සභාපති ශෂී වෙල්ගම මහතා සඳහන් කළ අතර, 2013.09.11 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක්

ඉදිරිපත් වී තිබුණු බවත්, 2013.10.17 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, ඒ අනුව කැබිනට් මණ්ඩලය මඟින් පත් කළ Negotiation Committee මඟින් අශෝක් ලේලන්ඩ් සමාගමෙන් බස් රථ මිලදී ගැනීමට තීරණය කළ බවත්, අවුරුදු 5කින් ගෙවී යන පරිදි 50%ක් මහා භාණ්ඩාගාරයෙන්ද 50%ක් ශ්‍රී ලංගමයෙන්ද ගෙවන පරිදි මහජන බැංකුව හරහා කල්බදු ක්‍රමය මත මෙම බස්රථ මිලදී ගත් බවත්, එවකට සිටි නිලධාරියෙක් ප්‍රකාශ කරන ලදී.

i. 2013.07.19 - ප්‍රථම බස් තොගය ලැබීම.

ii. 2015.03.28 - අවසන් බස් තොගය ලැබීම.

තවද, අමතර බස් රථ කිසිවක් ශ්‍රී ලංගමය නමට ලැබී නොමැති බවත්, ඒ සඳහා කිසිදු ගෙවීමක් ශ්‍රී ලංගමය හෝ භාණ්ඩාගාරය විසින් කර නැති බවත්, එම බස් රථ පාසැල්වලට පමණක් ලබා දී ඇති බවත්, අදාළ කාල සීමාව තුළ පෞද්ගලික ආයතන අශෝක් ලේලන්ඩ් සමාගමෙන් ලබා ගත් බස් රථවල මිල ගණන් ද සලකා බැලීමක් Negotiation Committee මඟින් කර තිබෙන බවත්, වර්තමාන සභාපති පැවසූ අතර, ශ්‍රී ලංගමය මිලදී ගත් බස් රථවල මිල ගණන් පහත සඳහන් පරිදි වන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| | ප්‍රථම කාර්තුවේදී | දෙවන කාර්තුවේදී |
|---|---|---|
| ආසන 42 | ඇ.ඩො. 31,100 | ඇ.ඩො. 32,100 |
| ආසන 54 | ඇ.ඩො. 34,100 | ඇ.ඩො. 35,100 |

මේ කාලය වන විට සාමාන්‍ය වෙළෙඳපොලේ මිල ගණන්ද මේ හා සමාන වූ බවත්, ඊට අදාළ තොරතුරු අශෝක් ලේලන්ඩ් සමාගමෙන් ලබා ගත් බවත්, තවදුරටත් පැවසූ අතර, රු.බිලියන 10.684ක් වසර 05 අවසාන වන විට ශ්‍රී ලංගමය මඟින් බස් රථ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීමට තිබූ බව අධ්‍යක්ෂ මණ්ඩලයේ එවකට සිටි නිලධාරියෙක් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. අශෝක් ලේලන්ඩ් සමාගමෙන් ලබා ගත් තොරතුරු මත වෙළෙඳපොල මිල ගණන් ගණනය කළ වාර්තාව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිගේ අංක ශ්‍රීලංගම/ස.කා/මු.කො./කෝප්/2017-09 හා 2017.11.24 දිනැති ලිපිය මඟින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව **ඇමුණුම 07** යටතේ දැක්වේ.

## 06. <u>බස් රථ 47ක් ගාස්තු අය කිරීමකින් තොරව යෙදවීම</u>

මතුගම නගරයේ පැවති උත්සවයක් සඳහා කළුතර ප්‍රාදේශිකයට අයත් ඩිපෝ 6කින් බස්රථ 47ක් ගාස්තු අය කිරීමකින් තොරව 2014.01.31 වන දින යොදවා තිබූ බව අනාවරණය වීම.

තමාගේ නිල කාලය තුළ කිසිම අවස්ථාවක කිසිම බස් රථයක් මුදල් අය නොකර ලබා නොදෙන ලෙස උපදෙස් දී තිබූ බව හිටපු සභාපති ශෂී වෙල්ගම මහතා පැවසූ අතර, මේ කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව වර්තමාන සභාපති ප්‍රකාශ කරන ලදී.

කාරක සභාවේ අවධානයට යොමු වූ ප්‍රධාන කරුණු

- අමතර කොටස් මිලදී ගැනීම
- දුනුකොළ මිලදී ගැනීම
- බස් රථ 2,200ක් මිලදී ගැනීම
- ගාස්තු රහිතව බස් ලබා දීම

**<u>නිර්දේශ</u>**

i. පළමු කරුණු දෙක පිළිබඳව ව්‍යවහාරික විගණනයක් කරන ලෙසත් ඉතිරි කාරණා පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අභ්‍යන්තර පරීක්ෂණයක් කර ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව දැනුවත් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

2014.01.31 වන දින මතුගම නගරයේ පැවති උත්සවයක් සඳහා ගාස්තු රහිතව බස්රථ 47ක් යොදවන ලද බවට කරන ලද විමර්ශන වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එමගින් වැඩි දුරටත් දක්වා ඇත්තේ මෙම විමර්ශනයට අදාල විස්තර ලබා ගැනීමට අවශ්‍ය ධාවන විස්තර බොහෝමයක් නොතිබූ බවත්, හොරණ, පානදුර සහ අළුත්ගම ඩිපෝවන්ට අදාල මෙම ලේඛනයන් හිතාමතා විනාශ කිරීමක් හෝ අස්ථානගත කිරීමක් සිදුවී ඇති බවත්ය.

තවද මෙම ප්‍රාදේශිකයේ දෛනික අදායම අදාල දිනයේදී විශාල අඩුවීමක් පෙර දිනයන්ට සාපේක්ෂව පෙන්නුම් කරන බව විමර්ශන වාර්තාවේ වැඩිදුරටත් දක්වා ඇත. විමර්ශන වාර්තාවේ සංක්ෂිප්තය **ඇමුණුම 08** යටතේ ඇතුළත්ය.

**ඇමුණුම 05**

| | |
|---|---|
| | මුදල් ප්‍රතිපාදන ලබාගැනීමට අනුමැතිය අපේක්ෂාවෙන් ශ්‍රීලංගම ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන විසින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකාව ඉදිරිපත් කර ඇත.<br><br>පත්‍රිකාවේ සඳහන් කරුණු විමසා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය තාක්ෂණ ඇගයීම් කමිටුවේ වාර්තාවට යටත්ව ජාතික තරගකාරී ප්‍රසම්පාදන පිළිවෙතට අනුව ලංසු කැඳවා අවම ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවාට හෝ ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරා දීමට හා අදාළ මුදල් ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබාදීමට තීරණය කරන ලදී.<br>සභාපතිතුමා / උප සභාපතිතුමා / ප්‍රධාන විධායක නිලධාරීතුමා / ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන / [redacted] - අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා |
| 2012/08/04 | ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අශෝක් ලේලන්ඩ් සහ ටාටා බස්රථ වලට අමතර කොටස් සැපයීම.<br><br>2012 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 69 සභාගත කරන ලදී.<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අශෝක් ලේලන්ඩ් සහ ටාටා බස්රථවලට අවශ්‍ය අමතර කොටස් ඉන්දියාවේ ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම විසින් මණ්ඩලය වෙනුවෙන් ආනයනය කර 2011 ජූනි සිට මේ දක්වා සපයනු ලැබේ. මෙම අමතර කොටස් සපයා ගැනීමේදී එම භාණ්ඩවලට අදාළ මිළ, රක්ෂණ හා නැව් ගාස්තුවල (CIF) ඇමෙරිකානු ඩොලර් වටිනාකම, විනිමය අනුපාතය අනුව පරිවර්තනය කර ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවනු ලැබේ. මේ අනුව දැනට ඇමෙරිකානු ඩොලරයට ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය රු: 129.93ක් වශයෙන් සලකා ගෙවීම් කරනු ලැබේ. |

3

එහෙත් ශ්‍රී ලංකා රුපියලට එරෙහිව ඇමෙරිකානු ඩොලරයේ අගය පසුගිය දින කිහිපය තුළ ශීඝ්‍රයෙන් වැඩිවීම හේතු කොටගෙන රුපියල් 136.02 බැගින් ගෙවා ආනයන බිල්පත් බේරුම් කිරීමට සිදුවී ඇති බව ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම දන්වා සිටී. ඒ අනුව ශ්‍රීලංගම ඩිපෝවලට අමතර කොටස් තිකුත් කිරීමේදී රු:136.02ක විනිමය අනුපාතය යොදා බිල්ගත කිරීමට මණ්ඩලීය අනුමැතිය ඉල්ලා සිටී.

ශ්‍රී ලංගම විසින් ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම සමග ගිවිස ගෙන ඇති පරිදි බිල්පත් බේරුම් කරන දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිගමනය කෙරෙන විනිමය අනුපාතය උපයෝගී කරගෙන ගෙවීම් කිරීමට ප්‍රතිපාදන සැලසී ඇත. එහෙත් දෛනිකව විනිමය අනුපාතයන් උච්චාවචනය වන බැවින් එපරිදි ක්‍රියා කිරීමට ප්‍රායෝගිකව අපහසුවේ. එහෙයින් නිශ්චිත කාලසීමාවක් සඳහා එකඟවිය හැකි පොදු අනුපාතයක් පදනම් කරගෙන ගෙවීම් කිරීම උචිත බැව් පෙනේ.

එබැවින් ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගමෙන් අමතර කොටස් ලබා ගැනීමේදී සෑම මාසකයම පළමු දින ඉකුත් මාසයේදී බල පැවැත්වූ විනිමය අනුපාතයේ මාසික සාමාන්‍යය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගෙන ඉදිරි මාසය වෙනුවෙන් එය උපයෝගී කරගෙන, බිල්ගත කිරීමට යෝජනා කරනු ලැබේ. මෙම වැඩ පිළිවෙල මින් ඉදිරියට සෑම මාසයක් පාසාම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

තවද මණ්ඩලයට අමතර කොටස් සැපයීමට පවරා ඇති දෙවෙනි සැපයුම්කරු වූ නිම්බස් ඔටෝ මෝටිව් පුද්ගලික සමාගමෙන් භාණ්ඩ ලබාගැනීමේදී මෙම ක්‍රියා පිළිවෙත අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ. මණ්ඩලයට අවශ්‍ය අමතර කොටස් සපයා ගැනීමේදී ඉහත සඳහන්

4

කළ ක්‍රමවේදය අනුව බිල්ගත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් මෙම පත්‍රිකාව සභාගත කර ඇත.

පත්‍රිකාවේ සඳහන් කරුණු සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය ස්විල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගමෙන් සහ නිම්බස් මොටෝ මෝට්ව් පුද්ගලික සමාගමෙන් අමතර කොටස් ලබාගැනීමේදී සෑම මාදයකම පළමු දින ඉකුත් මාසයේදී බල පැවැත්වූ විනිමය අනුපාතයේ මාසික සාමාන්‍යය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගෙන ඉදිරි මාසය වෙනුවෙන් එකී අනුපාතය උපයෝගී කරගෙන බිල්ගත කිරීමට තීරණය කරන ලදි.

( සභාපතිතුමා / උප සභාපතිතුමා / ප්‍රධාන විධායක නිලධාරීතුමා / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( කාර්මික ) /~~ප්‍රධාන මූල්‍ය කළමණාකාර~~ ) – අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා

ප්‍රධාන මූල්‍ය කළමණාකාර
මුදල් කොට්ඨාශය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
නො 200, කිරුළ පාර,
කොළඹ 05.

2012/08/05 ආරක්ෂක නියාමක මහතුන්ගේ තනතුරු නාමය වෙනස්කර වෙනත් කාර්යවල යෙදවීම වලකාලීම

2012 අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා අංක 74 සභාගත කරන ලදි.

සාර්ථක ඵලදායි කාර්යක්ෂම ආරක්ෂක සේවාවක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ස්ථාපනය කර පවත්වාගෙන යාමේ මූලික පරමාර්ථය පෙරදැරිව හමුදා සේවයේ අවුරුදු 10ක් හෝ 12ක් සේවයකර නීත්‍යානුකූලව ඉවත්වූවන් ආරක්ෂක නියාමකවරුන් වශයෙන් බඳවාගන්නා ලදි.

එසේ ආරක්ෂක නියාමක තනතුරට බඳවාගත් අයවලුන් එම වෘත්තියෙහිම සේවයේ යෙදිය යුතු අතර, තනතුරු නාමය වෙනස්කර එම ආරක්ෂක නියාමක තනතුර දරමින් වෙනත් කාර්යවල යෙදවීමද නොකළ යුතුය. නමුත් දැනට ආරක්ෂක නියාමකවරුන් එම තනතුර දරමින්

5

## ඇමුණුම 06

वेना बैंक
DENA BANK

SANDHURST BRIDGE BRANCH
434, Dr. Dadasaheb Bhadkamkar Road
Mumbai 400 004
Tel: 23821611, 23887973 Fax: 23859615

SB/LTR/34/2011
25th January, 2011

**TO WHOM SO EVER IT MAY CONCERN**

This is to certify that "Steel Impex & Industries, Mira Road East, Thane, India" is 100% Export Oriented Company having business experience of over 45 years.

The Company is our customer since inception of its business.

It is a very well established organization with strong finanacial position.

It is treated that this information is furnished without any risk and responsibility on our part in any respect whatsoever more particularly either as guarantor or otherwise. This certificate is issued at the specific request letter dated 23.01.2011

For DENA BANK,
Sandhurst Bridge Branch

DENA BANK S.B. MUMBAI

Chief Manager

RECEIVED
10 MAR 2011
TENDER SECTION
SRI LANKA TRANSPORT BOARD

## ඇමුණුම 07

DGM(Technical)"s Office
25th September 2017

Chairman,
SLTB.

**Report on the Price Comparison of Buses procured under 2200 Bus Project by SLTB and similar buses of Private Sector**

On 19.07.2013 Lanka Ashok Leyland PLC had submitted a proposal on behalf of Ashok Leyland Ltd. India to supply registered 800 nos. Viking 42 seater buses and 1400 nos. Viking 54 seater buses at all inclusive unit prices (as per exemption granted from local levies to SLTB) of USD 32,100 and USD 35,100 respectively with a warranty of 18 months, on supplier's credit basis to be paid back in 05 years in 20 quarterly installments at an interest of 3.98% on diminishing balance.

Consequent to a Cabinet memo submitted by Hon. Minister of Transport on 11.09.2013 to accept the above proposal, the Cabinet had appointed a Cabinet Appointed Negotiating Committee (CANC) on 17.10.2013. A Project Committee (PC) to assist the CANC had been appointed on 19.12.2013.

Taking into consideration the observation of SEMA attached to the Cabinet decision, it was decided to provide the proposer with revised SLTB specifications including technical improvements from the existing fleet and request the proposer to respond to same. In the revised specifications the following additional items, which had not been in the Ashok Leyland proposal, were included.

The included items were:

Rear luggage compartment

Guard rail for driver area

Electronic front & rear destination board

07 nos. 16 PR Tyres instead of 14 PR Tyres

CCTV device with storage system

Multi function GPS device including fuel sensor & 02 way communication system

and a Warranty of 200,000 Km for the bus and 03 years warranty on paint

In his response dated 10.01.2014, the proposer agreed to supply all the above items excluding CCTV devise with storage system at the quoted prices. He also agreed to a warranty of 200,000 Km for the bus and 03 years warranty on paint.

At the negotiations held on 16.01.2014 by the PC with the proposer, he agreed to include CCTV device with storage system also at the quoted prices.

And at the negotiation held by CANC on 30.01.2014, the proposer agreed to a reduction of USD 1000 per bus for both types.

The final agreement with the proposer was for the supply of :

- 800 nos registered A/L Viking 42 seater buses at a unit price of USD 31,100 (as per exemption granted from local levies to SLTB)

and

- 1400 nos registered A/L Viking 54 seater buses at a unit price of USD 34,100 (as per exemption granted from local levies to SLTB)

with Rear luggage compartment, Guard rail for driver area, Electronic front & rear destination board, 07 nos. 16 PR Tyres instead of 14 PR Tyres, CCTV device with storage system , Multi function GPS device including fuel sensor & 02 way communication system and a Warranty of 200,000 Km for the bus and 03 years warranty on paint.

**Comparison with the prices quoted by the proposer to private sector**

**A/L Viking 42 seater buses offered to Private Sector**

As per proforma invoice of Lanka Ashok Leyland PLC dated 13.01.2014, the unit price of an A/L Viking 42 seater bus was Rs. 4,200,000/- with a warranty of 12 months/100,000 km whichever occurs first. The following items were offered as optional:

| | |
|---|---|
| Rear luggage compartment | Rs 35,000/- |
| Guard rail for driver area | Rs 18,000/- |
| Electronic front & rear destination board | Rs. 50,000/- |
| 07 nos. 16 PR Tyres instead of 14 PR Tyres | Rs. 18,000/- |
| Multi function GPS device | Rs 65,000/- |
| Registration | Rs 30,000/- |
| Total | Rs. 216,000/- |

Hence the unit price of a A/L Viking 42 seater bus with above optionals was Rs 4,416,000/- with *a warranty of 12 months/100,000 km whichever occurs first* but without *CCTV device with storage system and 03 year warranty on paint available for busses offered to SLTB.*

**A/L Viking 42 seater buses offered to SLTB**

On 13.01.2014 the exchange rate was USD 1= Rs 132.17

Hence the Rupee price on 13.01.2014 of a A/L Viking 42 seater bus offered to SLTB was Rs 4,110,487/- (that is 31,100 x 132.17) as per exemption granted from local levies to SLTB, with all the optional offered to private sector + *CCTV device with storage system, Warranty of 200,000 Km and 03 year warranty* on paint.

Buses imported for SLTB as well as Private sector are exempted from VAT and Custom Duty. But PAL & NBT is applicable. So for comparison, NBT and PAL ( which is approximately 7.3% of CIF value) have to be added to the price offered to SLTB making the price Rs 4,410,553/- (that is 4,110,487/- x 1.073) .

Then the actual price of A/L Viking 42 seater bus for SLTB was Rs 4,410,553/- with *CCTV device with storage system, Warranty of 200,000 Km and 03 year warranty on paint* compared to Rs 4,416,000/- for Private sector without *CCTV device with storage system & 03 year warranty on paint* and with *only* a *Warranty of 12 months/100,000 km whichever occurs first*

According to the CANC report, the proponent's costing for all the extras offered to SLTB (including the additional items and the additional warranties) was Rs. 376,390/-, making the total unit price for private sector of a bus similar to the one

offered to SLTB at Rs. 4,410,553/- to be Rs 4,576,390/- (that is Rs 4,200,000/- + 376,390/-).

**A/L Viking 54 seater buses offered to Private Sector**

As per proforma invoice of Lanka Ashok Leyland PLC dated 13.01.2014, the unit price of an A/L Viking 54 seater bus was Rs. 4,575,000/- with a warranty of 12 months/100,000 km whichever occurs first.

The following items were offered as optional:

| | |
|---|---|
| Guard rail for driver area | Rs 18,000/- |
| Electronic front & rear destination board | Rs. 50,000/- |
| 07 nos. 16 PR Tyres instead of 14 PR Tyres | Rs. 18,000/- |
| Multi function GPS device | Rs 65,000/- |
| Registration | Rs 30,000/- |
| Total | Rs. 181,000/- |

Hence the unit price of a A/L Viking 54 seater bus with above optionals was Rs 4,756,000/- with *a warranty of 12 months/100,000 km whichever occurs first* but without *CCTV device with storage system, warranty of 200,000km for the bus and 03 year warranty on paint available for busses offered to SLTB.*

**A/L Viking 54 seater buses offered to SLTB**

At the exchange rate of USD 1= Rs 132.17 , the Rupee price on 13.01.2014 of a A/L Viking 54 seater bus offered to SLTB was Rs 4,506,997/- (that is 34,100 x 132.17) as per exemption granted from local levies to SLTB, with all the optional offered to private sector + *CCTV device with storage system, Warranty of 200,000 Km and 03 year warranty on paint.*

For comparison NBT and PAL ( which is approximately 7.3% of CIF value) have to be added to the price offered to SLTB making the price Rs 4,836,008/- (that is 4,506,997/- x 1.073) .

Then the actual price of A/L Viking 54 seater bus for SLTB was Rs 4,836,008/- with *CCTV device with storage system, Warranty of 200,000 Km and 03 year warranty on paint* compared to Rs 4,756,000/- for Private sector without *CCTV device with storage system & 03 year warranty on paint* and with only a *Warranty* of *12 months/100,000 km whichever occurs first*

According to the CANC report, the proponent's costing for all the extras offered to SLTB (including the additional items and the additional warranties) was Rs. 376,390/- making the total unit price for private sector of a bus similar to the one offered to SLTB at Rs. 4,836,008/- to be Rs 4,951,390/- (that is Rs 4,575,000/- + 376,390/-)

From the above it can be seen that for a proper price comparison of buses between Private Sector and SLTB, it is not only the GPS system but other additional items and warranties need to be taken into account.

G.K. Ariyarathna
Dy. General Manager (Technical)
SLTB

## ඇමුණුම 08

### 2014 ජනවාරි මස 31 වන දින මතුගම නගරයේ පැවති "දිරි උදාව" උත්සවය සඳහා කළුතර ප්‍රාදේශිකයට අයත් ඩිපෝවන් මගින් බස් රථ 47 ක් ගාස්තු අයකිරීමකින් තොරව සේවයේ යොදවා තිබූ බවට ලැබුන පැමිණිළි අනුව කරනු ලැබූ විමර්ශන වාර්ථාව.

කළුතර ප්‍රාදේශිකයට අයත් අළුත්ගම/හොරණ/පානදුර/කළුතර මතුගම යන ඩිපෝවන් පහෙන් බස් රථ විශාල සංඛ්‍යාවක් 2014.01.31 වන දින මතුගම දක්වා විවිධ ස්ථානයන් නි සිට ගමන් වාර කිහිපයක් හෝ ධාවනය කර ඇති නඅර ඒ සඳහා උපදෙස් ලබා දීමද සිදු කර ඇති බවට අදාල ලොග් පත්‍ර හා ආදායම් රහිතව මගී ප්‍රවාහනයේ යෙදුන බවට ඇතැම් මාර්ග ලේඛණ පරීක්ෂා කිරීමේදී තහවුරු විය. එක් එක් ඩිපෝවන් සඳහා වෙන් වෙන් වශයෙන් කරුණු සොයා බැලීමේදී හොරණ, අළුත්ගම ඩිපෝවන් හි 2014.01.31 වන දිනට අදාල ඊට අදාල ලොග් පත්‍ර මාර්ග ලේඛණ අස්ථානගත වීම හෝ විනාශ වී ඇති බවට සහකාර කළමණාකාර මුදල් හොරණ ,අළුත්ගම යන නිළධාරී මහතුන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමේදී තහවුරු වේ. එමෙන්ම මතුගම ඩිපෝවේද මාර්ගලේඛණ සොයා ගැනීමට නොහැකි වූ අතර කළුතර ඩිපෝවේ පමණක් ලොග් පත්‍ර හා මාර්ග ලේඛණ නියමිත පරිදි තිබිනි.

ඉහත නම් සඳහන් ඩිපෝවන් පහේ බස් රථ ධාවනය පිළිබඳ නිසි විස්තර නොතිබුනද එම දිනයන් හි ලැබූ ආදායම සම්බන්ධ සෑම ඩිපෝවකට අයත් R 10 හෝ R 11 සොයා ගැනිමට හැකිවූ අතර එම ලේඛනයන්ට අනුව 2014.01.31 දිනට අදාල ආදායම් අඩුවීමක් 2014.01.30 වෙනි දිනට සාපෙක්ෂව අඩුවීමක් දක්නට තිබිනි. එය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

30

| අනු අංකය | ඩිපෝව | 2014.01.30 වන දින මාර්ග ලේඛණ ආදායම් R 10 හෝ R 11 අනුව | 2014.01.31 වන දින මාර්ග ලේඛණ ආදායම් R 10 හෝ R 11 අනුව | වෙනස |
|---|---|---|---|---|
| 1. | අළුත්ගම | 444,406.50 | 351,925.50 | 92,481.00 |
| 2. | හොරණ | 422,132.00 | 301,069.00 | 121,063.00 |
| 3. | පානදුර | 913,501.50 | 691,598.00 | 221,902.50 |
| 4. | කළුතර | 510,400.50 | 381,410.00 | 128,989.50 |
| 5. | මතුගම | 562,326.00 | 335,717.50 | 228,608.50 |

ඒ අනුව 2014.01.31 වන දින මගී ප්‍රවේශ පත් අලවියෙන් මණ්ඩලයට අහිමි වූ ආදායම 2014.01.30 වන දිනට සාපේක්ෂව 793,044.50 මුදලක් වේ. අදාල ඩිපෝවන් පහෙන් කිසිදු ඩිපෝවකින් අදාල දිනය වෙනුවෙන් මුදල් ගෙවා බස්රථ වෙන් කරවා ගැනිමක් සිදුකර නොමැති බව සු/10 ලේඛන පරික්ෂා කිරීමේදී තහවුරු වේ. මෙම ප්‍ර වේශ පත්‍ර අලෙවියෙන් ලද පාඩුවක් ලෙස පෙන්නුම් කළද මෙහිදී ඊට වඩා වැඩි අලාභයක් මණ්ඩලයට සිදුවී ඇති බවත් එනම් සේවක අතිකාල සහ වැටුප් වැය වී ඉන්ධන ප්‍රමාණය ගණනය කර නොමැත.

මගේ අංකය: ශ්‍රී ලංගම/ආ/12/ජ්‍යෙ.ස.ආ.නි/2017
2017 සැප්තැම්බර් 7

ප්‍රධානී ආරක්ෂක හා විමර්ශන තැන,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

**<u>2014 ජනවාරි 31 වන දින මතුගම නගරයේ පැවති උත්සවයක් සඳහා කළුතර ප්‍රාදේශිකයට අයත් ඩිපෝවන් මගින් බස් රථ 47 ක් ගාස්තු අයකිරීමකින් තොරව යොදවා තිබුනු බවට ලැබුන පැමිණිල්ලට අනුව කරනු ලබන විමර්ශන වාර්ථාව.</u>**

ඉහත දිනයට අදාල ධාවන විස්තර සියල්ල නිවැරදිව කළුතර ප්‍රාදේශිකයට අයත් ඩිපෝවන් සියල්ලගෙම නොතිබුණ බවත්, කළුතර ඩිපෝවේ පමණක් යම් ප්‍රමාණයක් තිබු සොයා ගැනීමට හැකිවිය. පානදුර, අළුත්ගම, හොරණ සම්බන්ධයෙන් එදිනට අදාල මාර්ග ලේඛන විනශ කිරීම හෝ අස්ථානගත කිරීම ලේඛනාගාරයෙන් ඉවත් කිරීමක් සිදුකර ඇති බව විමර්ශනයේදී හෙලි වු අතර, ඒ සම්බන්ධයෙන් අදාල ඩිපෝවන් හි සහකාර කළමණාකාර (මුදල්) අයගෙන් ප්‍රකාශණ ලබාගන්නා ලදි. ධාවන විස්තර සියල්ල නොතිබුණ අදාල ඩිපෝවන් පහේ අළුත්ගම, හොරණ, මතුගම, කළුතර, පානදුර ධා/01, R/10,R/11, මු/10 ලේඛණද එදිනට අදාල ලොග් පත්‍ර හා සොයා ගැනීමට හැකි වු මාර්ග ලේඛන ඇසුරෙන් කරනු ලැබු විමර්ශන වාර්තාව හොරණ ඩිපෝව පිටු 01යි, අළුත්ගම ඩිපෝව පිටු 01, කළුතර ඩිපෝව 03, මතුගම ඩිපෝව 02, පානදුර 02 යි, ඉදිරිපත් කර ඇත. අදාල විස්තර තිබුණු ලේඛණ අනුව වාර්තාව එක් පිටුවකට ගොනු කර ඇත. ඩිපෝවන් මගින් මතුගම තිබු දිවි උදාන වැඩසටහනට ලංගම බස්රථ 47 නොව ඊට වඩා වැඩි ප්‍රමාණයක් ධාවන කර ඇති අතර, මුදල් අය නොකර බස්රථ ධාවනය කළ බවට තහවුරු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ලේඛන එවකට පැවැති පරිපාලනය විසින් තිසා මතා විනාශ කර දැනුම්මක් හෝ ඩිපෝ ලේඛණාගාරය තුලින් ඉවත් කිරීම සිදුකර ඇත.

2014/01/31 වන දින 2014/01/30 වෙනි දිනට සාපේක්ෂව කළුතර ප්‍රාදේශිකය තුල අහිමි වු මගී ප්‍රවේශපත් අලෙවි ආදායම ආසන්න වශයෙන් 7,93044.50 පමණ වේ. මේ දින සේවයේ යොදවනු ලැබු සේවක මහතුන්ගේ අතිකාල සහ වැය වි ඇති ඉන්ධන ප්‍රමාණයන් සම්බන්ධයෙන් ඇති වූ පාඩුව ගණනය කිරීමක් මෙම වාර්තාවට ඇතුලත් කර නොමැති බව සඳහන් කරමි. මෙම කාර්ය සඳහා උපදෙස් දීම සම්බන්ධව වගකීම පැවරිය යුතු ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර හා ධාවන කළමණාකාර සම්බන්දයෙන් සොයා බැලීමේදී කළුතර ප්‍රාදේශිකයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර ලෙස කටයුතු කල එච්.එම්.හේරත් බණ්ඩාර මහතා මේ වන විට මියගොස් ඇති බවත් එම කාලය තුල ධාවන කළමණාකාර ලෙස කටයුතු කල පී.පී.එස්.මුතුකුමාරණ මහතා විශ්‍රාම ගොස් ඇති බවත් විමර්ශනයේදී හෙලි වේ.එම කාලයතුල ඩිපෝ කළමනාකාර ලෙසින් සේවය කල පානදුර, මතුගම, කළුතර ,අළුත්ගම යන ඩිපෝවන් හි ඩිපෝ කළමණාකාරවරුන් ස්වේඡාවෙන් විශ්‍රාම ගැන්වීම යටතේ මේවය අවසන් කර ඇත.හොරණ ඩිපෝවේ ඩිපෝ කළමණාකාර ලෙස සේවය කල දැනට මොරටු ඩිපෝවේ සේවය කරනු ලබන සංජීව මහතා ප්‍රකාශ කර සිටිනුයේ ප්‍රාදේශීය කළමනාකාර තැනගේ උපදෙස් පරිදි ආදාල ධාවනයන් සිදු කල බවයි. හොරණ ඩිපෝවේ 2014.01.31 දිනට අදාල ධාවන විස්තර කිසිවක් සොයා ගැනීමට නොහැකි වූ අතර අදාල තොරතුරු ලබා ගැනීමට සිදුවූයේ ආර් 10 ලේඛණය ඇසුරෙන් හා මු 10 ලේඛණය ඇසුරෙන් පමණි.

විමර්ශන කරන අවස්ථාව වන විට කළුතර ඩිපෝව හැර පානදුර, අළුත්ගම, මතුගම, හොරණ ඩිපෝවන් හි සිටි ඩිපෝ කළමණාකාර මහතුන් මණ්ඩලීය සේවය අවසන් කර ඇත. එකළ සිටි ප්‍රාදේශිය කළමණාකාර තැන මිය ගොස් ඇති අතර, ධාවන කළමණාකාර තැන විශ්‍රාම ගොස් ඇත. කළුතර ඩිපෝව මගින් 2014/01/31 වෙනි දින බස්රථ 30 ආසන්න ප්‍රමාණයක් මතුගම දක්වා ධාවන කර ඇති අතර, එවකට සිටි ඩිපෝ කළමණාකාර පි.එම්.ශාන්ත මහතා දැනට මධ්‍යම බස්රථ කාර්යාලයේ ජංගම අංශයේ සේවය කරනු ලබයි.

| | |
|---|---|
| සි.කේ.එස්.සී. මාදොල | නිමල් හේමසිරි |
| ජ්‍යෙෂ්ඨ සහකාර ආරක්ෂක නිළධාර | ආරක්ෂක පරික්ෂක |

# <u>සබරගමුව විශ්වවිද්‍යාලය</u>

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 09 වන දින**

<u>සටහන</u>

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය සතු විශ්වවිද්‍යාල සියල්ල වෙන වෙනම කාරක සභාව ඉදිරියට කැඳවා, එකිනෙක විශ්වවිද්‍යාලයන්හි පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡා කර එම ගැටලු හඳුනාගැනීමටත්, ඒ අනුව සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම උන්නතිය උදෙසා එම හඳුනාගත් ගැටලු සම්බන්ධයෙන් පොදුවේ ගතයුතු ක්‍රියාමාර්ග හා නිර්දේශ ඇතුළත් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කාරක සභාව තීරණය කරන ලදී.

එසේ හෙයින් සබරගමුව විශ්වවිද්‍යාලය 2017 අගෝස්තු මස 09 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවා සිදු කරන ලද විමර්ශනයට අදාල තොරතුරු කාරක සභාව විසින් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාව මගින් ඉදිරිපත් කරනු ඇත.

# මිල්කෝ පුද්ගලික සමාගම

(ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 11 වන දින**
**2017 අගෝස්තු මස 22 වන දින**
**2017 සැප්තැම්බර් මස 06 වන දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

## 01. කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය

කොළඹ මධ්‍යස්ථානය නවීකරණය කිරීම, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 80ක් අලුත්වැඩියා කිරීම සහ නව මධ්‍යස්ථාන 20ක් ස්ථාපිත කිරීම සඳහා HSBC බැංකුව හා මහා භාණ්ඩාගාරයේ සම්බන්ධීකරණයෙන් මිල්කෝ සමාගම ඩෙස්මි ආයතනය සමඟ 2009 යුරෝ මිලි. 39.10ක් ලෙස ඇති කර ගත් ණය ගිවිසුම, ඉටු කළ යුතු කාර්යයන් ප්‍රමාණය අඩු කිරීම මඟින් 2012 යුරෝ මිලි. 33.78ක් ලෙසට අඩු කර නව ගිවිසුමකට එළඹ තිබීම පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු විය.

එවකට ධූරය දැරූ සභාපති විසින් ගනු ලැබ ඇති මෙම තීරණය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, 2011 වර්ෂයේ ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව මිල්කෝ සමාගමේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

පහත සඳහන් වාර්තා සති 02ක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

i. මෙම තීරණය ගනු ලැබීම සඳහා ඉදිරිපත් කරන ලද කැබිනට් මණ්ඩල පත්‍රිකාව
ii. ඒ සඳහා කැබිනට් මණ්ඩල තීරණය දෙනු ලැබූ ලිපිය
iii. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ඇතුළත් වාර්තාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

මෙම තීරණය ගනු ලැබීම සඳහා ඉදිරිපත් කරන ලද කැබිනට් මණ්ඩල පත්‍රිකාව **ඇමුණුම 09** යටතේ අන්තර්ගතව ඇති අතර, ඒ සඳහා කැබිනට් මණ්ඩල තීරණය දෙනු ලැබූ ලිපිය **ඇමුණුම 10** යටතේ ඇතුළත්ය.

තවද නිර්දේශ අංක iii මගින් ඉල්ලා ඇති වාර්තාව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 02. ඩෙස්මි ආයතනය සමඟ ගිවිසුම

සමාගම හා ඩෙස්මි ආයතනය අතර එළඹ ඇති ගිවිසුම අනුව කොන්ත්‍රාත් කාලය 2014.07.12 දිනෙන් අවසන් විය යුතුව තිබුනද, දිගන හා අඹේවෙල කර්මාන්තශාලා නවීකරණ කටයුතු 2017.07.31 දින දක්වාත් අවසන් වී නොතිබුන නමුත්, කොන්ත්‍රාත්

කාලය දීර්ඝ කිරීමට හෝ එකඟ වී ඇති ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබීම සහ කටයුතු අවසන් කර නොතිබියදීත් රඳවා ගැනීමේ ගාස්තු ගෙවා තිබීමත්, ඩෙස්මි ආයතනය සමඟ කටයුතු කිරීමේදී ආයතනය සමඟ කටයුතු සිදු කරන දේශීය නියෝජිතවරයා කවුද යන්න පිළිබඳවත් කාරක සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

මෙම ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී අත්හිටුවා ඇති අතර, නව ගිවිසුම යටතේ නැවත 2013 වර්ෂයේ දී ආරම්භ කර ඇති බවත් අවසන් කළ යුතු කාල සීමාවක් ගිවිසුමේ දක්වා නොමැති බවත්, මෙම ව්‍යාපෘතියේ දේශීය දායකත්වය මිල්කෝ ආයතනය මඟින් දරන අතර, එහි ක්‍රියාකාරීත්වයේ දුර්වලතාවයන්ද මෙම ප්‍රමාදයන් සඳහා හේතු වී ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පරිදි, බැංකු ඇපකරයක් මත රඳවා ගැනීමේ ගාස්තුව ගෙවා ඇති බවත් සමාගමේ සභාපති විසින් අදහස් දක්වන ලදී.

<u>**නිර්දේශ**</u>

i. සමාගම හා ඩෙස්මි ආයතනය අතර ඇති කර ගනු ලැබූ ගිවිසුම් කාරක සභාව වෙත සති දෙකක් තුළදී ඉදිරිපත් කිරීම.

ii. පහත කරුණු පිළිබඳව සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත සති දෙකක් ඇතුළත ලබා දීම.

- ඩෙස්මි ආයතනය සමග ඇති කර ගන්නා ලද මෙම ගිවිසුම් සහ එකඟතාවයන් ඇති වූයේ කෙසේද?
- ඒ සඳහා පසුබිම සැකසුනේ කෙසේද?
- භාණ්ඩාගාරයෙන් මෙම ව්‍යාපෘතිය අනුමත වූයේ කෙසේද?

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

i. කිරි සකස්කිරීමේ කර්මාන්තශාලා 4ක හා කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 20ක පහසුකම් නවීකරණය කිරීම සඳහා මිල්කෝ සමාගම හා ඩෙස්මි ආයතනය අතර 2009.12.31 දිනැතිව එළඹී ගිවිසුම හා එම මුල් ගිවිසුමට වැඩිමනත් අදාලව 2012.01.12 දිනැතිව අත්සන් කරන ලද ගිවිසුම 2017.10.19 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

   අදාල ව්‍යාපෘතිය 2010.01.01 දින ආරම්භ කර 2012.06.30 දින අවසන් කල යුතු බව 2009.12.31 අත්සන් කරන ලද ගිවිසුමේ පැහැදිලිව දක්වා ඇත.

ii. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් පහත තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

- ඩෙස්මි ආයතනය සමග ඇති කර ගන්නා ලද මෙම ගිවිසුම සහ එකඟතාවයන් ඇති වූයේ කෙසේද යන්න පිළිබඳ වාර්තාව **ඇමුණුම 11** යටතේ ඇතුළත්ව ඇත.
- මෙම ව්‍යාපෘතිය සඳහා පසුබිම සැකසුනේ කෙසේද පිළිබඳ වාර්තාව **ඇමුණුම 12** යටතේ ඇතුළත්ව ඇත.

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 13)**

## 03. <u>බඩල්ගම ව්‍යාපෘතිය</u>

සමාගම සතු නාරාහේන්පිට කර්මාන්තශාලාව බඩල්ගම වෙත ගෙන යාමේ ව්‍යාපෘතිය සඳහා 2013 ජුනි 05 දිනැති අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් ඩෙස්මි කොන්ට්‍රැක්ටින් ඒජන්සීස් ආයතනය සහ බොක්කාර්ඩ් ෆුඩ් ෆර්මා ආයතනය ඇගැයීමකට ලක් කිරීමේදී බොක්කාර්ඩ් ෆුඩ් ෆර්මා ආයතනය වඩාත් වාසි සහගත වුවද එහිදී ඩෙස්මි කොන්ට්‍රැක්ටින් ඒජන්සීස් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබීම ගැටලු සහගත බව හා යම් යම් හේතු පදනම් කර ගනිමින් 2015.03.04 මෙම ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කර තිබුනද, නැවතත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015.04.23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබීම ද ගැටලු සහගත බැවින් ඒ සම්බන්ධව කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් කරුණු විමසන ලදී.

මෙම ණය ගිවිසුම මහා භාණ්ඩාගාරය සමඟ ඇති කර ගත් ගිවිසුමක් බවත්, සමාගම සමඟ ඇත්තේ ප්‍රති ණය ගිවිසුමක් බවත් සමාගමේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

<u>**නිර්දේශ**</u>

i. සමාගම විසින් ලාභ උපයන ආකාරය පිළිබඳවත්, එයින් භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු ණය ප්‍රමාණය ගෙවීමට කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳවත් වන ව්‍යාපාර සැලැස්මක් මාසයක් ඇතුළත අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.

ii. මෙම ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කිරීමටත් මසක් ඇතුළත නැවත අනුමැතිය ලබා දීමටත් හේතු වූ කරුණු සාධාරණීකරණය කරමින් සකස් කරන ලද වාර්තාවක් කාරක සභාව වෙත මාසයක් ඇතුළත ඉදිරිපත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

i. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් බඩල්ගම ව්‍යාපෘතිය සම්බන්ධ කමිටු වාර්තාවට ඇතුළත් කරන ලද ව්‍යාපාර සැලැස්මේ පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ii. නාගරික සංවර්ධන ආයතනය මැදිහත්ව සිදු කරනු ලබන වැඩපිළිවෙල යටතේ කර්මාන්තශාලාව ඉවත් කල යුතුව තිබූ බවත්, අදාල කැබිනට් සංදේශයන් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මිල්කෝ සමාගමේ දායකත්වයක් නොමැති බවත් හා මේ සම්බන්ධ තොරතුරු මිල්කෝ ආයතනය සතුව නොමැති බවත් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 04. <u>යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය - පොළොන්නරුව</u>

පොළොන්නරුව කර්මාන්ත ශාලාවේ සවි කරන ලද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව රු.මිලි. 104ක් වැය කරමින් 2011 දී මිලදී ගත් යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය මේ දක්වාම භාවිතයට නොගැනීමට හේතුව සහ මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්

කවුද යන්න පිළිබඳවත්, ඔවුන්ට විරුද්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද යනන් පිළිබඳවත් කාරක සභාව විමසන ලදී.

මෙම යන්ත්‍රය මිලදී ගැනීමේ තීරණය පැරණි අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනු ලබන තීරණයක් බවත්, එම යන්ත්‍රය ගෙන්වනු ලැබූ සමාගම මේ වන විට අසාධු ලේඛනගත කර ඇති බවත් සමාගමේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

පහත සඳහන් වාර්තා මාසයක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

i. මෙම යන්ත්‍රය මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබා ගෙන තිබේද?
ii. එසේ නොමැති නම් එම තීරණය ලබා ගෙන ඇත්තේ කෙසේද?
iii. යන්ත්‍රය මිලදී ගැනීමට මිල කැඳවීම් කර තිබුණාද?
iv. ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර තිබේද? ඒ කෙසේද?
v. මෙම යන්ත්‍රය භාවිතා කර යෝගට් නිෂ්පාදය කිරීම සඳහා යෝජනා පත්‍රයක් සකස් කර ඇත්නම් එම යෝජනා පත්‍රය
vi. එම යන්ත්‍රයේ අවශ්‍යතාවය පිළිබඳව ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කර ඇත්නම් එම ශක්‍යතා අධ්‍යයන වාර්තාව
vii. මේ වන විට එම යන්ත්‍රයේ අවශ්‍යතාවය නැති වූයේ කෙසේද?

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් පහත කරුණු කාරක සභාව වෙත වාර්තා කර ඇත.

i. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් මේ සඳහා අනුමැතිය ලබා දී ඇති බව කාරක සභාවට වාර්තා කර ඇති නමුත් ඒ සඳහා අනුමැතිය හිමි වූ බවට සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඇතුළත් ලේඛනය කාරක සභාව වෙත ඉදිරිපත් කර **නොමැත.** මේ සම්බන්ධයෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කිරීමේදී පහත තොරතුරු අනාවරණය විය.

- ආයතනයේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම සඳහා වූ යෝජනාවලියක් 2010.06.28 දිනැතිව කොළඹ කර්මාන්ත ශාලාවේ කළමනාකරු විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.**(ඇමුණුම 14)**
- එම යොජනාවලිය 2010.10.08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාරයේදී සාකච්ඡාවට භාජනය කර ඇති අතර එහිදී තීරණය වී ඇත්තේ එම යෝජනාව තාක්ෂණික කමිටුවට යොමු කිරීමට හා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට පමණි. **(ඇමුණුම 15)**
- ඒ අනුව 2010.10.12 දින අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර අමාත්‍යාංශය විසින් 2010.10.15 දින දන්වා එවා ඇත්තේ "ලිපියේ සඳහන් පරිදි දැනටමත් ඔබ ආයතනය විසින් අදාල යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කර ඇති බව පෙනී යන බවත් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

සංග්‍රහයට අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව කටයුතු කර ගෙන යාමට අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නොමැති බවත් දන්වා ඇත". **(ඇමුණුම 16)** එනම් අදාල ඉල්ලීම් ලිපිය අමාත්‍යාංශය වෙත යොමු කරන විටත් ප්‍රශ්නගත යන්ත්‍රය මිලදී ගැනීමේ කටයුතු කරමින් සිට ඇති බව සනාථ වේ. මෙම තත්ත්වය අදාල යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ලංසුකරුවන්ට ආරාධනා කරමින් ඉදිරිපත් කර ඇති දැන්වීම මගින් ද සනාථ වේ. එනම් එම දැන්වීම ප්‍රසිද්ධියට පත් කර ඇත්තේ 2010 ජූලි මාසයේදීය. **(ඇමුණුම 17)**

- මේ සම්බන්ධයෙන් 2010.11.30 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදීද සාකච්ඡාවට ලක්ව ඇත.
- 2010.11.30 දිනැති ටෙන්ඩර් මණ්ඩල වාර්තාව මගින් රු. 90,814,499.99ක (බදු රහිත) මුදලකට M/s Industrial Stainless Steel Fabrications (Pvt) Ltd ආයතනය වෙතින් යෝගට් සෑදීමේ යන්ත්‍රය මිලදී ගැනීමට නිර්දේශ කර ඇත. **(ඇමුණුම 18)**

එනම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වූ බවට සඳහන් කර ඇතත් ඉදිරිපත් කර ඇති ලේඛන මගින් මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්හි සාකච්ඡාවට ලක්ව ඇතත් ඒ සඳහා අනුමැතිය හිමි වූ බව නිරීක්ෂණය නොවේ.

ii. වාර්තා කර නොමැත.

iii. යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ලංසුකරුවන්ට ආරාධනා කරමින් ඉදිරිපත් කර ඇති දැන්වීම **ඇමුණුම 17** යටතේ දැක්වේ.

iv. ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත්තේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් බව වාර්තා කර ඇත.

v. මෙම යන්ත්‍රය භාවිතා කර යෝගට් නිෂ්පාදය කිරීම සඳහා යෝජනා පත්‍රයක් සකස් කර නැත.

vi. එම යන්ත්‍රයේ අවශ්‍යතාවය පිළිබඳව ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කර නැත.

vii. අත්හිටුවා තිබූ ආයතනයේ නවීකරණ කටයුතු නැවත ක්‍රියාත්මක කිරීමෙන් පසු ප්‍රශ්නගත යන්ත්‍රයට වඩා වැඩි ධාරිතාවක් සහිත වූ නව යන්ත්‍ර සූත්‍ර ස්ථාපනය කල නිසා උක්ත යන්ත්‍රයේ අවශ්‍යතාවයක් නොමැති බව වාර්තා කර ඇත.

## 05. <u>යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීම</u>

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුව, වටිනාකම රු. මිලි. 50 ඉක්මවන හා රු.මිලි. 100 - 200 අතර කොන්ත්‍රාත් විවෘත මිල ගණන් කැඳවා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් ක්‍රියාත්මක කළ යුතුව තිබුනද, එසේ නොමැතිව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් කැඳවා සමාගමේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කර තිබීම හේතුවෙන් සමාගමට අලාභ සිදු වී තිබීම.

මෙම සිදුවීම් වලට සම්බන්ධ කිසිදු නිලධාරියෙක් දැනට සමාගමේ නොමැති බවත්, අදාළ පරීක්ෂණ කටයුතු දැනට FCID හරහා සිදු වන බවත්, මේ වන විට එවැනි අවිධිමත් ප්‍රසම්පාදන කටයුතු සිදු නොවන බවත් සමාගම් සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ</u>

i. අදාළ මිලදී ගැනීම් සිදු කිරීමට අදාළ ගොනුව සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සති දෙකක් තුළදී කාරක සභාව වෙත ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ පමණක් ආයතනය මගින් ඉදිරිපත් කල බවත්, මිලදී ගැනීම සම්බන්ධ කටයුතු සිදු කරන ලද්දේ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවෙන් බවත් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

**06.** <u>මහජන පැමිණිලි</u>

i. <u>ඉංජිනේරු අධිකාරි තනතුර</u>

ඉංජිනේරු අධිකාරී තනතුරට බඳවා ගැනීම සම්බන්ධව අවශ්‍ය සුදුසුකම් ගැන කාරක සභාවේ අවධානය යොමු විය.

ii. <u>මානව සම්පත් හා පිරිස් පරිපාලන කළමනාකරු - විමල් රාජපක්ෂ මහතා විසින් සිදුකරන ලද විෂමාචාර</u>

අදාළ නිලධාරියා කමිටු රැස්වීමට සහභාගී වී තිබූ බැවින් ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා නොකරන ලදී.

<u>නිර්දේශ</u>

i. මෙම මහජන පැමිණිලි අමාත්‍යාංශ ලේකම් වෙත යැවීම.

ii. මෙම මහජන පැමිණිලි සම්බන්ධව විමර්ශනයක් සිදු කර මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාවේ ඉහත නිර්දේශ අනුව කටයුතු කර ඇති අතර ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/03/03/11 හා 2017.10.19 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන මගින් පහත කරුණු අනාවරණය වේ.

i. ඩබ්ලිව්.ඒ.ප්‍රියංකර මහතා ඉංජිනේරු විධායක IV (අධිකාරි ඉංජිනේරු IV) ලෙසට ලබා දී ඇති උසස්වීම නීත්‍යානුකූල නොවන බවට අමාත්‍යාංශය විසින් සිදු කරන ලද විමර්ශනයේදී කරුණු අනාවරණය වී ඇති බව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MRE/02/09/12/COPE හා 2017.09.14 දිනැති ලිපිය මගින් මිල්කෝ ආයතනයේ සභාපති වෙත දන්වා යවා ඇත. **(ඇමුණුම 19)**

ඒ අනුව මේ පිළිබඳ විමර්ශනය කර මෙම කරුණ නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කර ගනු ලැබූ ක්‍රියාමාර්ග වාර්තා කරන ලෙස මිල්කෝ ආයතනයේ සභාපති වෙත එමගින් වැඩිදුරටත් දන්වා ඇත.

නමුත් මෙම උසස්වීම ලබා දීම සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් මිල්කෝ ආයතනය මගින් ගෙන නොමැති අතර එම සිදුවීම සම්බන්ධයෙන් කණගාටුව පල කරමින්, ඉදිරියේදී නිසි පටිපාටියෙන් පරිබාහිරව උසස්වීම් ලබා නොදීමට වග බලා ගන්නා බව කාරක සභාව වෙත වාර්තා කර ඇත. **(ඇමුණුම 20)**

ii. මානව සම්පත් හා පිරිස් පරිපාලන කළමනාකරු - විමල් රාජපක්ෂ මහතා විසින් සිදු කරන ලද විෂමාචාර සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමෙන් සිදු කරන ලද පරීක්ෂණයට අමතරව මිල්කෝ ආයතනය විසින් මූලික විමර්ශනයක් පවත්වා ඇති බවත් ඒ අනුව විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කර ඇති බවත් මිල්කෝ ආයතනයේ සභාපති විසින් දන්වා එවා ඇත. **(ඇමුණුම 21)**

***2017 අගෝස්තු 11 දින කාරක සභා රැස්වීමේදී ඉදිරිපත් වූ කරුණු අනුව, 2014 ජූලි 22 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ගෙන ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව, වර්ෂ 2011/12ට සාපේක්ෂව 2012/13 හි විකුණුම් ආදායම 21%කින් ඉහළ ගිය නමුත් බෙදාහැරීමේ පිරිවැය 109%කින් ඉහළ යාම සාධාරණ නොවන බව කමිටුව අවධාරණය කර, බෙදාහැරීමේ වියදම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගිණුම් නිලධාරියාට/ ගිණුම් නිලධාරියාට නියෝග කර ඇතත්, මේ දක්වා එම වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා එවකට මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරනු ලැබූ සහ දැනට මෙම කරුණ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් අද දින මෙම කාරක සභාව හමුවට කැඳවනු ලැබූ බව කාරක සභාවේ සභාපති විසින් අරමුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කරන ලදී.***

## 01. <u>බෙදාහැරීමේ වියදම් වාර්තාව</u>

අද දින කාරක සභාවට ඉදිරිපත් කරන ලද මෙම වාර්තාව 2014 වර්ෂයේ ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, එය මේ දක්වා ප්‍රමාද වීමට හේතු කාරක සභාව විසින් විමසන ලදී.

සලකා බලනු ලබන තොරතුරු වල යම් යම් අඩු පාඩු පැවැති බැවින් එය මේ දක්වා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීමට හේතු විය හැකි අතර, ඉදිරිපත් කරන ලද නව වාර්තාවේ අඩංගු සංඛ්‍යා ලේඛනවල නිරවද්‍යතාවය සම්බන්ධව සෑහීමටකට පත් විය හැකි නමුත්, මෙම වාර්තාවේද යම් යම් අඩුපාඩු පවතින බවත් ඒවා නිවැරදි කර සම්පූර්ණ නිවැරදි වාර්තාවක් සකසන බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

## 02. <u>Head Office Free Issues & Free Issues for Sales Promotion Purpose</u>

මෙම බෙදාහැරීම් වියදම් වාර්තාවේ ඇමුණුම් අංක 01හි Head Office Free Issues ලෙස රු.8,662,295.32/-ක මුදලක් සහ ඇමුණුම් අංක 05හි Free Issues for sales promotion

Purpose ලෙස රු. 41,463,719/-ක මුදලක් වෙන වෙනම පෙන්වා දී තිබීම පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

වර්ෂ 2012දී ප්‍රමිතියෙන් ඉහළ UHT කිරි පැකට් වෙළඳ පොළට හඳුන්වා දීම සිදු කරනු ලැබූ අතර, මෙම නිෂ්පාදනය මහජනයා අතර ප්‍රචලිත කිරීම සඳහා බෙදා හැරීම් මධ්‍යස්ථාන හා ප්‍රාදේශීය කළමනාකරුවන් හට, පෙට්ටි 25ක් මිලදී ගැනීමේදී වට්ටමක් ලෙස පෙට්ටි 02ක් නොමිලේ ලබා දී තිබීමේ පදනම අනුව ඇති වූ මෙම ගනුදෙනු ඉහත පරිදි සටහන් කර ඇති බවත්, එය සමාගම් සභාපතිගේ අනුමැතිය සහිතව සිදු කර ඇති බවත් සමාගමේ අලෙවි කළමනාකරු විසින් පැහැදිලි කරන ලදී.

බෙදාහැරීම් වියදම් වාර්තාවේ වෙසක් උත්සව වියදම් ලෙස සටහන් කර ඇත්තේ කුමන ආකාරයේ වියදම්ද යන්න කාරක සභාව විමසීම් කරන ලදී.

සමාගමේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා වර්ෂ 2012 දී සමාගම විසින් සංවිධානය කරන ලද වෙසක් දන්සැල් සඳහා ලබා දුන් නිෂ්පාදන වෙනුවෙන් දරන ලද වියදම එලෙස සටහන් කර ඇති බව සමාගමේ අලෙවි කළමනාකරු විසින් කරුණු පැහැදිලි කරන ලදී.

## 03. <u>Sales Promotion Expenses</u>

මෙම බෙදාහැරීම් වියදම් වාර්තාවේ ඇමුණුම් අංක 01හි Sales Promotion Expenses ලෙස රු.7,407,994.36ක් දක්වා තිබීම.

Head Office Free Issues සහ Sales Promotion Expenses දෙකම එක්ව ගත් කළ UHT නිෂ්පාදන සඳහා රු.මිලි. 8.2ක්, යෝගට් සඳහා රු.මිලි. 3.7ක්, උකු කිරි සඳහා රු.250,000/-ක් සහ අයිස් ක්‍රීම් සඳහා රු.මිලි.2ක ප්‍රවර්ධන වියදම් දරා ඇති බව සමාගමේ අලෙවි කළමනාකරු විසින් කරුණු පැහැදිලි කරන ලදී.

## 04. <u>කරුණු සනාථ කිරීම</u>

මෙම බෙදාහැරීම් වියදම් වාර්තාවේ සඳහන් සියලු කරුණු කාරක සභා අවස්ථාවේදී සනාථ කර ගැනීම අපහසු බැවින් එම කරුණු සනාථ කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව කාරක සභාව අවධානය යොමු කරන ලදී.

මෙම බෙදාහැරීම් වියදම් වාර්තාව සකස් කිරීම සඳහා පාදක කර ගනු ලැබූ සියලු සංඛ්‍යා ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සහ අදාළ වියදම් කිරීම සඳහා බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම විධිමත් ආකාරයෙන් සිදු වී තිබේද යන්න පරීක්ෂා කර, එම සියලු විස්තර ඇතුළත් වන පරිදි සකස් කරන ලද විස්තරාත්මක වාර්තාවක් (තීරණවලට පදනම් කර ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ, සභාපතිගේ නියෝග යනාදී ලේඛන තහවුරු සමග) විගණකාධිපතිටද පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශ**</u>

i. ඉදිරිපත් කරන ලද මෙම විස්තරාත්මක වාර්තාව නැවත පරීක්ෂා කර අවසාන වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් වෙත හා මිල්කෝ පුද්ගලික සමාගමේ සභාපති වෙත නියෝග කිරීම.

ii. ඉදිරියේදී මෙවැනි ගනුදෙනු ක්‍රමවත් කිරීමේ ක්‍රමවේදයක් පිළියෙල කිරීමට විගණකාධිපති වෙත නියෝග කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ඉහත නිර්දේශ i මගින් ඉල්ලා ඇති වාර්තාව කාරක සභාව වෙත2018.03.31 දින වන විටත් ඉදිරිපත් කර නොමැත.

**05. <u>හිටපු මූල්‍ය පාලක නිලධාරීගේ නොපැමිණීම</u>**

එවකට මූල්‍ය පාලක ලෙස කටයුතු කරනු ලැබූ එම්.සී.මඩුගල්ල මහතා 2017 අගෝස්තු මස 22 දින කාරක සභාව හමුවට කැඳවා තිබියදීත් කාරක සභා රැස්වීමට නොපැමිණීම.

**<u>නිර්දේශ</u>**

i. එම්.සී.මඩුගල්ල මහතා හට 2017 සැප්තැම්බර් මස 06 වන දින ප.ව.02.00ට කාරක සභාව හමුවට ඉදිරිපත් වන ලෙස දන්වා යැවීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාවේ ඉහත නිර්දේශ පරිදි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් කටයුතු කර ඇත.

***2017 අගෝස්තු 11 දින කාරක සභා රැස්වීමේදී ඉදිරිපත් වූ කරුණු අනුව, 2014 ජූලි 22 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ගෙන ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව, වර්ෂ 2011/12ට සාපේක්ෂව 2012/13 හි විකුණුම් ආදායම 21%කින් ඉහළ ගිය නමුත් බෙදාහැරීමේ පිරිවැය 109%කින් ඉහළ යාම සාධාරණ නොවන බව කමිටුව අවධාරණය කර, බෙදාහැරීමේ වියදම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරිට/ ගණන් දීමේ නිලධාරිට නියෝග කර ඇතත්, එතෙක් එම වාර්තාව ඉදිරිපත් කර නොමැති බැවින් ඒ සම්බන්ධව එවකට මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරනු ලැබූ සහ දැනට මෙම කරුණ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් 2017 අගෝස්තු 22 දින ප.ව.02.00 ට මෙම කාරක සභාව හමුවට කැඳවීමට තීරණය කරන ලදී.***

***එහිදී අමාත්‍යාංශ ලේකම් විසින්, එවකට ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස කටයුතු කරන ලද එම්.සී.මඩුගල්ල මහතාද 2017.08.22 දින කාරක සභාව හමුවට කැඳවා ඇතත් ඔහු එදින නොපැමිණි බැවින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මහතාගේ උපදෙස් පරිදි, එහි ලේකම් විසින්, මෙම නිලධාරියා නැවත 2017 සැප්තැම්බර් මස 06 වන දින ප.ව.02.00 ට කාරක සභාව හමුවට කැඳවීය. ඒ අනුව ඔහුගේ පුද්ගලික ලිපිනයට යවන ලද කැඳවීම් ලිපිය, එම ලිපිනයෙහි එවැනි පුද්ගලයෙකු පදිංචි වී නොමැති බව සඳහන් කරමින් ආපසු ලේකම් කාර්යාලය වෙත ලැබී ඇති බව කාරක සභාවේ සභාපති විසින් කාරක සභාව හමුවේ කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කරන ලදී.***

***මිල්කෝ ආයතනයේ සභාපති වෙතින් කාරක සභා ලේකම් කාර්යාලය විසින් 2017.08.31 දිනැති ලිපියෙන් ලබා ගත් එම්.සී.මඩුගල්ල මහතාගේ පුද්ගලික දුරකථන***

***අංකයට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් ඇමතීම් කිරීමේදී ඔහු විසින් තමා මඩුගල්ල මහතා බව පිළිගනිමින් දැනට පදිංචිව සිටින්නේ නුවර බව පවසා කථා කරගෙන යන අතරතුරදී ඇමතුම විසන්ධි කර ඇති අතර, 2017 සැප්තැම්බර් මස 06 වන අද දිනද කාරක සභාව හමුවට පැමිණ නොමැත.***

<u>**නිර්දේශ**</u>

මිල්කෝ ආයතනයේ හිටපු මූල්‍ය පාලක නිලධාරී එම්.සී.මඩුගල්ල මහතා විසින් පාර්ලිමේන්තුවට වගකීමේ භාරදූර කාර්යය පැහැර හැරී ඇති බැවින්,

i. එම්.සී.මඩුගල්ල මහතා දූරකථන අංකය සහ කාරක සභාව සතුව ඇති පුද්ගලික ලිපිනය පිළිබඳ තොරතුරුද සහිතව මෙම කරුණ සම්බන්ධව පොලිස්පති වෙත කරුණු වාර්තා කිරීම.

ii. එහි පිටපත් නියෝජ්‍ය පොලිස්පති (බස්නාහිර/දකුණ), ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී(නුගේගොඩ) සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (පාර්ලිමේන්තු කොට්ඨාශය) වෙත ලබා දී ඔහුව 2017 සැප්තැම්බර් මස 19 වන දින ප.ව.02.00 ට කාරක සභාව හමුවට කැඳවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් කාරක සභා සභාපති විසින් කාරක සභාවේ ලේකම් වෙත නියෝග කරන ලදී.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් කාරක සභාවේ ඉහත නිර්දේශ පරිදි කටයුතු කර ඇත.

**ඇමුණුම 09**

No. **MLRCD/03/05/2011-70**

## Ministry of Livestock and Rural Community Development

## CABINET MEMORANDUM

## Modernization of Processing Factories of MILCO Pvt Ltd

### Introduction

Milk Industries Pvt Ltd (MILCO) is a fully government owned company coming under the purview of the Ministry of Livestock and Rural Community Development. This institute has involved in locally produced milk procurement, processing and marketing of various milk products such as milk powder, pasteurized milk, sterilized milk, yoghurt, ice cream, butter, ghee under the "Highland" and has become the leading brand in Sri Lanka since its operation. MILCO Pvt Ltd has four processing factories in Colombo, Ambewela, Digana and Polonnaruwa.

In achieving the target of self sufficiency in local milk production by the year 2015 under the "Mahinda Chintana" program Milco Pvt Ltd is expected to expand its operations to enhance the local dairy industry in Sri Lanka. In this context, it is necessary to increase the processing capacity in the above said processing factories, to handle the incremental milk production of the country and to meet the consumer demand as well. The machineries and equipments in said factories are more than 40 years old and due to this fact the efficiency of production is adversely affected. The strategy proposed to resolve this issue on earlier occasions was to replace these old machineries and equipments with more advanced modern technology.

Various attempts were made to receive funds to meet the cost of the modernization process of these factories. Meantime, a proposal has been made to the Ministry of Finance with a copy to the then Ministry of Livestock Development by DESMI Contracting, a Danish Company offering a financing package along with a project proposal for rehabilitation and modernization of these four factories and twenty collecting centers with a cost of € 36.97 Millions. (Annexure 01)

A Cabinet Paper was submitted by the Ministry of Livestock Development on 02.12.2008 (Annexure 02) to the Cabinet and requesting to appoint a Cabinet Appointed Negotiation Committee (CANC) and a Technical Evaluation Committee. (TEC which was later converted to Project Committee and hereafter referred as PC elsewhere in this paper). The approval for appointing of CANC and PC was granted on 03.12.2008 (Annexure 03). Meantime, the DESMI Contracting A/S informed through KFW- IPEX Bank to the Ministry of Finance and Planning that overall contract value has increased to € 48.6 Millions due to extra capacity and equipment. (Annexure 04) The CANC and PC had evaluated and negotiated this project proposal and recommended to amend the budget of the proposal to € 39.1 Millions. This was informed to the Chairman MILCO Pvt Ltd by the Secretary of Ministry of Livestock Development.

ʼrdingly, a Cabinet Paper (Annexure 05) was submitted for seeking an approval for,

1. Accept the revised proposal and offer the contract to the DESMI Contracting A/S,
2. Direct External Resources Department to negotiate the interest rate with the credit line (KFW, IPEX-Bank, Germany) and obtain loan facility,
3. Make provisions in the annual budgets in the years 2009 and 2010 to absorb the foreign funds,
4. Entrust the DESMI Contracting A/S to modernize four factories on 08.04.2009 and approval was granted on 06.05.2009. (Annexure 06).

)n 11.11.2009 another Cabinet Paper was submitted to the Cabinet for the approval to,

1. Offer the contract to DESMI Contracting A/S and enter into a financial agreement,
2. Direct the Department of External Resources of the Ministry of Finance and Planning to enter into a credit agreement with the HSBC bank to finance this project.

ʌn approval was granted for the above Cabinet Paper on 18.11.2009. (Annexure 07)

abinet Paper produced on 23.11.2009 (Annexure 08) was sought approval to,

1. Direct the Ministry of Finance and Planning to enter into a contract with DESMI Contracting A/S ,
2. Direct the Department of External Resources of the Ministry of Finance and Planning to enter into a credit agreement with the HSBC bank,
3. Give approval to the Ministry of Finance and Planning to release the loan amount to MILCO Pvt Ltd on long term concessional basis and sign an agreement between two parties.

:abinet approval was granted for the above Cabinet Paper subjected to the amendment of the item number 1, on 25.11.2009 (Annexure 09).

[aving received the Cabinet approval for the project, the contract agreement was signed between MILCO vt Ltd and DESMI on 31.12.2009 (Annexure 10).

[owever, there had been delays to commence the project until mid 2010 and when I assumed the office as ⁄linister of Livestock and Rural Community Development; I have noted the following reasons for the delay f the commencement of the project. They are as follows,

1. Narahenpita factory has to be relocated as many hospitals are coming up to the surroundings
2. Shortage of locally produced milk and,
3. At this time another proposal has come to the MILCO Pvt Ltd, to have UHT plants

'he cost for modernization was € 39.1 Millions and this sum of money was a huge investment. It would be a urden to MILCO Pvt Ltd in paying back. At the same time the milk for the factories when they get ɩodernized is not sufficient to meet their capacities and therefore, there is a risk of idling of machines when ɩey have been commissioned. Because of the introduction of UHT plants to MILCO Pvt Ltd, some of the :quirements have been changed and the project has to be adjusted accordingly.

## Proposal

Subsequently, MILCO Pvt Ltd was requested to submit a proposal to ensure the required fresh milk available to meet the demand of the increased capacity of the newly refurbished facility. Accordingly, MILCO officials discussed with DESMI personnel for submission to this effect. The DESMI Contacting A/S would include a financial package to establish dairy farms to provide 120,000 liters of fresh milk per day to meet the demand. According to the new proposal the cost on refurbishing of Colombo plant, provision of UHT to Digana, milk collection centers had been deleted. As a result of these amendments the total cost of the project has been reduced from € 39.1 to € 33.7 Millions. (Annexure 11)

In view of these changes, that will fulfill our requirement to make our country self – sufficient in locally produced milk and dairy produce. The new proposal has enhanced the scope of undertaking this venture, with favourable results.

As the Minister of Livestock and Rural Community Development, I am in favour for this proposal.

## Recommendation

An approval of members of Cabinet is sought for,

1. Adhere to the revised project proposal submitted by the DESMI Contracting A/S,
2. Implement the project proposal by reducing the value of deleted items (UHT plants and collection centers) of the initial project proposal, and
3. Implement the project as it had undergone the CANC procedures and no change taken place except financial part in the project proposal.
4. To entrust the same CANC to proceed and finalize the revised project proposal.

**Arumugan Thondaman**
**Minister of Livestock and Rural Community Development**

Ministry of Livestock and Rural Community Development
45, St. Michael's Road
Colombo 03
3rd Day of August, 2011

**ඇමුණුම 10**

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
පශු සම්පත් හා
ග්‍රා.ප්‍ර.සං./ලේ.
ආර්ථික සංවර්ධන/ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/12/1141,
2012 අගෝස්තු මස 23 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

RECEIVED
27 AUG 2012

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ**
**පිරිසැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම**

(මුදල් හා ක්‍රමසම්පාදන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-08-14 දිනැති සංදේශය)

2012 අගෝස්තු මස 15 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ඇ) පරිපූරක න්‍යාය පත්‍රයේ විෂයයන්:**

50. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/1141/504/104 වූ, "**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ පිරිසැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම**" යන මැයෙන් මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-08-14 දිනැති සංදේශය - (අමප අංක 12/0375/511/007 පිළිබඳව වූ 2012-05-03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ) සංදේශයේ 6 වන ඡේදයේ සඳහන් (අ), (ආ) සහ (ඇ) යෝජනා සඳහා අනුමැතිය දෙන ලදී. මෙම ව්‍යාපෘතිය, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ, සීමාසහිත මිල්කෝ (පෞද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන බැව් අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

ක්‍රියා කළයුතු: **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

පිටපත්: **පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් යාකොට ඇත.
**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් යාකොට ඇත.

Certified true copy.

W.M.D.J.Fernando
Additional Secretary
Office of the Cabinet of Ministers
Sir Baron Jayathilake Mawatha
Colombo-01

**<u>ඇමුණුම 11</u>**

<u>අභ්‍යන්තර මැමය</u>

2017 සැප්තැම්බර් 29

සභාපතිතුමනි,

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමසීම් - කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය ගිවිසුම හා එකඟතාවන් ඇති වූ ආකාරය:</u>**

පසුගිය අගෝස්තු 11 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අපගෙන් විමසන ලද කරුණු අතරින් උක්ත කරුණ සම්බන්ධව තොරතුරු මෙසේ ඉදිරිපත් කරමි.

ඩෙස්මි කන්ට්‍රැක්ටින් සමාගම විසින් ඉදිරිපත් කර ඇති "කර්මාන්තශාලා නවීකරණ යෝජනාව" අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බැවින් එම යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී සමාගම සමග ඇටෝර්නි ජෙනරාල්වරයාගේ අනුමැතිය ඇතිව සකස් කර ඇති ගිවිසුමකට එළැඹෙන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දෙන ලද දැනුම් දීම අනුව සමාගමේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා විසින් අදාළ ගිවිසුම 2009 දෙසැම්බර් 30 දින අත්සන් තබා ඇත.

එසේ වුවද, අත්සන් තබන ලද ගිවිසුම තවදුරටත් ක්‍රියාත්මක වී නැත. නැවත 2012 වර්ෂයේදී යෝජනාවලියෙන් ඇතැම් කොටස් ඉවත් කිරීමේ එකඟතාවකට අත්සන් කර තිබේ. එසේ ඉවත් කර ඇති කොටස් පහත පරිදි වේ.

- කොළඹ කිරි කර්මාන්තශාලාව නවීකරණය කිරීම
- දිගන කිරි කර්මාන්තශාලාවේ යූ.එච්.ටී. කිරි සැකසුම් යන්ත්‍රය ස්ථාපනය කිරීම
- කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වූ සියලු නවීකරණ යෝජනා

මෙසේ කොටස් ඉවත් කිරීම නිසා මුලු ව්‍යාපෘතියේ වියදම් ඇස්තමේන්තුව යූරෝ මිලියන 6 කින් පමණ අඩු වී ඇත. එසේ වුවද, එම ඉවත්කිරීම සම්බන්ධ තාක්ෂණික විශ්ලේෂණයක් සිදු කර ඇති බවක් දක්නට නොලැබේ. තවද, ඉහත පරිදි කොටස් ඉවත් කිරීම නිසා ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ සැළසුම් අවුල් සහගත වී තිබුනු බව ද එය ක්‍රියාත්මක කිරීමේදී දක්නට ලැබිණි. (උදාහරණයක් වශයෙන් කොළඹ කිරි කර්මාන්තශාලාව නවීකරණය කරමින් එයින් ඉවත් කරන ඇතැම් උපකරණ වෙනත් කර්මාන්තශාලාවන්හි ඉදිකිරීම් සඳහා යොදාගැනීමට මුල් යෝජනාවේ කර තිබුනු සැළසුම් ව්‍යර්ථ වීම නිසා ඇතැම් උපකරණ මිල දී ගැනීමට මිල්කෝ සමාගමට සිදු විය.)

සුදත් මුණසිංහ
සාමාන්‍යාධිකාරී

<u>**ඇමුණුම 12**</u>

<u>අභ්‍යන්තර මැමය</u>

2017 සැප්තැම්බර් 29

සභාපතිතුමනි,

<u>**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමසීම් - කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය**</u>

<u>**ඒ සඳහා පසුබිම සැකසුණු ආකාරය:**</u>

පසුගිය අගෝස්තු 11 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අපගෙන් විමසන ලද කරුණු අතරින් උක්ත කරුණ සම්බන්ධව තොරතුරු මෙසේ ඉදිරිපත් කරමි.

එවකට සමාගම සතුව පැවැති කර්මාන්තශාලා හතර (කොළඹ, දිගන, අඹේවෙල සහ පොළොන්නරුව) නවීකරණය කිරීම සඳහා ඩෙන්මාර්ක සමාගමක් වූ සීමාසහිත ඩෙස්මි කොන්ට්‍රැක්ටින් විසින් ඉදිරිපත් කර තිබුනු යෝජනාවලියක් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මිල්කෝ සමාගමේ සභාපතිවරයා වෙත දන්වා ඇත.

මෙම කමිටුවේ සභාපතිත්වය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු වූ එස්. ගාල්ලගේ නමැති අයකු වෙත පවරා ඇති අතර සාමාජිකයන් ලෙස මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයකු වූ ජේ. තල්පාවිල මහතා, පශු සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකවරයකු වූ ශූ. එස්. බණ්ඩාර මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආහාර තාක්ෂණය පිළිබඳ කථිකාචාර්යවරයකු වූ මහාචාර්ය ඒ. බමුණුආරච්චි මහතා සහ මිල්කෝ සමාගමේ කර්මාන්තශාලා කළමනාකාරවරයකු වූ එම්.ඒ.එස්. මූණසිංහ මහතා යන නිලධාරීන් පත් කර තිබේ.

උක්ත කමිටුව විසින් එම යෝජනාවලියේ පලදායීතාවය පිළිබඳ අගැයීමකට ලක් කරමින් සකස් කරන ලද වාර්තාවක් පශු සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත භාර දී ඇත.

ඩෙස්මි කොන්ට්‍රැක්ටින් සමාගම උක්ත යෝජනාවලිය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන්ගෙ ආරාධනයක් මතදැයි දැනගැනීමට තොරතුරු නැත.



සුදත් මූණසිංහ
සාමාන්‍යාධිකාරී

**ඇමුණුම 13**

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
கால்நடை வள மற்றும் கிராமிய சமூக அபிவிருத்தி அமைச்சு
**Ministry of Livestock and Rural Community Development**

Our Ref: MLRCD/03/05/2011-70

20/12/2011

**Mr.Sunil Wickramasinghe**
**Chairman,**
**Milco (Pvt) Ltd**
**Colombo – 05**

**Cabinet Paper No: 11/1606/511/028 Memorandum dated 03.08.2011 by the Ministry of Livestock and Rural Community Development.**

Further to our letter dated 29th November 2011 on the above subject. Herewith once again I am forwarding a copy of the decision of the above Cabinet Memorandum.

Please make early arrangementsto implement same.

**Dr. K.M.T.Kendaragama**
**Secretary**

Copies to:

1. Additional Secretary (Livestock Development)
2. Chief Accountant - MLRCD

D:\Karthy 2\New Letters.doc

P.O. Box No. 562, No. 45, St. Michael's Road, Colombo 3
Tel:+ 94 11 2541369 Fax: + 94 11 2328117
E-mail - mlrcd@yahoo.com

රහසිගතයි.

**පිටපත්:** ජනාධිපති ලේකම්. අග්‍රාමාත්‍ය ලේකම්. මුදල් හා ක්‍ර./ලේ. විගණකාධිපති.

මගේ අංකය: අමප/11/2128/511/028-I
2011 දෙසැම්බර් මස 01 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

RECEIVED 05 DEC 2011

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්,

මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම මැයෙන් අංක 11/1606/511/028 හා 2011-08-03 දිනැති කැබිනට් පත්‍රිකාව

(පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2011-11-11 දිනැති සටහන)

2011 නොවැම්බර් මස 23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:**

**(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා:**

10. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/2128/511/028-I වූ, "මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම මැයෙන් අංක 11/1606/511/028 හා 2011-08-03 දිනැති කැබිනට් පත්‍රිකාව" යන මැයෙන් පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ඇමතිතුමා ඉදිරිපත් කළ 2011-11-11 දිනැති සටහන - (2011-08-24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ) ඉහත සටහන මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සමග සලකාබලන ලදුව, මෙකී නිරීක්ෂණවල අවසාන ඡේදයේ නියමකර ඇති (1), (2) සහ (3) කොන්දේසිවලට අනුව අමාත්‍යාංශය විසින් කටයුතු කිරීමට යටත්ව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශිත පරිදි, මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දෙන ලදී.

**ක්‍රියා කළයුතු:** පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

**පිටපත:** මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

(B) Agenda Items :

**(I) Cabinet Papers:**

10. Cabinet Paper No.11/2128/511/028-I, a Note to the Cabinet dated 2011-11-11 by the Minister of Livestock and Rural Community Development on "Cabinet Paper No.11/1606/511/028, a Memorandum dated 03.08.2011 by the Ministry of Livestock and Rural Community Development on Modernization of Processing Factories of MILCO (Pvt.) Ltd."- (Cabinet decision dated 2011-08-24 refers) the above Note was considered along with the observations of the Minister of Finance and Planning and subject to the conditions (1), (2) and (3) stipulated in the final paragraph of these observations, approval was granted to implement the project for modernization of Processing Factories of MILCO (Pvt.) Ltd. as recommended by the Cabinet Appointed Negotiating Committee (CANC).

Action by: My/Livestock and Rural Community Development - above observations annexed.
Copied to: My/Finance and Planning

# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: NPD/AG/CM/11/41
ඔබේ අංකය / உமது இல. / Your No.: 1/2520/511/020
දිනය / திகதி / Date: 2011.11.

අමාත්‍ය මණ්ඩල සටහන

<u>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ</u>

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය | : | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන |
| ශීර්ෂය සහ දිනය | : | මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම.<br><br>2011.11.11 |
| යෝජනාව/ඉල්ලීම | : | 2009.11.11 දිනැති අංක 09/2455/352/005-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ සාකච්ඡා සම්මුති කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශයන් ඇතුලත් වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අවධානය සඳහා ඉදිරිපත් කිරීම. |
| නිරීක්ෂණ | : | මිල්කෝ පුද්ගලික සමාගම සතු අඹේවෙල, කොළඹ, දිගන සහ පොළොන්නරුව යන කර්මාන්තශාලා හතර සහ කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන නවීකරණය කිරීමට, HSBC බැංකුව මගින් යූරෝ මිලියන 39.1 ක ණය මුදලක් ලබාගෙන ටෙස්ම් කන්ට්‍රැක්ටින් ආයතනය සඳහා කොන්ත්‍රාත්තුවක් ලබාදීමට අංක 09/2455/352/005-I සහ 2009.11.11 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය අපේක්ෂා කර තිබුණි. 2009.11.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පහත සඳහන් කොන්දේසි යටතේ අදාල ව්‍යාපෘතිය අනුමත කරන ලදී.<br><br>(1) ව්‍යාපෘතිය වාණිජමය ශක්‍යතාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමේ හැකියාව නවදුරටත් අධ්‍යයනය කර සමස්ත ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කළ යුතුය. |

(2) ව්‍යාපෘතියෙන් උපරිම ඵලදායීතාවයක් ලබාගත හැකි වන පරිදි ණය මුදල ආයෝජනය කිරීමට සුදුසු අංශ තෝරා ඒ සඳහා මුදල් යෙදවිය යුතුය.

ඒ අනුව, මිල්කෝ ආයතනය ඩෙස්මි ආයතනය සමග සාකච්ඡා කර කොළඹ කිරි සැකසීමේ කර්මාන්ත ශාලාව, දිගන කර්මාන්තශාලාව සඳහා UHT උපකරණ සැපයීම, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන නවීකරණය කිරීම යන කාර්යයන් ඉවත් කර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත අගය යුරෝ මිලියන 33.8 දක්වා අඩු කරන ලදී.

අංක 11/1606/511/028 සහ 2011.08.03 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සංශෝධිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කර තිබුණු අතර මෙම ව්‍යාපෘති යෝජනාව පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා දැනටමත් පත්කර ඇති තාක්ෂණ ඇගයීම් කමිටුව සහ සාකච්ඡා සම්මුති කමිටුව විසින්ම නව සංශෝධන පිළිබඳවද අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළයුතු බවට 2011.09.08 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දෙන ලදී.

දැනට මිල්කෝ ආයතනය සතු කර්මාන්තශාලා සහ උපකරණ අවුරුදු 40 කට වඩා පැරණි බැවින් සහ ඉදිරි වසර කිහිපය තුළදී වැඩිවන කිරි නිෂ්පාදනයට සාපේක්ෂව කිරි සැකසීමේ ධාරිතාව වැඩිකළ යුතු බැවින් මිල්කෝ ආයතනය සතු කර්මාන්තශාලා නවීකරණය කිරීම සුදුසු බවට සාකච්ඡා සම්මුති කමිටුව මගින් නිර්දේශ කර ඇත.

ඒ අනුව, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව යෝජිත ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීම සුදුසු වේ.

(1) ව්‍යාපෘතියේ වාණිජමය ශක්‍යතාවය කර්මාන්තශාලාවට ලැබෙන කිරි ප්‍රමාණය මත පදනම්වන බැවින්, නව කර්මාන්තශාලාවට ප්‍රමාණවත්වන පරිදි කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මිල්කෝ ආයතනය පියවර ගත යුතුය. මෙහිදී පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, පශු සම්පත් මණ්ඩලය සහ මිල්කෝ ආයතනය පෞද්ගලික අංශයද සමඟ එක්ව කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ක්‍රමවත් සැළැස්මක් පිළියෙල කළ යුතුය.

(2) අදාල ණය මුදලේ පොලී අනුපාතය 4.6% ක් පමණ වන ඉහළ අනුපාතයක් වන බැවින් අඩු පොලී අනුපාත ලබා ගැනීම සහ වඩාත් වාසිදායක කොන්දේසි යටතේ ණය ගිවිසුමකට එළඹීමට, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය.

(3) අපේක්ෂිත ණය මුදල මිල්කෝ ආයතනය මගින් සෘජුවම ලබාගත යුතු අතර එමය ගෙවීම රජයට හෝ මහා භාණ්ඩාගාරයට බරක් නොවිය යුතුය.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය**

No:MLRCD/ 03/05/2011 - 70(1)

MINISTRY OF LIVESTOCK AND RURAL COMMUNITY DEVELOPMENT

## Note to the Cabinet

### Cabinet Paper No 11/1605/511/028 Memorandum dated 3.8.2011 by the Ministry of Livestock and Rural Community Development on "Modernization of Processing Factories of MILCO (Pvt) Ltd"

As per the Cabinet decision (Annexure I) dated 18.11.2009 on CP No 09/2455/352/005-1 the recommendation (Annexure II) by the Cabinet Appointed Negotiating Committee is forwarded to be submitted to the Cabinet of Ministers for consideration

**Arumugan Thondaman**
**Minister of Livestock and Rural Community Development**

Ministry of Livestock and Rural Community Development
No.45, St.Michael's Road, Colombo 03.

11th November 2011

Certified true copy

W.M.D.J.Fernando
Additional Secretary
Office of the Cabinet of Ministers
Sir Baron Jayathilake Mawatha
Colombo-01

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අ.ම.ප./11/2128/511/028-I
2011 දෙසැම්බර් මස 01 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී.

RECEIVED
05 DEC 2011

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්,

මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම්
කර්මාන්තශාලා නවීකරණය කිරීම මැයෙන්
අංක 11/1606/511/028 හා 2011-08-03 දිනැති
කැබිනට් පත්‍රිකාව

(පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2011-11-11 දිනැති සටහන)

2011 නොවැම්බර් මස 23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා:

10. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/2128/511/028-I වූ, "මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම මැයෙන් අංක 11/1606/511/028 හා 2011-08-03 දිනැති කැබිනට් පත්‍රිකාව" යන මැයෙන් පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ඇමතිතුමා ඉදිරිපත් කළ 2011-11-11 දිනැති සටහන - (2011-08-24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ) ඉහත සටහන මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සමග සලකාබලන ලදුව, මෙකී නිරීක්ෂණවල අවසාන ඡේදයේ නියමකර ඇති (1), (2) සහ (3) කොන්දේසිවලට අනුව අමාත්‍යාංශය විසින් කටයුතු කිරීමට යටත්ව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශිත පරිදි, මිල්කෝ පුද්ගලික සමාගම සතු කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දෙන ලදී.

ක්‍රියා කළයුතු: පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

Certified true copy

පිටපත: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

W.M.D.J.Fernando
Additional Secretary
Office of the Cabinet of Ministers
Sir Baron Jayathilake Mawatha.

MINISTRY OF LIVESTOCK AND RURAL COMMUNITY DEVELOPMENT

Report of the Cabinet Appointed Negotiating Committee

| | | | |
|---|---|---|---|
| Nature of the procurement Committee | CANC | Name of the Procurement Entity | Ministry of Livestock & Rural Community Development |
| Title of Procurement | Proposal for "Modernization of Processing Factories of MILCO Pvt Ltd" | | |
| Meeting Date: 04.11.2011 | | Time : 11.00am | |

**Present:**

| Members of CANC | | | Others | | |
|---|---|---|---|---|---|
| Mr. Udeni Wickramasinghe | Chairman CANC | Secretary Ministry of Agrarian Services Wildlife | Dr. C.N.Gamage " | Asst.Director MLRCD | Liaison Officer |
| Dr. K.M.T. Kendaragama | Member CANC | Secretary Ministry of Livestock & Rural Community Development | | | |
| Dr. B.M.S.Batagoda | Member CANC | Director General Department of National Planning | | | |

**Decisions**

The CANC which met on 04.11.2011 arrived at the following decisions.

01. After the examination of TEC and the revised proposal submitted by DESMI Contracting A/S , the CANC is principle agreed recommend the project specified in the revised proposal which is equivalent to € 33,779,210 ( without deleted items ( Colombo Dairy (P4-2)/ delete in its entirety, Digana Dairy (P4-3)/delete section 300-UHT plant & aseptic filling, Milk collection Centers(MCC)(P4-5)/delete in its entirety ).

02. The CANC decided to recommend the proposal made by DESMI Constructions A/S on following justifiable grounds.
    a. Reduced estimation is reasonable and acceptable;

1 | Page

b. Existing machinery are more than 40 years old there needs swishiest

c. the machinery should be in order to meet the processing capacity requirement of the increasing supply of milk, during the peak period.

03. The CANC strongly recommends,

a. the Department of external Resource (ERD) to negotiate with the credit line to have a recommend interset rates of the loan and,

b. As the TEC emphasizes, it is necessary to have a comprehensive and realistic program to obtain adequate locally produced milk for full swing operation of the plants in order to ensure the realization of the project.

| Members of CANC | | Signature |
|---|---|---|
| Mr. Udeni Wickramasinghe | Chairman CANC | [signature] |
| Dr. K.M.T. Kendaragama | Member CANC | [signature] |
| Dr. B.M.S.Batagoda | Member CANC | [signature] |

(02 pages only)

2 | Page

## ඇමුණුම 14

MILCO (PVT) LTD
No. 45, Nawala Road,
Colombo 5.

**BOARD PAPER / INFORMATION SHEET** Ref. No.

Date: June 28, 2010

1. **Forwarded by:** Factory Manager, Colombo Milk Factory.

17 AUG 2010

2. **Subject:** **Short Term Development Proposals**

3. **Purpose of the board paper:** To obtain the consent of the Board of Directors for the investments proposed.

**4. Background:**

Milco produces milk-based value added products at Colombo, Digana and Polonnaruwa factories. The maximum capacities of all the factories are obviously less than the market demand of those products. Despite, the same products generate comparatively higher margins unlike milk powder and liquid milk, which are essential consumer products.

It has been identified that a higher turnover can be generated with the investments pointed out in this paper, with the expanded processing capacity.

**5. Proposals and recommendations:**

1. Repairing and re-tiling of production floor

| | |
|---|---|
| Cost estimated | **Rs. 2.24 million** |
| Proposed project period: | From July 31, 2010 to Sep 30, 2010 |
| Expected benefits: | To improve food safety and reduce wastages |

2. Installation of a new yoghurt cup filler with inoculation vats at Polonnaruwa Factory.

| | |
|---|---|
| Cost estimated | **Rs. 28.00 million** |
| Proposed project period: | From July 01, 2010 to Oct 31, 2010 |

| | |
|---|---|
| Expected benefits: | To increase monthly yoghurt production by 20% (current maximum 5,800,000) |
| **Expected additional gross profit** | Rs. 2.2 million / month |

3. Installation of a mix making and pasteurization plant for products section expanding production floor.

| | |
|---|---|
| Cost estimated | **Rs. 32.00 million** |
| Proposed project period: | From July 01, 2010 to Dec 31, 2010 |
| Expected benefits: | To match the mix making capacity with proposed enhancements in ice cream production |

4. Installation of blast freezer system for expansion of ice cream production and controlling the atmospheric moisture in ice cream filling area to improve the hardening process of ice cream.

| | |
|---|---|
| Cost estimated | **Rs. 33.60 million (In 3 stages)** |
| Proposed project period: | From Aug 01, 2010 to March 21, 2011 |
| Expected benefits: | To increase the capacity of ice cream production by 75%. (From 10,800 to 18,000 litres per day) |
| **Expected additional gross profit** | Rs. 2.8 million / month |

Signature of presenter

**Comments of Working Director**

**Seen by Chairman / Deputy Chairman**

**ඇමුණුම 15**

CONFIDE AL

15 NOV 2010
PURCHASING DIVISION
Head Office - Colombo - 05

## INTERNAL MEMO

(3)

TO : Actg. Manager – Purchasing

FROM : Chairman

SUBJECT : MINUTES – BOARD MEETING – 08-10-2010
- **Development Proposal Mix Pasteurization Plant**
- **500 KVA Generator at PMF**

DATE : 11th November 2010

Extracts of the Minutes of Board Meeting held on 8th October 2010 relating to your Department/ Unit or Section is enclosed herewith for necessary action please.

SUNIL WICKRAMASINGHE

| | |
|---|---|
| 35-09/10- Development proposal Mix Pasteurization Plant - The Board of Directors decided that they have no power to approve this large amount project. Therefore they decided to submit this for technical committee and get ministry approval for this Board paper forwarded by Factory Manager Colombo Milk Factory | ~~Fm - cmf~~ M/purch |

## ඇමුණුම 16

දුරකථන / தொலைபேசி / Telephone

ලේකම් / செயலாளர் / Secretary 2441849

කාර්යාලය / அலுவலகம் / Office 2541369

Fax 2328100

විදුලි පණිවුඩ / தந்தி / Telegrams SECLIV

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
கால்நடை மற்றும் கிராமிய சமூக அபிவிருத்தி அமைச்சு
**Ministry of Livestock and Rural Community Development**

තැ.පෙ.අංක 562, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ -
த.பெ.இல.562, இல.45, சாந்த மைக்கல் வீதி, கொழும்பு
P.O. Box No. 562, No. 45, St. Michael Road, Colombo

මගේ අංකය / எனது இல. / My No: MLRCD/7/

ඔබේ අංකය / உமது இல. / Your No:

දිනය / திகதி / Date: 2010.10.15

Ce - CM
- Tiru

සභාපති,
මිල්කෝ ප්‍රයිවෙට් ලිමිටඩ්
අංක 07, වජිර පටුමග
කොළඹ 05

ලී. 4000 ධාරිතාවෙන් යුත් යෝගට් සෑදීමේ යන්ත්‍රයක් සැපයීම

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ 2010.10.12 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ සඳහන් පරිදි දැනටමත් ඔබ ආයතනය විසින් අදාල යන්ත්‍ර මිළදී ගැනීමට කටයුතු කර ඇති බව පෙනී යයි.

03. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව රජයට අනුබද්ධ ආයතනයක් ලෙස ඔබ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු කරගෙන යාමට අපගේ විරුද්ධත්වයක් නොමැත.

04. ඉදිරියේදී අදාල සීමාව ඉක්මවන අවස්ථාවන් වලදී ඒ පිළිබඳ කටයුතු කිරීමට හැකිවන පරිදි අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

ජ්.එච්. [signature] ගමගේ
ලේකම්

o/c

Sumithra's Computer/My doc/Ruwani/Letter head

**ඇමුණුම 17**

Forwarded to IT Division
(Emailed - 30th July 10 a.m)

## SUPPLY, INSTALLATION, COMMISSIONING AND TESTING OF YOGHURT MIX PLANT AT COLOMBO MILK FACTORY (CAPACITY – 4000 LITRES PER HOUR)

***TENDER NO: M/PUR/TEN/2010/07***

We are calling Tenders for the above and you may collect the Bid Document from Manager – Purchasing at his office No. 07, Vajira Lane, (Off Vajira Road), Colombo 05 from 02/08/2010...... onwards until 16/08/2010

The Bid Document fee is Rs. 25,000/= which is to be paid in cash to Cashier at Colombo Milk Factory, No. 45, Nawala Road, Narahenpita.

Tenders will be closed on 07/09/2010 at 3.00 p.m. Bids should be submitted separately as Technical Bid (TB) and Price Bid (PB). Both the TB and PB to be forwarded in the same cover.

Duly completed Bid Documents could be placed in the Tender Box available at the office of Manager – Purchasing, No. 07, Vajira Lane (Off Vajira Road), Colombo 05.

CHAIRMAN – TENDER COMMITTEE
MILCO (PRIVATE) LIMITED
NO. 07, VAJIRA LANE (OFF VAJIRA ROAD)
COLOMBO 05

Chairman.
Forwarded for approval to publish in the web and to call for Bids from the registered firms attached herewith under supp category No. 6.

**ඇමුණුම 18**

30th NOVEMBER 2010

# MILCO (PRIVATE) LIMITED

## REPORT OF THE TENDER BOARD

**SUPPLY, INSTALLATION, COMMISSIONING AND TESTING OF YOGHURT MIX PLANT AT COLOMBO MILK FACTORY – 4000L/ hr.**

The marketing / sales divisions of MILCO (Pvt) Ltd had been reporting to the Board of Directors and the Senior Management the need for the above plant based on demands. We are informed that the yoghurt mix plant at the Narahenpita factory is nearly 30 years old and has been used by repairing and replacing parts from time to time. We understand that the same plant is used for mixing Ice cream as well. According to the Technical Director and the Factory Management it is advisable to have separate "Mixing Plants" for yoghurt and Ice cream which will improve the quality of the products further. Installing and Commissionery a new "Product Mixing Plant" at Narahenpita will increase the production to a substantial level which in turn will contribute towards maximizing the profit of the company. These facts and information justify the purchase and installation of a new yoghurt mix plant.

Initial steps taken by the Factory Manager - Narahenpita had indicated the financial commitment for the above as being approximately Rs. 30 Million. Tenders had been called via web providing required information to registered suppliers to participate in the tender. Of the 10 Registered Suppliers, three (3) parties had collected the sets of documents by paying a non-refundable deposit of Rs. 25,000/= each. One party abstained from the Tender and finally tenders have been received only from.

a) Industrial Stainless Steel Fabrications (PVT) Ltd.

b) Analytical Instruments (PVT) Ltd.

The Technical Evaluation Committee (TEC) has evaluated the proposals submitted by the above two parties and has recommended Proposal (b) of M/s. Industrial Stainless Steel Fabrications (Pvt) Ltd. with laser welded fabrication at a total cost of Rs. '90,814,499.99 – without Tax. The report of the TEC is attached. According to the TEC the pay back period of this investment is approximately six years based on the present demand in the market for MILCO yoghurt.

After examining the report submitted by the TEC and obtaining clarification and further information from the members of the TEC we are in agreement with the recommendation of the TEC.

Submitted for the approval of the Board of Directors to purchase, install and Commission a new yoghurt mix plant with laser welded fabrication from M/s Industrial Stainless Steel Fabrications (Pvt) Ltd at a total cost of Rs. 90,814,499/99 (without tax).

1. N. Junaideen : ..........................................
   **Working Director**
   MILCO (Private) Limited
   (Chairman of the Committee)

2. S.. Loganathan : ..........................................
   **Director**
   **MILCO (Private) Limited**
   **(Member)**

3. K.M.H. Bandara : ..........................................
   Engineer
   **Ministry of Livestock & Rural Community Development**
   **(Member)**

**ඇමුණුම 19**


ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
கிராமிய பொருளாதாரம் பற்றிய அமைச்சு
**Ministry of Rural Economy**
නො.492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03.
இல.492, ஆர்.ஏ.டீ மெல் மாவத்தை, கொழும்பு 03.
**No.492, R.A. De Mel Mawatha, Colombo 03.**

| | | | |
|---|---|---|---|
| තැ.පෙ. අංකය / த.பெ.இல. / P. O. Box: 560 | දුරකථන අංකය / தொலைபேசி இல / Telephone No.: 011-2556724, 011-2556537 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2556486 | ඊ මේල් / மின்னஞ்சல் / E-mail: info@reco.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No.: MRE/2/9/12/COPE | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2017.09. 14 |

කීර්ති මිහිරිපැන්න මහතා,
සභාපති,
මිල්කො (පුද්ගලික) සමාගම.

සභාපතිතුමනි,

<u>පෙත්සම් ඉදිරිපත් කිරීම - මිල්කො (පුද්ගලික) සමාගම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් වූ ඔබටද පිටපතක් සහිතව මා අමතන ලද පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම්ගේ අංක කෝප්/8/1/2017 හා 2017.08.15 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය සමඟ යොමු කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ලැබී ඇති ඔබ ආයතනයේ නාරාහේන්පිට කර්මාන්තශාලාවේ සේවයේ නියුතු ඩබ්ලිව්.ඒ.ප්‍රියංකර යන අයට ඉංජිනේරු අධිකාරී වශයෙන් අයථා ලෙස උසස්වීමක් ලබා දීමට අදාළ පෙත්සමේ උධෘතයෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පරීක්ෂණයක් සිදුකරන ලද අතර, එකී පරීක්ෂණයේදී ඩබ්ලිව්.ඒ.ප්‍රියංකර මහතා වෙත ඉංජිනේරු විධායක IV ශ්‍රේණිය (අධිකාරී ඉංජිනේරු IV) ලෙසට ලබා දී ඇති උසස්වීම නීත්‍යානුකූල නොවන බවට කරුණු අනාවරණය වී ඇත.

03. ඒ අනුව මෙම කරුණ ඔබගේ සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අවධානයට යොමු කරවන අතර, ඔබ ආයතනයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි සඳහන් නියමයන් අනුගමනය කිරීමකින් තොරව මෙම උසස්වීම ලබා දී ඇති බවට කරුණු නිරීක්ෂණය වී ඇති බැවින්, මේ පිළිබඳව විමර්ශනය කර මෙම කරුණ නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කිරීමෙන් අනතුරුව ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නොපමාව මටද පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරන මෙන් කාරුණිකව දන්වමි.

මෙයට - විශ්වාසී,

මේනකා පී. අබේරත්න
අතිරේක ලේකම් (පාලන හා මුදල්)

අ/කළේ : ඩී.කේ.ආර්. ඒකනායක
ලේකම්
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

පිටපත් :

1. ලේකම්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - කරු.දැ.ගැ.ස
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කරු.දැ.ගැ.ස
3. සාමාන්‍යාධිකාරී, මිල්කෝ (පුද්) සමාගම - කරු.දැ.ගැ.ස හා අ.කා.ස


:- 5 වන මහල ,නො. 492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03.
5 ஆம் மாடி, இல.492, ஆர்.ஏ.டீ மெல் மாவத்தை, கொழும்பு 03.
5th Floor, No.492, R.A. De Mel Mawatha, Colombo 03.
Tel : 011-2556537, Fax : 011-2556591

නියෝජ්‍ය අමාත්‍ය / கௌரவ பிரதி அமைச்சர் / Hon.Deputy Minister :- 4 වන මහල ,නො. 492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03.
4 ஆம் மாடி, இல.492, ஆர்.ஏ.டீ மெல் மாவத்தை, கொழும்பு 03.
4th Floor, No.492, R.A. De Mel Mawatha, Colombo 03.
Tel : 011-2556719 , Fax : 011-2556549

## ඇමුණුම 20

2017.10.16

ගරු සභාපතිතුමා
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර.

ගරු සභාපතිතුමණි,

**පෙත්සම් ඉදිරිපත් කිරීම - මිල්කෝ (පුද්ගලික) සමාගම**

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද පිටපත් සහිතව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් මා අමතන ලද අංක MRE/2/9/12/COPE දරණ හා 2017.09.14 දිනැති ලිපිය හා බැඳේ.

එම ලිපියෙහි නම සඳහන් ඩබ්.ඒ.පී. ප්‍රියංකර මහතා 1987 වසරේ සිට වසර 30 කට අධික කාලයක් මිල්කෝ ආයතනයේ කොළඹ කිරි කර්මාන්තශාලාවට අනුයුක්තව ඉංජිනේරු අංශයේ සේවය කල අයෙකි. අවසන් වරට ඔහු උසස්වීම් ලබා ඇත්තේ 2002 වසරදී වන අතර, ඉන් වසර 14 කට පසු ඊළඟ ශ්‍රේණියට මෙම උසස්වීම පිරිනමා ඇත. ඔහුට මෙම උසස්වීම ලබාදෙන අවස්ථාව වන විට කොළඹ කිරි කර්මාන්තශාලාවේ නඩත්තු කටයුතු සඳහා පළපුරුදු විධායක නිලධාරියෙකුගේ අවශ්‍යතාවයක් පැන නැගුන හෙයින් ඔහුගේ සේවා කාලය සලකා බලා ඉංජිනේරු කළමනාකරුගේ නිර්දේශයද සැලකිල්ලට ගෙන එම උසස්වීම ලබාදෙන ලදී.

මිල්කෝ ආයතනයේ අතීත උසස්වීම් ලබාදී ඇති ආකාරය විපරම් කර බැලීමේ දී වෘත්තිය සමිති වල ඉල්ලීම් ලැයිස්තු අනුව කිසිදු ක්‍රමවේදයකින් තොරව උසස්වීම් තොග වශයෙන් ලබාදී ඇති අයුරු මනාව පැහැදිලි වේ. එහෙත් වර්තමාන කළමනාකාරීත්වය විසින් ක්‍රමවේදයක් සකස් කොට ක්‍රමානුකූලව එකී ක්‍රමවේදයට සේවකයින් හුරුකරමින් බඳවා ගැනීම් හා උසස්වීම් ලබාදීමට අඩිතාලම දමා ඇත්තෙමු.

ඩබ්.ඒ.පී. ප්‍රියංකර මහතා වෙත උසස්වීම ලබාදීමේදී වර්තමාන කළමනාකාරීත්වය විසින් අනුමත කරන ලද පරිපාටිය අනුගමනය කිරීමට නොහැකිවීම පිළිබඳව කණගාටුවට පත්වන අතර, එම පරිපාටියෙන් පරිබාහිරව කිසිදු උසස්වීමක් ඉදිරියේදී ලබානොදීමට වගබලා ගන්නෙමු.

මෙයට විශ්වාසී
**මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්**

කීර්ති මිහිරිපැන්න
**සභාපති**

පිටපත : ලේකම් - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

## ඇමුණුම 21

2017.10.13

ගරු සභාපතිතුමා
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර

ගරු සභාපතිතුමණි,

**පෙත්සම් ඉදිරිපත් කිරීම - මිල්කො පුද්ගලික සමාගම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා වෙත ද පිටපත් සහිතව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද අංක කෝප්/8/1/2017 දරණ හා 2017.08.15 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ලේකම්ගේ ලිපිය හා බැඳේ.

එකී ලිපියෙහි සඳහන් දෙවන කරුණ වන "මානව සම්පත් හා පරිපාලන කළමනාකාර, විමල් රාජපක්ෂ මහතා විසින් සිදුකරන ලද විෂමාචාර" යන මැයෙන් ඉදිරිපත් කර ඇති පෙත්සමට අදාළව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් සිදු කරන ලද විමර්ශන වාර්තාවේ පිටපතක් අප වෙත යොමු කර ඇත. එම වාර්තාව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇතැයි විශ්වාස කරනු ලබන අතර, විමල් රාජපක්ෂ මහතාට එරෙහිව ඉදිරිපත් කර ඇති විෂමාචාර චෝදනා එම වාර්තාව මඟින් බැහැර කර ඇත.

තවද, එකී පෙත්සම සම්බන්ධයෙන් මිල්කො ආයතනය විසින් ද බාහිර විමර්ශන නිලධාරියෙකු පත්කර මූලික විමර්ශනයක් පවත්වන ලද අතර, එම විමර්ශන වාර්තාව මඟින් ඉදිරිපත් වී ඇති නිර්දේශ අනුව පෙත්සම්කරුට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමු. එම මූලික විමර්ශන වාර්තාවේ පිටපතක් ද ගරු සභාවේ දැනගැනීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,
**මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්**

කීර්ති මිහිරිපැන්න
**සභාපති**

පිටපත: ලේකම්, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 22 දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

## 01. කාර්ය මණ්ඩල පුරප්පාඩු

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවක සංඛ්‍යා පුරප්පාඩු 29 ඇතුළත්ව ආයතනයේ පුරප්පාඩු 116 ක් පැවතීම සම්බන්ධයෙන් කාරක සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

දැනට ඉන් බොහෝමයක් පුරප්පාඩු සම්පූර්ණ කර ඇති අතර ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 29 න් ඉංජිනේරු අංශයට අදාල පුරප්පාඩු 09 පමණක් සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති බව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කරන ලදී.

මෙම ක්ෂේත්‍රයේ වැටුප් තල හා සසඳන විට ආයතනයේ වැටුප් තල පහල මට්ටමක පවතින නිසා මෙම පුරප්පාඩු පිරවීම ඉතා අපහසු වී ඇති බවත්, 2014/06/16 දින ආයතනයේ වැටුප් තල ජාතික විශ්වවිද්‍යාල මට්ටමට ඉහල දැමීම සඳහා වන යෝජනාවකට භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී ඒ සඳහා ඇස්තමේන්තු පවා සකස් කොට භාර දුන් නමුත් එය මෙතෙක් ක්‍රියාත්මක නොවූ බවත් අධ්‍යක්ෂ ජනරාල් තව දුරටත් ප්‍රකාශ කරන ලදී.

වැටුප් තල පහල මට්ටමක පැවතීම හේතුවෙන් පුරප්පාඩු පිරවීම අපහසු වීම බොහෝ රාජ්‍ය ආයතන වලට පොදු ගැටළුවක් වී ඇති අතර මෙවැනි ගැටළු විසඳීමට මුදල් අමාත්‍යාංශය මැදිහත් වී කඩිනම් පියවර ගත යුතු බව කාරක සභාවේ අදහස විය.

**නිර්දේශ**

i. මෙම ගැටළුව විසඳීමට යෝජනා කළ 2014/06/16 දිනැති යෝජනාව ක්‍රියාත්මක නොවීම සම්බන්ධව කරුණු සොයා බලා වාර්තා කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කරමින් පැමිණි එම අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්වරියට කාරක සභාව විසින් නියෝග කරන ලදී.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක IA/COPE/2017/01 හා 2017.10.26 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත්තේ 2017.08.22 දිනැතිව වැටුප් වැඩි කිරීම සම්බන්ධ ලිපි ලේඛන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යතුමිය වෙත යොමු කරන ලද බවයි.

නමුත් 2018.01.31 දින වන විටත් කාරක සභාව විසින් සිය නිර්දේශ මගින් ඉල්ලා ඇති උක්ත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්වරිය කටයුතු කර නොමැත.

## 02. රු. මිලියන 06 ක් පමණ වටිනා ලේසර් ප්‍රින්ටරය අළුත්වැඩියාවකින් තොරව ඌන උපයෝජිතව පැවතීම

උක්ත කරුණ පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කරන ලදී.

ඕස්ට්‍රියා නෙදර්ලන්ඩ් යෝජනා ක්‍රමය මගින් ලද පරිත්‍යාගයක් වන මෙම ලේසර් ප්‍රින්ටරය ක්‍රියාත්මක කිරීමට පළපුරුද්ද ඇති පුද්ගලයෙකු නොමැතිකමින් එලෙස පවතින බවත් රජයේ මුද්‍රණාලයට හෝ එය ලබා දීමට විමසීමක් කර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. මෙම ලේසර් ප්‍රින්ටරය ක්‍රියාත්මක කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ගත හැකි වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන මාස 03 ක් ඇතුළත කාරක සභාව වෙත දැනුම් දීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ඕස්ට්‍රියා හා නෙදර්ලන්ත ව්‍යාපෘති මගින් 2009 වසරේ පරිත්‍යාගයක් වශයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත ලැබුණු අධිතාක්ෂණයෙන් යුතු මෙම ලේසර් ප්‍රින්ටර් 04 දැනට ක්‍රියා විරහිත තත්වයේ පවතින බවත්, ඒවා අළුත්වැඩියා කිරීමට පරීක්ෂා කරන ලද නමුත් අවශ්‍ය තාක්ෂණය හා උපකරණ නොමැති වීම නිසා අළුත්වැඩියා කිරීමට නොහැකි වීම හේතුවෙන් එම යන්ත්‍ර ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට පිරිනැමීම සඳහා ඉල්ලුම් කර ලිපි යවා ඇති බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

තවද එම ලිපි සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයෙන් මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බවත්, අදාල මුද්‍රණ යන්ත්‍ර ලබා ගැනීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එකඟ නොවන්නේ නම් විගණන හා කළමනාකරණ රැස්වීමේ නිර්දේශ පරිදි එම යන්ත්‍ර වෙන්දේසි කිරීමට පියවර ගන්නා බවත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක IA/COPE/2017/01 හා 2017.10.26 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 03. එක් නිලධාරියකු විසින් වැටුප් 02 ක් ලබා ගැනීම

සප්ත වාර්ෂික නිවාඩු මත ආයතනයේ සේවයට බඳවා ගත් නිලධාරියකුට වැරදීමකින් මෙම ආයතනයෙන් සහ ඔහු කලින් සේවය කළ විශ්වවිද්‍යාලයෙන්ද වැටුප් ගෙවා තිබූ අතර එය නිවැරදි කර වැඩිපුර ගෙවන ලද මුදල් ද අය කර ගන්නා ලද බව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. වැඩිපුර ගෙවන ලද වැටුප් මුදල් අය කර ගැනීමට අදාල වූ ලේඛන විගණකාධිපති වෙත ලබා දීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

උක්ත ලේඛන විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 04. අරමුදල් ඌන උපයෝජනය

ප්‍රධාන කාර්යාලයට සහ උසස් තාක්ෂණ ආයතනවලට අයත් ජංගම ගිණුම් 12 ක රු.මිලි. 518 ක් පමණ තැන්පතු වශයෙන් පවත්වාගෙන යෑම සහ එම මුදල් කිසිදු ආයෝජනයකට උපයෝගී කර නොගැනීම.

ප්‍රධාන කාර්යාලයට සහ උසස් තාක්ෂණ ආයතනවලට අයත් ජංගම ගිණුම් වෙනුවට ඉතිරි කිරීමේ ගිණුම් තුළ එම මුදල තැන්පත් කිරීම ඵලදායී බව කාරක සභාව පෙන්වා දෙන ලදී.

ආයතනය පිහිටුවන ලද පනතට අනුව ආයතනයට ලැබෙන ප්‍රධාන සහ උපයා ගන්නා මුදල් එම ආයතනයේම අරමුදලක් වශයෙන් පවත්වා ගත යුතු බැව් දැක්වෙන නිසා, තාක්ෂණ ආයතන විසින් උපයනු ලබන ආදායම් එදිනම ප්‍රධාන කාර්යාලයේ ඉතිරි කිරීමේ ගිණුමෙහි තැන්පත් කිරීම කළ නොහැකි බවට කරුණු අනාවරණය විය.

**නිර්දේශ**

ඒ සඳහා විකල්පයක් ලෙස එම ආයතන වෙන වෙනම ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කර එම ආයතන උපයන අදායමෙන් යම් ප්‍රමාණයක් එදිනම ඉතිරි කිරීමේ ගිණුම්වල තැන්පත් කිරීමට ඇති හැකියාව ගැන සාකච්ඡා කොට සොයා බැලීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

දැනට කාර්යාලයේ ජංගම ගිණුමේ ඇති අතිරික්ත මුදල් 2017 වර්ෂය අවසන් වන විට අදාල ව්‍යාපෘති සඳහා ගෙවීම් සිදු වෙමින් පවතින නිසා නැවත අතිරික්ත ශේෂයක් ඇති නොවන බවත් එසේ වුවද කාරක සභාවේ නිර්දේශ පරිදි අතිරික්ත මුදල් ජංගම ගිණුම් වල නොතබා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරන ලෙස ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී වෙත උපදෙස් ලබා දී ඇති බවත් බවත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක IA/COPE/2017/01 හා 2017.10.26 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 05. ආයතනයේ පවිත්‍රතා කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවීම

උක්ත කරුණ පිළිබඳව කාරක සභාව කරුණු විමසන ලද අතර ඒ සඳහා ටෙන්ඩර් කැඳවීම්, ඉන් සුදුසු ආයතන තෝරා ගැනීම් යන කටයුතු ප්‍රධාන ආයතනයෙන් නොව ඒ ඒ මධ්‍යස්ථාන වෙන වෙනම සිදු කරන බව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. පවිත්‍රතා කටයුතු සම්බන්ධව තොරතුරු කිහිපයක් ලැබී ඇති අතර ඒවා පිළිබඳව සොයා බලා,

- කැඳවීම් ලද ආයතන මොනවාද ?,
- ඉදිරිපත් කරන ලද මිල ගණන් මොනවාද ?,
- ඒ අතරින් ටෙන්ඩරය ලබා දීමට සුදුසු ආයතන තෝරා ගත් ආකාරය කෙසේද ?
- එලෙස තෝරා ගත් ආයතන මොනවාද ?

යන්න සම්බන්ධව වාර්තාවක් කාරක සභාවට ලබා දීමට හැකි වන පිණිස එම තොරතුරු විගණකාධිපති වෙත ලබා දෙන ලෙස කාරක සභාව අමාත්‍යාංශයේ ලේකම් සහ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී.

ii. එමෙන්ම ගෘහ උපකරණ සහ වෙනත් මිලදී ගැනීම් සම්බන්ධවද තොරතුරු කිහිපයක් ලැබී ඇති අතර ඒවා පිළිබඳවද කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස විගණකාධිපති වෙත ලබා දුන් අතර ඒ සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙමින් ඊට සහය දක්වන ලෙසට අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාවේ නිර්දේශ පරිදි අදාල ලිපි ගොනු විගණකාධිපති වෙත ලබා දී ඇති බව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

**06. <u>එකම තලයේ ආයතන කිහිපයක් පැවතීම, එකම වර්ගයේ පාඨමාලා වෙන වෙනම ආයතන මගින් පවැත්වීම සහ ඒවායේ ඵලදායීතාව සතුටුදායක මට්ටමක නොපැවතීම.</u>**

මේ පිළිබඳව කරුණු දක්වමින් යෝජනාවලියක් භාණ්ඩාගාරයට ද යොමු කළ බව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ</u>

i. එකම තලයේ ආයතන එක අමාත්‍යාංශයක් යටතට පැවතීමේ වැදගත්කම පෙන්වා දුන් කාරක සභාව, මේ පිළිබඳව කරුණු දක්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා ඉදිරිපත් කරන ලද යෝජනාවලිය කාරක සභාව වෙත යොමු කිරීම.

ii. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යන අමාත්‍යාංශ යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල ප්‍රධානීන් පාර්ලිමේන්තුවට කැඳවා කාරක සභාව සමග සාකච්ඡාවක් පවත්වා මෙම ආයතනවල වැඩි දියුණුව සම්බන්ධයෙන් ගත යුතු තීරණ සාකච්ඡා කිරීමට කටයුතු සංවිධානය කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාවේ ඉහත නිර්දේශ අංක i මගින් ඉල්ලා ඇති යෝජනාවලිය අදාල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා විසින් මෙතෙක් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

උක්ත ආයතනවල වැඩි දියුණුව සම්බන්ධයෙන් ගත යුතු තීරණ සාකච්ඡා කිරීමට කටයුතු සංවිධානය කරන ලෙස අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්වරිය වෙත ඉහත නිර්දේශ අංක ii මගින් කාරක සභාව නියෝග කර ඇති නමුත් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කිසිවක් කාරක සභාව වෙත වාර්තා කර නොමැත.

# <u>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව</u>

(රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 23 දින**

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

## 01. <u>රුහුණු සංවර්ධන බැංකුවෙන් වංචනික ලෙස මුදල් ලබා ගැනීම</u>

2008 ජනවාරි සිට 2010 මාර්තු කාලපරිච්ඡේදය තුළ දී රුහුණු සංවර්ධන බැංකුවෙන් නිලධාරීන් 11 දෙනෙකු විසින් රු.6,181,409/-ක මුදලක් වංචනික ලෙස ලබාගෙන තිබුණු අතර, එම නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති විනය ක්‍රියාමාර්ග පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියෝග කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් මාතර මහාධිකරණයේ පවතින නඩුවේ තීරණය කුමක්ද යන්න කාරක සභාව විමසීය.

ඒ සම්බන්ධයෙන් මෙතෙක් තීරණයක් දී නොමැති බවත්, එම නිලධාරීන් 11 දෙනා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලද බවත්, මෙම මූල්‍ය වංචාවට සම්බන්ධ වන්නේ එක් නිලධාරිනියක් පමණක් බවත්, ඇය සේවයෙන් පහ කොට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර, එය නීතිපතිට යොමු කර උපදෙස් බලාපොරොත්තුවෙන් සිටින බවත්, සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී මෙහි ක්‍රියාවලිය ඉක්මන් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

මෙම නඩුව සම්බන්ධයෙන් අධිකරණයේ පවතින නඩුව 2018.02.17 දැනට කැඳවීමට නියමිතව තිබූ බව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPED/IA-2/COPE/RDB හා 2017.11.07 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 02. <u>කඳුරට සංවර්ධන බැංකුව මගින් ලබා දුන් ණය මුදල්</u>

2003 වර්ෂයේ අයවැය යෝජනාවන්ට අනුව මාසික ආදායම රු.20,000/-ට වඩා අඩුවෙන් ලබන පුද්ගලයන්ගේ නිවාස ප්‍රශ්නය විසඳීමේ අරමුණින් කඳුරට සංවර්ධන බැංකුව 2014 මාර්තු 01වන දින ණය දීමේ හවුල්කාර නියෝජිත ආයතනයක් ලෙස මහා භාණ්ඩාගාරය සමඟ ගිවිසුමකට ඇතුළත් වී තිබුණු බවත්, එම සහන පියස ණය යෝජනා ක්‍රමය යටතේ මහා භාණ්ඩාගාරය විසින් 6%ක පොළී ප්‍රතිශතයක් යටතේ රු. මිලි. 67 ක ණයක් බැංකුවට ලබා දී තිබුණු අතර, බැංකුව ප්‍රතිලාභීන් සඳහා ණය 9.5% ක පොළී ප්‍රතිශතයක් යටතේ ලබා දිය යුතුව තිබුණු බවත්, බැංකුව ඉහත කොන්දේසිය කඩ කර තිබුණු අතර, කාර්ය මණ්ඩල සාමාජිකයින් 56 දෙනෙකු සඳහා 2003 – 2004 කාල පරිච්ඡේදය අතර රු. 21,515,000/-ක මුදලක් කාර්ය මණ්ඩල ණය ලෙස ලබා දී තිබුණු බවත්, කාරක සභාවේ නිරීක්ෂණයට ලක් විය.

**<u>නිර්දේශ</u>**

i. මෙම සේවකයන්ට මෙම ණය මුදල ලබා දීමට ගත් තීරණය කුමක් ද යන්න සඳහන් කරමින් පූර්ණ වාර්තාවක් කාරක සභාවට ලබා දීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPED/IA-2/COPE/RDB හා 2017.11.07 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 03. <u>බඳවා ගැනීම් සහ වැටුප්</u>

බඳවා ගැනීමේ හා වැටුප් තීරණය කිරීමේ ක්‍රියාවලිය රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර PED චක්‍රලේඛවලට අනුගතද යන්න කාරක සභාව විමසන ලදී.

වැටුප් තීරණය කිරීමේදී සහකාර සාමාන්‍යාධිකාරී දක්වා ආයතනයේ සාමූහික ගිවිසුම මත සිදු වන බවත්, ඊට ඉහළ නිලධාරීන්ගේ වැටුප් තීරණය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් බවත්, බඳවා ගැනීම් තරඟ විභාග හා සම්මුඛ පරීක්ෂණ මගින් සිදු කරන බවත්, ඒ සඳහා අනුමැතියක් ලබා දෙන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්මේන්තුවට දැනුම් දී ඇති අතර, ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් ගන්නා ලෙස දැනුම් දී ඇති බවත්, එම ලිපිය ඉදිරිපත් කළ හැකි බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. අදාළ ලිපිය සභාගත කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

රාජ්‍ය බැංකු වෙත නව බඳවා ගැනීම් සිදු කිරීමේ අධිකාරිය හිමි වන්නේ අදාල බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බව දන්වමින් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින්, එම අමාත්‍යාංශය යටතේ පැවති සියළුම රාජ්‍ය බැංකුවල සභාපතිවරුන් වෙත යොමු කරන ලද අංක MPED/SEC/COM හා 2013.09.30 දිනැති ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 22)**

## 04. <u>2013.08.13 මුදල් අමාත්‍යාංශයේ ලේකම් සමඟ පැවති සාකච්ඡාව</u>

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් එන්.ගොඩකන්ද මහතා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගිත්වයෙන් පැවති සාකච්ඡාවක සාකච්ඡා සටහන් අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව පමණක් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි බව නිරීක්ෂණය වී ඇති බවත් මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් මීට වඩා පැහැදිලි කිරීමක් අවශ්‍ය වන බවත් කාරක සභාව සභාව අවධාරණය කරන ලදී,

**<u>නිර්දේශ</u>**

i. මේ සම්බන්ධයෙන් වූ වාර්තාවක් භාණ්ඩාගාරය විසින් සති දෙකක් ඇතුළත කාරක සභාවට හා අමාත්‍යාංශයට යොමු කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතුව 2017.10.24 දිනැතිව යොමු කර ඇති අංක PE/BN/RDB/COPE/2017 දරන ලිපියෙන් වාර්තා කර ඇත්තේ, බැංකුව විසින් සිය බඳවා ගැනීම් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ඉල්ලා ඇති බවත් ඒ අනුව බඳවා ගැනීම් සම්බන්ධ තීරණය කිරීම, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරන ලෙසට බැංකුව වෙත දන්වා යවා ඇති බවත්ය.

## 05. <u>PED/12/9/7 චක්‍රලේඛය</u>

වැටුප් සකස් කර ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පමණක් සැලකිල්ලට ගන්නේද යන්න විමසීම සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED/12/9/7 අනුව වැටුප් සංශෝධනය කිරීම මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව කළ නොහැකි බවත්, 2015.09.30 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2015 ජනවාරි සිට බල පැවැත්වෙන පරිදි සාමාන්‍යාධිකාරිගේ වැටුප 45%කින් වැඩි කිරීමට තීරණය කර ඇති බවත්, 2015.01.01 දිනට සාමාන්‍යාධිකාරිගේ මූලික වැටුප වන රු.206,000/- රු. 298,000/- බවට පත් කර ඇති බවත්, නැවත අප්‍රේල් මාසයේදී සාමාන්‍යාධිකාරිගේ වැටුප රු.300,000/- ලෙස තීරණය කර එයට 45%ක වර්ධකයක් ලබා දීම වැටුප රු. 435,000/-ක් බවට පත්ව ඇති බවත්, මෙසේ සිදු වූයේ කෙසේද යන්න විමසීය.

සාමාන්‍යාධිකාරී තනතුර සාමූහික ගිවිසුමට අදාළ නොවන බවත්, එම තීරණය ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බවත්, සාමූහික ගිවිසුමට අයත් වන්නේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී තනතුර දක්වා පමණක් බවත්, ඊට ඉහළ නිලධාරීන්ගේ වැටුප් නියමිත ප්‍රතිශතවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදු වන බවත්, වසර තුනකට වරක් සාමූහික ගිවිසුම අනුව රජයේ බැංකුවල වැටුප් වැඩි වන බවත්, 2015 වසරේදී ඒ අනුව සාමාන්‍යාධිකාරිගේ වැටුප් වැඩි වීම 45%ක් ලෙස තීරණය වූ බවත්, එම ප්‍රතිශතය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව වැටුප් වැඩි කළ බවත්, වාර්ෂික වැටුප් වර්ධකය වශයෙන් 8.5% කින් වැඩි වූ බවත්, ඒ අනුව 2017.01.01 දින සිට සාමාන්‍යාධිකාරිගේ වැටුප රු.475,000/-ක් වූ බවත්, සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. සාමාන්‍යාධිකාරිගේ වැටුප් වැඩිවීම සිදුවූ පදනම එයට අදාල වූයේ කුමන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයද යන්න සඳහන් කරමින් සති දෙකක් ඇතුළත කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත පමණක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට වැටුප් වැඩි කිරීමේ හැකියාවක් තිබේද යන්නත් PED/12/9/7 චක්‍රලේඛය බැංකුවලට අදාල නොවේද යන්නත් සඳහන් කරමින් කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

i. නිර්දේශ අංක i මගින් ඉල්ලා ඇති සාමාන්‍යාධිකාරිගේ වැටුප් තීරණය වීම සම්බන්ධ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර එය **ඇමුණුම 23** යටතේ ඇතුළත්ය.

ii. නිර්දේශ අංක ii මගින් ඉල්ලා ඇති වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් විමසීමක් කර ඇති බවත් අදාල තොරතුරු ලද පසු කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව ලබා දීමට කටයුතු කරන බවත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතුව 2017.10.24 දිනැතිව යොමු කර ඇති අංක PE/BN/RDB/COPE/2017 දරන ලිපියෙන් වාර්තා කර ඇත.

## 06. <u>ලිය ඉසුර ණය යෝජනා ක්‍රමය</u>

අයවැය යෝජනාවන්ට අනුව ලිය ඉසුර ණය යෝජනා ක්‍රමය යටතේ 2015.12.31 දිනට ණය දීම් 15,199කට අදාළව පොළී රහිතව රු.මිලි. 2,443.93ක ණය මුදලක් ලබා දී තිබුණු බවත්, එහෙත් මෙම ණය ලබාදීම්වලට අනුව පිරිවැය රජය විසින් ප්‍රතිපූරණය කර නොතිබූ බවත්, 2017 ජූලි 31 දිනට ණය දීම් 8,550කට අදාළව රු. මිලි. 422.6ක් අයවිය යුතුව තිබූ අතර, ඉන් රු. මිලි. 83ක් අක්‍රිය ගණයේ පැවතුණු බවත්, කාරක සභාවේ නිරීක්ෂණයට ලක් විය.

ආයතනයේ මුදල් උපයෝගී කරගෙන මෙම ණය මුදල් ලබා දුන් බවත්, 2013 වර්ෂයේදී ඉදිරිපත් කළ 2014 අයවැය ලේඛනයේ ප්‍රතිපාදනයක් අනුව මෙම ණය මුදල් ගෙවා තිබූ බවත්, මෙහිදී පොළී රහිතව සහ ඇප රහිතව රු.250,000/- බැගින් ණය මුදල් කාන්තා පාර්ශ්වය සඳහා ලබා දීමට විධි විධාන යෙදූ බවත්, ඒ අනුව 15,199කට රු. මිලි. 2,443.93ක ණය ප්‍රදානය කළ බවත්, යම් ප්‍රතිශතයක් භාණ්ඩාගාරයෙන් ගෙවන ලෙස ඉල්ලීමක් කර ඇති නමුත් ප්‍රතිචාරයක් නොමැති බවත් මේ වන විට රු. බිලියන 527ක පාඩුවක් බැංකුවට සිදුව ඇති බවත්, ණය කලඹෙන් 82%ක් ම රු. 500,000/-කට වඩා අඩු ණය වශයෙන් පවත්වාගෙන යන බවත්, සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>ඇමුණුම 22</u>**

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
அரச தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சு
**MINISTRY OF PUBLIC ENTERPRISE DEVELOPMENT**

මගේ අංකය / எனது இல / My No. MPED/SEC/COM
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 30.09.201

To: All Chairmen of State Banks under the purview of the

Ministry of Public Enterprise Development

**<u>RE: CANCELLATION OF RECRUITMENT CIRCULAR FOR STATE BANKS DATED 26.09.2016</u>**

I refer to the above letter sent by the Secretary to the Treasury on the above subject.

The Hon. Minister of Public Enterprise Development sought clarification from the Hon. Minister of Finance on 27.07.2016 on recruitment processes for State Banks. The Secretary to the Treasury by his letter dated 26.09.2016 responded, informing that the authority of recruitment is vested in the Board of Directors of the State Banks.

I kindly request you to adhere to the instructions given above.

Yours sincerely,

Ravindra Hewavitharana
Secretary

RECEIVED
10 OCT 2016

Level 7, West Tower
World Trade Centre

7 වන මහල,
බටහිර කුළුණ,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,

Tel : +(94) 112 437 805
+(94) 112 437 828

**<u>ඇමුණුම 23</u>**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேசிய சங்வர்த்தனை வங்கி
RDB Pradeshiya Sanwardhana Bank

2017.08.31

ලේකම්තුමා
රාජ්‍ය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

ලේකම්තුමනි,

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2017 අගෝස්තු මස 23</u>**

2017.08.23 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ටී. ඒ. ආරියපාල මහතාට වැටුප් ගෙවීම සම්බන්ධව ගරු කාරක සභා සභාපතිතුමා විසින් විමසන ලද කරුණු වලට අදාලව පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමු.

1. මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කළ ටී. ඒ. ආරියපාල මහතා ද්විතියික පදනම මත මුදාහැර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වැඩ බලන සාමාන්‍යාධිකාරී ලෙස 2014.10.02 දින සිට පත්කරනු ලැබීය. මෙම පත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය 2014.10.27 දින ලැබී ඇත. එම අනුමැතිය අඛණ්ඩව වලංගු බව 2017.05.30 ලිපියෙන් තහවුරු කර ඇත. (ඇමුණුම 1 හා 2 )

2. ටී. ඒ. ආරියපාල මහතා 2014.10.02 දින සිට 2015.09.30 දින දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස දළ වැටුපෙන් 1/3 ක් වන රු 60,414/- ක් හා සාමාන්‍යාධිකාරී විශේෂ දීමනා ලෙස රු 25,000/- ක්, සංග්‍රහ දීමනා ලෙස රු 35,000/- ක්ද, ගෙවල් කුලී දීමනා රු 50,000/- ක්ද ඇතුළුව මාසිකව රු 170,414/- ක පාරිශ්‍රමිකයක් අදාල තනතුරේ වැඩ බැලීමේ කාල සීමාව තුළ ගෙවීම් කර ඇත.

3. ද්විතියික පදනම මත මුදාහළ ටී. ඒ. ආරියපාල මහතාට මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට අදාල වැටුප් ගෙවා ඇති අතර ඒ අනුව රු 331,862.12 ක මුදලක් මාසිකව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපූර්ණය කර ඇත (ඇමුණුම 3)

4. 2015 මාර්තු 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ටී. ඒ. ආරියපාල මහතා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථිර සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස 2015.04.01 දින සිට 2019.01.31 දින දක්වා පත්කරනු ලැබුවද, මහජන බැංකුවෙන් ඉවත් වීම දැනුම් දිය යුතුව තිබූ බැවින් ටී. ඒ. ආරියපාල මහතා එම පත්වීම භාරගනු ලැබුවේ 2015.10.01 දින සිට වේ. ඒ අනුව වැටුප් ගෙවීම 2015.10.01 දින සිට ආරම්භ විය. ඊට පෙර වැටුප් ගෙවනු ලැබුවේ ඉහත 2 හා 3 යටතේ සඳහන් පරිදි වේ.

5. 2015.05.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ටී. ඒ. ආරියපාල මහතාට සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස ස්ථිර පත්වීමට අදාල වැටුප් හා දීමනා 2015 වර්ෂයේ සාමුහික ගිවිසුම අනුව වැටුප් සංශෝධනයට පෙර රු 300,000/- ක් ලෙස තීරණය කරනු ලැබුවද, එම වැටුප ගෙවීමක් සිදුකර නැත. (ස්ථිර පත්වීම භාරගනු ලැබුවේ 2015.10.01 දින බැවින්) එසේම සාමුහික ගිවිසුමට සමගාමීව වැඩිවන වැටුප් හා දීමනා ලබාදීමේ කොන්දේසියක් ඇතුළත්ව තිබුණි.

ප්‍රධාන කාර්යාලය, අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය. දුරකථන- 011-2035454 වෙබ්: www.rdb.lk
தலைமை காரியாலயம், இல-933, கண்டி வீதி, வெதமுல்ல, களனி, தொலைபேசி : 011-2035454 இணையத்தளம் : www.rdb.lk
Head Office, No. 933, Kandy Road, Wedamulla, Kelaniya. Hotline : 011-2035454, Web : www.rdb.lk

6. රාජ්‍ය බැංකුවල සාමුහික ගිවිසුම මගින් වසර තුනකට වරක් සිදු කරන වැටුප් සංශෝධනය 2015 සැප්තැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අතර එය 2015.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබීය. (ඇමුණුම 4 )
   රාජ්‍ය බැංකු වල සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා දළ වැටුපෙන් 45% ක වැටුප් වැඩිවීමේ ප්‍රතිශතය මෙම පත්වීම සඳහා ද අදාළ කරගෙන ඇති අතර, ඒ අනුව 2015.03.25 දින අනුමත කළ රු. 300,000/- ක දළ වැටුප සඳහා සංශෝධිත දළ වැටුප රු 435,000/- ක් වේ.

7. ටී. ඒ. ආරියපාල මහතා 2015.09.30 දින දක්වා (එනම් 2014.10.02 දින සිට ස්ථිර පත්වීම් භාරගන්නා තෙක්) ගෙවනු ලැබුවේ වැඩබලන දීමනා හා අනෙකුත් දීමනා ඇතුළු රු 170,414/- ක් පමණි. ඊට අමතරව එම කාලයට අදාල මහජන බැංකුව විසින් ගෙවා තිබු වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කරන ලදි.

8. ටී. ඒ. ආරියපාල මහතා 2015.09.30 දින මහජන බැංකු සේවයෙන් ඉවත් වී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී තනතුරේ ස්ථිර පත්වීම 2015.10.01 දින භාරගනු ලැබීය. එදින සිට ඔහුට ඉහත 6 හි සඳහන් පරිදි රු 435,000/- ක දළ වැටුපක් ගෙවා ඇති අතර එය සාමුහික ගිවිසුම මගින් වැඩි වු 45% ක වැටුප් වැඩිවීම ද ගැලපීම් කළ පසු අදාළ වන වැටුප වේ. එදිනට පෙර 2015.09.30 දක්වා වැඩබලන දීමනාව පමණක් ගෙවීම් සිදුකර ඇත. ඒ අනුව පත්වීම් දිනය 2015.10.01 දින වේ. වාර්ෂික වැටුප් වර්ධක දිනය ඔක්තෝම්බර් 01 දින වේ.

9. අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික වැටුප් වර්ධකයක් ලෙස 8.5% ක අනුපාතයක් අනුමත කර තිබුණු බැවින් ස්ථිර පත්වීම සඳහා වසරක කාල සීමාව සම්පූර්ණ වු 2016.10.01 දින සිට රු 36,975/- ක වැටුප් වර්ධකය සමඟ රු 471,975/- ක දළ වැටුපක් ගෙවනු ලැබේ.

10. ඉහත පරිදි ටී. ඒ. ආරියපාල මහතා අභ්‍යන්තර උසස්වීමක් නොවන බැවින්, බැංකු ක්ෂේත්‍රය තුළ ඔහු විසින් 1978.08.01 දින සිට වසර 37 ක් ලබා ඇති නිපුණත්වය, පළපුරුද්ද, මහජන බැංකුවේ සේවයෙන් ඉවත් වන අවස්ථාවේ ඔහු ලැබු වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද අහිමි වීම සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වැටුප් හා දීමනා තීරණය කර ඇති බවද කාරුණිකව දන්වමු. (2015.03.25 හා 2015.05.27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා උද්ධෘතය අමුණා ඇත - ඇමුණුම 5 හා 6 ).

මෙයට
විශ්වාසි,

ප්‍රසන්න ප්‍රේමරත්න
සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

(සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය)

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 24 දින**

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

### 01. කාරක සභා රැස්වීම සඳහා නොපැමිණීම

වෛද්‍ය සැපයීම් අංශයේ පහත නම් සඳහන් නිලධාරීන් දෙදෙනා කාරක සභා රැස්වීම සඳහා පැමිණෙන බව කලින් දන්වා තිබුණද ඒ සඳහා සහභාගී නොවීම.

i. ආර්. ඒ. කේ. ෆොන්සේකා මහත්මිය, ගණකාධිකාරී

ii. පී.ඩී. එස්. කුරේ මහතා, ගණකාධිකාරී (සැපයුම්)

අදාල නිලධාරීන් කාරක සභාවට සහභාගී නොවුයේ, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දීමට ගොස් ඇති බැවින් යැයි සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. මොවුන්ට කාරක සභාව පැවැත්වෙන දිනයට පෙර අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට පැමිණෙන ලෙස දන්වා තිබුණේද නැත්ද යන වග දින වකවානු සහිතව පැහැදිලි කිරීමක් සතියක් ඇතුළත කාරක සභාවට එවීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාව විසින් ඉල්ලා ඇති පරිදි ඉහත නම් සඳහන් නිලධාරීන් දෙදෙනා කාරක සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් වූ පැහැදිලි කිරීමක් 2018.03.31 දින තෙක් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

### 02. වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2015 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2017 අගෝස්තු 11 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබීම.

2015 වාර්ෂික වාර්තාව 2017.08.21 දින අමාත්‍ය මණ්ඩලයට යවා ඇති බවත් එහි අනුමැතිය ලැබුණු පසු පාර්ලිමේන්තුවට එවීමට කටයුතු කරන බවත් 2016 වාර්තාව හැකි ඉක්මනින් ඉදිරිපත් කරන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

2015 වාර්ෂික වාර්තාව 2017.11.25 දින පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

### 03. කාර්ය මණ්ඩලය

පහත කරුණු සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

i. 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරු පුරප්පාඩු 38 ක් පැවතියදී, විධායක තනතුරු 01ක්, විධායක නොවන තනතුරු 05ක් හා සුළු

සේවක තනතුරු 11ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා එක් අයෙකු ස්ථිර පදනම මතද, 16 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත ද බඳවාගෙන තිබීම.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු 16 දෙනාගෙන් සුළු සේවකයින් 06 දෙනෙකු සංස්ථාවේ සේවය සඳහා වාර්තා කර නොතිබීම හා 2015 හා 2016 වර්ෂවලදී ඔවුන් 06 දෙනා වෙත වැටුප් ලෙස රු. 1,796,755/- ක් ගෙවා තිබීම.

ii. අනුමත කාර්යය මණ්ඩලය තුළ නොවූ අලෙවි ප්‍රවර්ධන නිලධාරී, ව්‍යාපෘති සම්බන්ධීකාරක හා උපදේශක යන තනතුරු සඳහා 2015 හා 2016 වර්ෂවලදී නිලධාරීන් 24 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබීම.

එම නිලධාරීන් 24 දෙනා සංස්ථාවේ සේවය සඳහා වාර්තා කර නොතිබීම, ඔවුන් වෙත කාර්ය පැවරුම් හෝ රැකියා විස්තර ලබාදී නොතිබීම හා 2015 හා 2016 වර්ෂවලදී ඔවුන් 24 දෙනා වෙත වැටුප් ලෙස රු. 9,430,398/- ක් ගෙවා තිබීම.

**නිර්දේශ**

i. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් කාර්ය මණ්ඩලය සඳහා සකස් කර ඇති බද්ධ ව්‍යාපාරය (Joint Venture) සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙහි පිටපතක් කාරක සභාවට ලබා දීම.

ii. රටේ ජනතාවට බලපාන ප්‍රශ්නයක් ලෙස සලකා මොවුන්ගේ සේවය වහාම අත්හිටුවීම සහ ඒ පිළිබඳව පරීක්ෂණයක් වහාම සිදු කිරීම.

iii. මෙම බඳවා ගැනීම් පිළිබඳ

- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ,
- මෙම ව්‍යාපෘතියේ ස්වභාවය,
- මේ සඳහා තෝරා ගත් පදනම,
- පවරන ලද රාජකාරි,
- රාජකාරි සඳහා සේවයට අනුයුක්ත කරන ලද දිස්ත්‍රික්ක,
- එම දිස්ත්‍රික්කවල ප්‍රධානීන්ගේ සහතික කිරීම, සේවා ඇගයීම (Activity Report) යන වාර්තා අමාත්‍යාංශ මට්ටමින් සති දෙකක් ඇතුළත කාරක සභාව වෙත ලබා දීම

iv. සෑම මසක් අවසානයේම අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත එවන ලද සියළුම වාර්තාවල පිටපත්ද කාරක සභාව වෙත ලබා දීම.

v. උක්ත වාර්තා ලැබුණු විට ඒවා පරීක්ෂා කර බලා විගණකාධිපති විසින් කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

i. කාරක සභාව විසින් නිර්දේශ අංක i මඟින් ඉල්ලා ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 24)**

ii. කාරක සභාවේ නිර්දේශ අනුව ක්‍රියා කරමින් 2017 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිලධාරියාගේ සේවය අත්හිටුවා ඇති බව කාරක සභාව වෙත වාර්තා කර ඇත. **(ඇමුණුම 25)**

තවද, මෙය කඩිනම් ව්‍යාපෘතියක් වූ බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව බඳවා ගෙන පසුව ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කළ ද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතිය ලැබී නොමැත. අනුමැතිය ලබා දී ඇත්තේ කළමනාකරණ සහකාර, රියදුරු හා කම්කරු යන තනතුරුවලට පමණි. **(ඇමුණුම 26)**

iii. ව්‍යාපෘතිය සමබන්ධ ඉල්ලා ඇති තොරතුරු පහත පරිදි වේ.

- **ව්‍යාපෘතියේ ස්වභාවය**

ඖෂධ ප්‍රතිපත්තිය ජනතාව අතර ප්‍රචලිත කිරීමේ ජාතික මට්ටමේ ව්‍යාපෘතිය.

- **තෝරාගත් පදනම**

කළුතර දිස්ත්‍රික්කයේ පදිංචි කරුවනේගන් තෝරාගෙන ඇත.

- **පවරන ලද රාජකාරි.**

රජයේ ඖෂධ ප්‍රතිපත්තිය ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා දායක වීම.

- **සේවයට අනුයුක්ත කරන ලද දිස්ත්‍රික්කය.**

මෙම නිලධාරීන් ක්ෂේත්‍ර ගතව රාජකාරි කරන ලද බැවින් සංස්ථාවේ පැමිණීමේ ලේඛනවල වාර්තා ගත වී නොමැත. කළුතර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර රාජකාරිවල යොදවා ඇත.

- **සේවය සහතික කිරීම.**

එම දිස්ත්‍රික් ප්‍රධානියාගේ සහතික කිරීම් හා සේව ඇගයීම් පිළිබඳ වාර්තා ලබා දී නොමැත.

- **මාසික වාර්තා**

සෑම මසක් අවසානයේදීම අලෙවි නිලධාරීන් විසින් මෙම ආයතනය වෙත වාර්තා එවා නොමැත.

## 04. <u>දිරි දීමනා ගෙවීම සහ ප්‍රවාහන දීමනා ගෙවීම.</u>

සංස්ථාවේ විධායක සහ විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය නොසලකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු. 4,700/- ක හා රු. 3,000/- ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබීම සහ මාසික උපරිමය රු.12,000/- කට යටත්ව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ සමස්ථ කාර්ය මණ්ඩලය වෙත මුළු නිෂ්පාදන දිරි දීමනාව රු. 45,565,152/- ගෙවා තිබීම.

**<u>නිර්දේශ</u>**

i. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

සේවකයන් දිරි ගැන්වීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන අදාළ දිරි දීමනා ගෙවීම සිදු කරන බව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිගේ 2018.02.22 දිනැති ලිපිය මඟින් වාර්තා කර ඇත.

නමුත් මේ සම්බන්ධයෙන් කාරක සභාවේ නිර්දේශය වී ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම වුවත්, ඒ අනුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවේ.

## 05. E/H Gelatin Capsules අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම.

2010 අගෝස්තු 05 දින මිලදී ගෙන තිබුණු පිරිවැය රු. 5,656,285/- ක් වූ E/H Gelatin Capsules අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වී තිබීම සහ අදාළ පාර්ශවයන්ගෙන් අලාභය අය කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබීම.

**නිර්දේශ**

i. ඉදිරියේ මෙවැනි තත්ත්වයන් මග හරවා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න කාරක සභාවට දැන්වීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

උක්ත ක්‍රියාමාර්ග සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MH/FCC/02/COPA-SPMC/2017 හා 2018.02.14 දිනැති ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 27)**

## 06. මහජන පැමිණිලි

බුලත්සිංහල ප්‍රදේශයේ ඉඩමක් මිලදී ගැනීම සම්බන්ධයෙන් කාරක සභාවට එවා තිබූ මහජන පැමිණිල්ල පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

**නිර්දේශ**

i. මෙම ඉඩමෙහි නීතිමය තත්ත්වය , මිලදී ගැනීම සහ එහි අළුතින් ඉදි කරන නව ගොඩනැගිලි පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

උක්ත ගොඩනැගිල්ල පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MH/FCC/02/COPA-SPMC/2017 හා 2017.12.13 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 28)**

**ඇමුණුම 24**

රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

**පිටපත්** : ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක. ලේකම්.
මුදල් හා ජනමාධ්‍ය ලේකම්.
කර්මාන්ත හා වාණිජ ක.ලේකම්.
සභාපති, ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/1888/718/109/ටීබීආර්
2017 සැප්තැම්බර් මස 27 දින.

ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**ක්‍රියා කළ යුතු** : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

**විභව ආයෝජකයින් සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අතර ඖෂධ නිෂ්පාදනය සඳහා බද්ධ ව්‍යාපාර පිහිටුවීම වෙනුවෙන් වන යෝජනාව**

(සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-08-13 දිනැති සංදේශය)

2017 සැප්තැම්බර් මස 12 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

ඇ.කාලේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:**

**(II) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - ප්‍රසම්පාදනයට අදාළ කරුණු:**

57. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1888/718/109/ටීබීආර් වූ, **"විභව ආයෝජකයින් සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අතර ඖෂධ නිෂ්පාදනය සඳහා බද්ධ ව්‍යාපාර පිහිටුවීම වෙනුවෙන් වන යෝජනාව"** යන මැයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-08-13 දිනැති සංදේශය - (අමප අංක 16/2357/718/045-II පිළිබඳව වූ 2016-11-15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

→ 2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2329621 දුරකථන අංකය මඟින් අතිරේක ලේකම් විමසීම මැනවි.

\- 2 -

(i) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇති පරිදි සහ සංදේශයේ අවසන් ඡේදයෙහි යෝජිත පරිදි, සංදේශයේ සඳහන් වගුවෙහි දක්වා ඇති අදාළ නිපැයුම් නිෂ්පාදනය කිරීම සඳහා බෙහෙවින් ප්‍රතිචාරාත්මක ආයෝජකයින් සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අතර බද්ධ ව්‍යාපාර පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දීම; සහ

(ii) ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිත සියලු බද්ධ ව්‍යාපාර කටයුතු, අමප අංක 16/2357/718/045-II පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් 2016-11-15 දින අනුමැතිය ලබා දෙන ලද, භාණ්ඩාගාරයේ ලේකම් විසින් සභාපතිත්වය දරන ලද නිලධාරී කමිටුවේ නිර්දේශ හා අනුගත වන බවත්, අනාගත ආයෝජකයින් සමඟ අත්සන් කරනු ලැබීමට නියමිත අදාළ ගිවිසුම් තුළ එකී නිර්දේශ යෝග්‍ය පරිදි ඇතුළත් කරනු ලැබ ඇති බවත් සහතික කරගන්නා ලෙස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම.

අසාර්ථක ආයෝජකයින් වෙතින් මේ සම්බන්ධයෙන් කිසිදු අභියාචනයක්, ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය වෙත ලැබී නොමැති බව ද අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

ක්‍රියා කළ යුතු: **සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**අග්‍රාමාත්‍ය ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**සභාපති, ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය**

**ඇමුණුම 25**

2018.01.22

සාමාන්‍යාධිකාරිණි
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ - ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් අංක - කෝප්/8/1/2017 හා 2017 සැප්තැම්බර් 14 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්තුමා අමතන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ සම්බන්ධවයි.

04. කාර්ය මණ්ඩලය

ඖෂධ ප්‍රතිපත්තිය ජනතාව අතර ප්‍රචලිත කිරීම ජාතික මට්ටමේ කඩිනම් ව්‍යාපෘතියක් වූ බැවින් එම නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව බඳවා ගන්නා ලද අතර බඳවා ගැනීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇත.

කෙසේ වෙතත් මෙම තනතුරු අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල අතර අනුමැතිය ලැබී නොමැත.

එම නිලධාරීන්ගේ රාජකාරි කටයුතු ක්ෂේත්‍රගතව සිදු කල බැවින් සංස්ථාවේ පැමිණීමේ ලේඛණ වල වාර්තා කිරීම සිදු නොවී ඇත.

කෙසේ වුවත් 2017 අගෝස්තු මස 24 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය මත 2017 අගෝස්තු මස සිට මෙම නිලධාරීන්ගේ සේවය අත්හිටුවා ඇත.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## ඇමුණුම 26

DMS/1754/Vol.ii

2017.10.16

ලේකම්

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ලේකම්තුමනි

<u>සේවක සංඛ්‍යාව වැඩි කිරීම - ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව</u>

ඉහත කරුණ සම්බන්ධව ඔබගේ අංක MH/AD/01/08/SPMC/Cadre හා 2017.09.13 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ සඳහන් කරුණු සහ 2017.10.03 දින මෙම දෙපාර්තමේන්තුවේදී පවත්වන ලද කාර්ය මණ්ඩල සමාලෝචන රැස්වීමේදී ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගෙන රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා මීට පෙර ලබා දී තිබූ සියලු කාර්ය මණ්ඩල අනුමැතීන් අවලංගු කර ඇමුණුම 01 හි දක්වා ඇති කාර්ය මණ්ඩලය අනුමත කරන බව කාරුණිකව දන්වමි.

03. එම තනතුරු සඳහා බඳවා ගැනීම් අදාළ බඳවා ගැනීමේ පරිපාටිවලට අනුකූලව, විධිමත්ව හා විනිවිදභාවයකින් යුක්තව සිදු කළ යුතු අතර, අනුමත නව තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකසා මෙම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමෙන් අනතුරුව බඳවා ගැනීම් සිදු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

04. තවද පුරප්පාඩු පිරවීම හා නව තනතුරු ඇතිකිරිම සඳහා වූ අතිරේක පිරිවැය මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවිය යුතු අතර, එය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ආදායමින් දැරිය යුතු බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

මෙයට - විශ්වාසි

එච්.ජී. සුමනසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. විගණකාධිපති
2. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
5. සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
6. පොදු ගොනුව
7. දත්ත ගොනුව

| | | | |
|---|---|---|---|
| | Book Keeper | පොත් බැඳුම්කරු | 02 |
| | Computer Hardware Technician | පරිගණක දෘඩාංග තාක්ෂණික | 01 |
| | Information Technician (Multimedia) | තොරතුරු තාක්ෂණ ශිල්පී (බහු මාධ්‍ය) | 01 |
| **MA 1-1** | **Management Asst. (Non Tech)** | | |
| | Management Assistant | කළමනාකරණ සහකාර | 34 |
| **PL – 3** | **Primary Level Skilled** | | |
| | Driver | රියදුරු | 18 |
| **PL – 2** | **Primary Level Semi Skilled** | | |
| | Pharmaceutical Complete Aide | ඖෂධ නිමා කිරීමේ සහයක | 29 |
| | Lab Assistant | රසායනාගාර සහයක | 02 |
| **PL – 1** | **Primary Level Unskilled** | | |
| | Labourer | කම්කරු | 39 |
| | **Total** | එකතුව | **353** |

## ඇමුණුම 27

To : General Manager

From : Deputy General Manager – Planning and Procurement

Subject : Replies to cope report

Date : 15.01.2018

**Rejected Empty Gelatin Capsules – quantity 35.56million) with the Value of Rs. 5.6mn –**

It has been following up matter continuously. the latest reply by High Commission of India, it was informed that the matter is referred to respective authorities in India after sending several reminders to them.

In this situation, it is hard to expects positive answer due to left over 5 years' time period and response also very slow by High commission of India.

Further, in view of avoid this type of issues, SPMC speed up coordinating process with the suppliers if found any errors with the materials without getting delay.

As well, procurements of similar type of products are getting done through selected and recommended suppliers.

22.01.2018.

Rohan Dharmadasa.

Deputy General Manager- Planning and Procurement.

## ඇමුණුම 28

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ( COPE ) විමසුම් සඳහා පිළි

**බුලත්සිංහල ප්‍රදේශයේ ඉඩමක් මිලදී ගැනීම සම්බන්ධව**

### 1. නීතිමය තත්වය

සංස්ථාවේ නිතීඥ මණ්ඩලයේ නිතීඥයකුගේ නිර්දේශ සැලකිල්ලට ගනු ලැබීමෙන් අනතුරුව රජයේ තක්සේරු වටිනාකමට මිලදී ගන්නා ලදි.

### 2. මිලදී ගැනීම

ඉඩම මිලදී ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් ලංසු කැඳවීමක් සිදුකරන ලදි. ඊට අදාළව ලංසු 02ක් ලැබුණු අතර, ඒවා දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමෙන් අනතුරුව එම කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාසන කමිටුව විසින් අවම ලංසුව ඉදිරිපත් කර තිබූ බුලත්සිංහල ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් සහිත ඉඩම මිලදී ගැනීමට අනුමැතිය ලබාදුන් අතර එය රජයේ තක්සේරු වටිනාකමට එනම් ලංසුකරු ඉදිරිපත් කළ මිලට වඩා අඩු මිලකට මිලදී ගන්නා ලදි.

### 3. මිලදී ගැනීමේ අරමුණු

❖ ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලා සඳහා පුහුණු ශ්‍රමය ලබා ගැනීම ගැටලුකාරී තත්වයකි. එනම් ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟයක් පවතින බැවිනි.

මෙම ගැටලුවට පිළියමක් ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් දැනටමත් පුහුණු ඖෂධ තාක්ෂණඥයින් බිහිකිරීමට පුහුණු පාසලක් ආරම්භ කර ඇත. එම පුහුණු කිරීමේ පාසල මෙම බුලත්සිංහල ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.

❖ සෞඛ්‍ය අමාත්‍යාංශයේ "2020 නව දැක්ම" අනුව ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලා 14ක් අලුතින් ඇරඹීමට නියමිතය. මෙම කර්මාන්තශාලා හොරණ සහ වැලිපැන්න ප්‍රදේශ ආශ්‍රිතව ඇරඹීමට සැලසුම්කර ඇත. දැනටමත් හොරණ ප්‍රදේශයේ කර්මාන්තශාලා 03ක් ආරම්භ කර ඇත.

තවද ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් යටතේ කර්මාන්තශාලා 1000ක් අපනයන ප්‍රවර්ධන කලාප තුළ ආරම්භ කිරීමට නියමිතය. ඒ අනුව හොරණ, කොග්ගල ආදී ප්‍රදේශවල මේ කර්මාන්තශාලා ඇරඹීමට සැලසුම්කර ඇති අතර ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලාද ඊට ඇතුලත්ය.

මෙම ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලා මඟින් නිෂ්පාදනය කෙරෙන ඖෂධවල ගුණත්වය පරීක්ෂා කිරීම සඳහා තත්ව පාලන රසායනාගාරයක් පිහිටුවීමද අවශ්‍යතාවයකි. බුලත්සිංහල ප්‍රදේශයෙන් මිලදී ගත් ගොඩනැගිල්ල මෙම තත්ව පාලන රසායනාගාරය ස්ථාපිත කිරීම සඳහා ද යොදා ගැනේ.

### 4. අලුතින් ඉදිකරන ගොඩනැගිලි

පවත්නා ගොඩනැගිල්ල අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නවීකරණය කර ප්‍රයෝජනයට ගැනීමට නියමිතය. එම නිසා එහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
*(2018.12.28 දින සිට මෙම ආයතනය කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 අගෝස්තු මස 25 වන දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. තක්සේරු මුදල ඉක්මවා වාහනයක් මිලදී ගැනීම**

කල්බදු පදනමින් කැබ් රථ 3ක් මිලදී ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති නමුදු එම තක්සේරු මුදල ඉක්මවා ආයතනය විසින් වාහනයක් මිලදී ගෙන තිබීම 2013.10.25 දින පැවති කෝප් කමිටුවේදී ප්‍රශ්නගත වූ අතර එහිදී ආයතනයේ නිලධාරීන් සපයා ඇති තොරතුරු සාවද්‍ය බව මේ වන විට කාරක සභාවට අනාවරණය විය.

**නිර්දේශ**

i. අමාත්‍යාංශ මට්ටමෙන් මේ පිළිබඳ පරීක්ෂා කර මාසයක් ඇතුළත වාර්තාවක් ලබා දීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

**02. ණය අය කර ගැනීමට නොහැකි වීම**

මහවැලි පශු සම්පත් සමාගමෙන් අය කර ගත යුතු රු. 8,489,772/-ක ණය මුදල අය කර නොගැනීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.

මෙම මුදල කුකුල් පැටවුන් ලබා දීම සහ වෙසක් තොරණක් සෑදීම සඳහා වූ වියමදකින් සමන්විත වන බවත් කුකුල් පැටවුන් ලබා ගැනීම සම්බන්ධයෙන් වන මුදල පියවීමට මහවැලි පශු සම්පත් සමාගම එකඟ වී ඇති නමුත් වෙසක් තොරණ සඳහා වූ වියදම පියවීමට එම ආයතනය එකඟ වී නොමැති බව සභාපති ප්‍රකාශ කරන ලදී.

**නිර්දේශ**

i. මේ පිළිබඳ සොයා බලා අදාල පියවර ගැනීම.

ii. අදාල වෙසක් තොරණ පිළිබඳ පහත සඳහන් විස්තර ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත එවීම.

- තොරණ සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුද?
- ඒ සඳහා වියදම් දරා තිබෙන්නේ කවුද?
- මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පවතීද?
- එවකට සිටි ඇමතිතුමා මේ පිළිබඳ ඉල්ලීමක් කර තිබේද?

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 03. කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අය විය යුතු මුදල

2009 වසරේ සිට පැවත එන කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවිය යුතු රු. 2,092,150/- ක මුදල පිළිබඳ කාරක සභාව විමසන ලදී.

කන්තලේ ප්‍රදේශයේ බඩ ඉරිඟු වගා කිරීම සඳහා ලංකා බැංකු ශාඛාවෙන් ගොවියන්ට ණය ලබා දුන් අතර එම බඩ ඉරිඟු මිලදී ගැනීමට පශු සම්පත් සංවර්ධන මණ්ඩලය බැඳී සිටි බවත්, අදාල ගොවි මහතුන් විසින් ණය මුදල පියවා නොමැති තත්ත්වයක් මත බැංකුව විසින් ආයතනයේ ගිණුමේ ඇති මුදල් රඳවා ගෙන ඇති බවත් සාමාන්‍යාධිකාරීවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. අදාල බැංකු ගිණුමේ විස්තර කාරක සභාව වෙත ලබා දීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 04. වෙලාඩ් ව්‍යාපෘතිය

ආයතනය විසින් වෙලාඩ් රුරල් එක්ස්පෝට්ඩ් පුද්ගලික සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමක් මඟින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ සාර්ථක අසාර්ථකභාවය, එම ව්‍යාපෘතිය සඳහා දරන ලද අධික වියදම, ආනයනය කරන ලද සතුන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් ගැබ් නොගැනීම සහ එවන් අවස්ථාවකදී ගිවිසුමට අනුව ආයතනයට ලබා ගත හැකි සහන පිළිබඳව කාරක සභාව විසින් විමසන ලදී.

ආනයනය කරන ලද්දේ ගැබ් ගත් සතුන් බවත් ලංකාවට පැමිණි පසු ඔවුන් ගබ්සාවීම් වලට ලක් වී ඇති බවත් ආනයනය කළ පසු පළමුවෙන් ලැබුණු පැටව් අදාල අමාත්‍යතුමාගේ උපදෙස් අනුව නොමිලයේ ගොවි පොළවල්වලට බෙදා දුන් බවත්, ව්‍යාපෘතිය සඳහා ගෙනෙන ලද සතුන්ගෙන් බිහි වූ පැටව් නොමිලයේ ගොවියන් අතර බෙදා දීම ව්‍යාපෘතිය අසාර්ථක වීම සඳහා යම් දුරකට බලපෑමක් වූ බවත්, සභාපති ප්‍රකාශ කරන ලදී.

ගිවිසුමට අනුව සහන ලැබිය හැක්කේ ප්‍රවාහනයේදී ගබ්සාවීම් සඳහා පමණක් බවත් ලංකාවට පැමිණි පසු සිදු වන ගබ්සාවීම් සඳහා සහන ලැබිය නොහැකි බවත් අමාත්‍යංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. වෙලාඩ් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනට අමාත්‍යංශය සතුව ඇති පසුබිම් වාර්තාව කාරක සභාව වෙත එවීම.

ii. මෙම ව්‍යාපෘතිය ආරම්භ වූ දින සිට අවසන් වන තෙක් ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් එවීම.

iii. ආනයනය කරන ලද සියළුම සතුන්ගේ විස්තර ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත එවීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

නිර්දේශ අංක i මගින් කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ MER/3-1/2017/NLDB/COPE හා 2017.11.15 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

නිර්දේශ අංක ii මගින් කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ MER/3-1/2017/NLDB/COPE හා 2017.11.10 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කරමින්, ආනයනය කරන ලද සියළුම සතුන්ගේ විස්තර ඇතුළත් වාර්තාව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිගෙන් ලැබුණු පසු නොපමාව කාරක සභාව වෙත ඉදිරිපත් කරන බව වැඩිදුරටත් දන්වා එවා ඇත. නමුත් එම වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 05. වෙලාඩ් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කරන ලද ගෙවීම්

වෙලාඩ් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කරන ලද ගෙවීම් පිළිබඳ කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

**නිර්දේශ**

i. මේ පිළිබඳ පහත තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් කාරක සභාව වෙත එවීම.

- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලද පුද්ගලයන්;
- ගිවිසුමට අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙහි පාර්ශවකරුවන්ද නැද්ද?
- ව්‍යාපෘතියේ වියදම් සහතික කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු ගොවිපොළවල්වල අභ්‍යන්තර පාලනයක් පවතීද සහ එසේ පවතී නම් ඒ සඳහා ක්‍රියාත්මක වන යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ පියවර මොනවාද?

ii. මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශය සහ ජාතික පශු සම්පත් මණ්ඩලය සතු වගකීම් මොනවාද යන්න පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත එවීම.

iii. ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී භාණ්ඩාගාර නියෝජිත නිලධාරීන්ගේ වගකීම කුමක්ද යන්න හා ගිවිසුම් ප්‍රකාරව අදාල පිරිවිතර සපයා තිබේද යන්න පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත එවීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නියෝග කරන ලදී.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාව විසින් ඉල්ලා ඇති උක්ත වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

ඉහත ප්‍රශ්න අංක 05ට අදාලව යොමු කරන ලද වාර්තාවේ වෙලාඩ් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ තොරතුරු අන්තර්ගතව ඇතත්, කාරක සභාව විසින් ඉල්ලා ඇති උක්ත තොරතුරු සියල්ල එමගින් ආවරණය නොවේ.

## 06. <u>ගොවිපොළවල් හි සමහර ගිණුම්වල පවතින අසමානතා - මැණික්පාලම ගොවිපළ</u>

ආයතනය සතු ගොවිපොළවල් අතරින් සමහර ගොවිපොළවල්හි, විශේෂයෙන්ම මැණික්පාලම ගොවිපළේ ගිණුම්වල සංඛ්‍යා ලේඛනවල පවතින අසමානතාවය පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු වූ අතර වර්ෂ කිහිපයක් පාඩු ලබා 2015 වර්ෂයේදී රු.26,608,362/-ක ලාභයක් ද යළිත් 2016 වසරේදී රු. 135,613,497/- ක අලාභයක්ද ලැබීම පිළිබඳ කාරක සභාව විසින් කරුණු විමසන ලදී.

**<u>නිර්දේශ</u>**

i. අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී රු. 135,613,497/- ක් වූ අලාභයේ සංයුතිය පිළිබඳ වාර්තාවක් ලබා දීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම

(රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය)
*(2018.12.28 දිනැති, අංක 2103/33 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම ආයතනය කිසිදු අමාත්‍යාංශ විෂය පථයකට අයත් නොවේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 සැප්තැම්බර් මස 06 වන දින**
**2017 සැප්තැම්බර් මස 20 වන දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

### 01. ආයතනයේ වර්තමාන මූල්‍ය තත්ත්වය

2016.02.12 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට පැමිණෙන විටදී ආයතනයේ තිබූ තත්ත්වය අද වන විට තවත් පහතට වැටී ඇති බැවින් මේ තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ කාරක සභාව විසින් විමසා සිටින ලදී.

මේ සඳහා ආයතනය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

i. ආයතනයට ප්‍රාග්ධනයක් ලෙස මිලියන 150ක් ලබා දෙන ලෙස 2015 දී රජයට යෝජනාවක් ඉදිරිපත් කළද එය සාර්ථක නොවූ බව
ii. මේ වන විට ආයතනයේ 49%ක කොටස් විදේශීය පාර්ශවයකට ලබා දීමට රජය විසින් සාකච්ඡා සිදු කරන බව
iii. ප්‍රතිසංවිධාන සැලැස්මක් (Restructuring Plan) ලබා දී ඇති බව

**නිර්දේශ**

i. ප්‍රතිසංවිධාන සැලැස්මේ (Restructuring Plan) පිටපතක් කාරක සභාව වෙත එවීම.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපතිගේ 2017.09.14 දිනැති ලිපිය මගින් 2015 වසරේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිසංවිධාන සැලැස්ම (Restructuring Plan) හා 2017 අගෝස්තු මස රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද නව ප්‍රතිසංවිධාන යොජනාව කාරක කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

### 02. සමාගම වෙනුවෙන් නව ගුවන් යානා මිලදී ගැනීම.

2016.02.12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මෙම මිලදී ගැනීම් වලට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිපිය කාරක සභාව වෙත ලබා දීමට නිර්දේශ කර ඇතත් ඒවා මේ වන තුරු ඒවා කාරක සභාවට ලබා නොදීම පිළිබඳ විමසන ලදී.

**නිර්දේශ**

පහත සඳහන් තොරතුරු සතියක් ඇතුළත කාරක සභාවට එවීම.

i. අමාත්‍ය මණ්ඩල සංදේශය සහ ඊට අදාල සියලු නිරීක්ෂණ
ii. අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර නොමැති නම්, එය අනවශ්‍ය බවට තීරණය කරන ලද ලිපි/ලේඛන/තොරතුරු
iii. එය අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නම් එහි වාර්තාව
iv. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද අවසාන තීරණය

__වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම__

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපතිගේ 2017.09.14 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති, සමාගම වෙනුවෙන් පළල් බඳ සහිත ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ 2013.03.27 දිනැතිව ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඒ සම්බන්ධයෙන් වූ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ **ඇමුණුම 29** යටතේ ඇතුළත්ය.

## 03. __කල්බදු ගිවිසුම අවලංගු කිරීම__

A – 350 ගුවන් යානා 8න් 4ක මූල්‍ය කල්බදු ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් ආයතනය විසින් රු. මිලි. 16,924.36/- ක් වන්දි ලෙස ගෙවා තිබූ අතර එම ක්‍රියාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇතිදැයි කාරක සභාව විමසා සිටින ලදී.

2017.08.15 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් මේ සඳහා අනුමැතිය ලැබී ඇති බව සභාපති විසින් ප්‍රකාශ කළ අතර එහිදී කාරක සභාවට පහත කරුණු අනාවරණය විය.

i. අදාල මුදල ගෙවා අවසන් වීමෙන් පසු එනම් 2017.08.15 දිනෙන් පසු මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇති බව
ii. එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මෙම ක්‍රියාව ඍජුව අනුමත කර නොමැති අතර එමඟින් ඉදිරිපත් කර ඇත්තේ එවකට මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ පමණක් බව
iii. එම පත්‍රිකාව අත්සන් කර නොමැති බව

__නිර්දේශ__

i. අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය, ඒ සඳහා ඉදිරිපත් වූ සියලුම නිරීක්ෂණ සහ අවසාන තීරණය කාරක සභාවට ලබා දීම.

__වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම__

අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඒ සඳහා ඉදිරිපත් වූ සියලුම නිර්දේශ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපතිගේ 2017.09.14 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 30)**

## 04. __ගිවිසුම අවසන් කිරීමේදී වන්දි ගෙවීම__

ගිවිසුම අවසන් කිරීමේදී මුදලක් වන්දි වශයෙන් ගෙවීමට ආයතනය එකඟ වී තිබූ අතර එම අදාල මුදල තීරණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ගැටලු මතු විය.

- ➢ මෙම මුදල තීරණය කිරීමට පදනම් වූයේ කුමක්ද?

- එය තීරණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
- එම තීරණය ගනු ලැබුවේ කෙසේද?

මේ පිළිබඳ සභාපති විසින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.

- මෙම මුදල අදාල ලීසිං සමාගමෙන් ගණනය කරන ලද්දක් බව
- ඩොලර් මිලියන 90.5ක් ගුවන් යානා 03ක් සඳහා අත්පිට මුදලට ගෙවා ඇති බව
- ගුවන් යානා 03ක් සඳහා තැන්පතු කුලිය වශයෙන් ඩොලර් මිලියන 7.5ක් ආයතනය විසින් රඳවා තබා ගත් බව
- එක් ගුවන් යානයක් සඳහා ඩොලර් මිලියන 17ක් ගෙවා ඇති බව

## 05. <u>A350 ගුවන් යානා පිළිබඳ ගිවිසුමේ අවසානාත්මක වගන්ති නොවීම (Termination Clause)</u>

අදාල ප්‍රශ්නගත ගිවිසුමේ අවසානාත්මක වගන්තියක් අඩංගු නොවීම පිළිබඳ කාරක සභාව සිය අවධානය යොමු කළාය.

ගුවන් යානා මිලදී ගැනීමේ ගිවිසුම්වලට අවසානාත්මක වගන්ති නොමැති බවත් සම්මත ක්‍රමය එය බවත් වෙනත් රටවලද ගුවන් යානා මිලදී ගැනීමේ ගිවිසුම් සඳහා එවන් භාවිත දැකිය හැකි බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. එවන් සම්ප්‍රදායක් විදේශ රටවල් තුළ පවතීද සහ ගිවිසුමක් අතරමඟ නවතා දැමූ විට ඒ සඳහා වන්දි ලෙස සම්පූර්ණ මුදලම ගෙවීම කළ යුතු බවට භාවිතයක් පවතීද යන්න පිළිබඳ වන නිදසුන් සහ සාක්ෂි ඉතා ඉක්මනින් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ඒ සම්බන්ධයෙන් කරුණු වාර්තා කර ඇතත් කාරක සභාව විසින් ඉල්ලා ඇති පරිදි නිදසුන් සහ සාක්ෂි කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 06. <u>2017.04.19 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව</u>

මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් උත්සාහ ගෙන ඇත්තේ අදාල ගිවිසුම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට භාණ්ඩාගාර ලේකම්වරයාට සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ලේකම්වරයාට බලය පවරා ගැනීමට බව කාරක සභාවට අනාවරණය විය.

2017.04.19 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් ඉල්ලා සිටි අනුමැතිය නොලැබුණු බවත් එබැවින් 2017.06.14 වන දින නැවතත් 2017.04.19 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අවධානය යොමු කරමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

පහත සඳහන් තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත එවීම.

i. 2017.04.19 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව

ii. ගෙවීම් කරනු ලබන කාල සීමාව

iii. අදාල අමාත්‍ය මණ්ඩල තීරණ 02 කාරක සභාව වෙත එවීම

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාව විසින් ඉල්ලා ඇති 2017.04.19 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව **(ඇමුණුම 31),** ගෙවීම් කරනු ලබන කාල සීමාව **(ඇමුණුම 32)** හා අදාල අමාත්‍ය මණ්ඩල තීරණ 02 **(ඇමුණුම 33)** කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 07. <u>CCAM Annexure 01 - Option – 15</u>

ගිවිසුම අවලංගු කිරීම සම්බන්ධ ගනුදෙනුව සඳහා 2016 ඔක්තෝබර් මස ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකින් අනුමැතිය ලබා දී ඇති අතර එය විසින් අදාල අනුමැතිය ලබා දී ඇත්තේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ CCAM Annexure 01 - Option – 15 හැර අනෙකුත් කරුණු සම්බන්ධයෙන් පමණක් බව කාරක සභාවට අනාවරණය විය.

ඒ අනුව නිසි අනුමැතියක් යටතේ මෙම කාර්යය සිදු වූවාදැයි දැන ගැනීම සඳහා එම ලේඛනය කාරක සභාවට ගෙන්වා ගැනීම කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.

<u>නිර්දේශ</u>

i. අදාල ලේඛනය කාරක සභාවට එවීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපතිගේ 2017.09.14 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති උත්ක ලේඛන **ඇමුණුම 34** යටතේ ඇතුළත්ය.

## 08. <u>මිලියනයට වැඩි මාසික වේතනයක් ගන්නා නිලධාරීන්</u>

අද වන විට ආයතනයේ මිලියනයට වඩා වැටුප් ලබන නිලධාරීන් 190ක් සිටින බව විගණන වාර්තා මඟින් අනාවරණය විය.

ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, වයස් ප්‍රමාණ, පැවරී ඇති කාර්යයන් පිළිබඳව වාර්තාවක් එවන ලෙස 2016.02.12 වන දින පැවති කාරක සභාවේදී නිර්දේශ කර තිබුණද මේ වන තුරු එම වාර්තාව කාරක සභාව වෙත නොඑවීම පිළිබඳ කාරක සභාවේ නොසතුට පළ විය.

<u>නිර්දේශ</u>

i. අදාල සේවකයන් පිළිබඳ පහත සඳහන් තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාවට එවීම.

   - ➢ අධ්‍යාපන සුදුසුකම්
   - ➢ වයස් ප්‍රමාණ

- පැවරී ඇති කාර්යයන්

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපතිගේ 2017.09.14 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති ලේඛන කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

***ආයතනය 2017.09.06 වැනි දින කැඳවීමෙන් අනතුරුව 2017.09.20 වන දින ප.ව. 2.30ට නැවත වරක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී. එහිදී පහත කරුණු සාකච්ඡාවට බඳුන් විය.***

**01. <u>ගුවන් යානා මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා නොගැනීම</u>**

2013.03.27 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ගුවන් යානා 08 මිලදී ගැනීම පිළිබඳ පහත කරුණු අනාවරණය විය.

- ඒ සඳහා කැබිනට් අනුමැතියක් නොමැති බව
- අමාත්‍ය මණ්ඩල රුස්වීම අනුව "කල් තබන ලදී" ලෙස සටහන් වී ඇති බව **(ඇමුණුම 35)**
- අදාල සංදේශයට එවකට සිටි මුදල් ඇමති අත්සන් තබා ඇති බව
- අදාල ගනුදෙනුව පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය ආයතනයට පවරා නොමැති බව

2013.03.27 අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව සාකච්ඡා කරන ලද 2013.04.16 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීම කල් තැබීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලය තුළ මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඇතිවී තිබේද යන්න පිළිබඳ කාරක සභාව විමසන ලදී.

මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩල ලේකම්ගෙන් විමසීමේදී 2013.04.16 දිනට පසු මෙම ගුවන් යානා සම්බන්ධයෙන් කිසිදු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් හෝ සටහනක් ඉදිරිපත් වී නොමැති බව අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් තහවුරු කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. එම තහවුරු කිරීමේ ලිපිය කාරක සභාවට එවීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPED/IA-1/COPE/SLAL(V-II) හා 2017.10.11 දිනැති ලිපිය මගින් කාරක සභාව විසින් ඉල්ලා ඇති ලේඛනය කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 36)**

## 02. සීබරි ආයතනය විසින් ලබා දුන් වාර්තාව

අද දින කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාව 2017.09.06 දින පොදු ව්‍යාපාර කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවම දැයි කාරක සභාව විමසන ලදී.

තවද අදාල ගනුදෙනුව සම්බන්ධයෙන් ආයතනික මට්ටමින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් ක්‍රියාත්මක වූවාද යන්න පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

සභාපති විසින් පහත කරුණු දක්වන ලදී.

- එය, එම වාර්තාවම බව
- 2017.09.06 දින ඉදිරිපත් කළ වාර්තාවේ සීබරි ආයතනය විසින් අත්සන් කර නොතිබූ බැවින් අත්සන යෙදීම සඳහා මෙම වාර්තාව නැවත සීබරි ආයතනයට යොමු කළ බව
- අද දින ඉදිරිපත් කර ඇත්තේ අත්සන සහිත වාර්තාව බව
- අන්තර්ගතයේ කිසිදු වෙනසක් සිදු නොවී ඇති බව
- ආයතනික මට්ටමින් එවන් කමිටුවක් ක්‍රියාත්මක වී නොමැති බවත් සීබරි ආයතනය සමඟ වැඩ කටයුතු කිරීමට කාරක සභාවක් (Working Committee) පත් කළ බවත් සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

## 03. ගිවිසුම අවසන් කිරීම

2016.09.21 Cabinet Committee on Economic Management (CCEM) මඟින් ඇවර කිරීම සඳහා ඩොලර් මිලියන 75-85 සීමාවක් දක්වා තිබියදීත් එම සීමාව ඉක්මවා ගිය මුදලකින් මෙම කටයුත්ත අවසන් කිරීමට උත්සාහ දැරීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු වූ අතර එම අවම මිල මට්ටමේ සිට ඩොලර් මිලියන 98 ක මිල මට්ටම දක්වා පැමිණි පියවර පිළිබඳ කාරක සභාව විමසන ලදී.

ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ සභාපති විසින් මේ පිළිබඳ කරන ලද පැහැදිලි කිරීමෙන් පහත කරුණු අනාවරණය විය.

i. Aercap සමාගම විසින් ගුවන් යානා 03ක ගිවිසුම අවසන් කිරීම සඳහා ඩොලර් මිලියන 115ක මුදලක් යෝජනා කර ඇති බව

ii. Cabinet Committee on Economic Management (CCEM) මගින් යෝජනා කර තිබූ මිල සඳහා Aercap සමාගම එකඟ නොවූ බව

iii. ඩොලර් මිලියන 115, ඩොලර් මිලියන 98ක් දක්වා අඩු කර ගැනීමට හැකිවූ බව

iv. එම මුදල (ඩොලර් මිලියන 98) වෙනුවෙන් වෙනත් කොන්දේසි සමඟ එකඟ වීමට සිදුව ඇති බව

- සෑම වාරිකයක්ම එකඟ වූ දිනට ගෙවීම.
- A330-200 MSN 627 ගුවන් යානයේ බදු කාලය දස වසරකින් දීර්ඝ කිරීම.
- A330-200 MSN 1008 ගුවන් යානය සඳහා බදු ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම.

- Aercap ආයතනය සතු මිහින් ලංකා ආයතනයට බදු දී ඇති පටු බඳ ගුවන් යානා 02ක් (Narrow Bodied Aircrafts) ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමට පවරා ගැනීම.

v. අදාල මුදල ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වූ බව

vi. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරූ බව

vii. අදාල මුදල තවදුරටත් අඩු කර ගැනීමට නොහැකි වූ නමුත් 2017 වසරේදී එම මුදල ගෙවීමට අවස්ථාව සලසා ගත හැකි වූ බව

මෙම මිල තීරණය කර ගැනීම සඳහා Aercap සමාගම සමඟ සාකච්ඡා කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කළාදැයි කාරක සභාව විමසා සිටි අතර එහිදී පහත කරුණු අනාවරණය විය.

i. තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොමැති බව

ii. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සඳහා කටයුතු කිරීමට ප්‍රධාන විධායක නිලධාරී හට බලය ලබා දුන් බව

iii. ඒ බව අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල සඳහන් බව

iv. CCEM මගින් උපදෙස් ලබා දී තිබියදීත් මේ සඳහා පැවති පළමු සාකච්ඡාවට පමණක් අමාත්‍යාංශය සම්බන්ධ කර ගත් බව

v. ඉන් අනතුරුව පැවති සාකච්ඡා සඳහා අමාත්‍යාංශය සම්බන්ධ කර නොගත් බව

ගිවිසුම අවසන් කිරීම සඳහා තීරණය කර ගත් මිල වූ රු. මිලි. 98, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ බව සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

## 04. <u>ගුවන්යානා ගනුදෙනුව අවසන් කිරීම සඳහා වූ ගිවිසුම</u>

ගුවන්යානා ගනුදෙනුව අවසන් කිරීම සඳහා වූ ගිවිසුම සඳහා නීතිපතිගෙන් legal clearances (නීති නිෂ්කාෂණය කිරීම්) ගෙන තිබේදැයි කාරක සභාව විමසීය.

මේ සඳහා එංගලන්තයේ Aviation Legal Experts නම් ආයතනයෙන් උපදෙස් ලබා ගත් බවත් ඔවුන්ගේ මඟ පෙන්වීම් යටතේ මෙම අවසන් කිරීමේ ගිවිසුම (Termination Agreement) සැකසූ බවත් සභාපති ප්‍රකාශ කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් ආයතනය විසින් නීතිපති විමසා නොමැති අතර අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් දුනහොත් පමණක් නීතිපති විමසන බව අනාවරණය විය.

අමාත්‍යාංශ මට්ටමෙන් නීතිපති විමසූ බව අමාත්‍යාංශ ලේකම් පැවසූ අතර එහිදි නීතිපති විසින් පහත කරුණු දක්වා ඇත.

- මෙම ගුවන් යානා මිලදී ගැනීමට තීරණය කිරීමේදී තම උපදෙස් විමසා නොමැති බැවින් මේ අවස්ථාවේදී ද තම මතය විමසීම අනවශ්‍ය බව
- සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරික තීරණයක් ලෙස මෙම තීරණය ගැනීම ප්‍රමාණවත් බව
- ලංකාණ්ඩුව වශයෙන් මේ සඳහා මැදිහත් වීම අනවශ්‍ය බව

## 05. <u>ගිවිසුම අවසන් කිරීම සඳහා සාකච්ඡාවට සහභාගී වූ පුද්ගලයින්</u>

ගිවිසුම අවසන් කිරීම සඳහා සාකච්ඡාවට සහභාගී වූ පුද්ගලයින් පිළිබඳ කාරක සභාව විමසීමක් කළ අතර එහිදී එම සාකච්ඡා සඳහා එවකට සිටි මුදල් අමාත්‍යතුමාගේ උපදේශකයෙකු වූ ආචාර්ය රාජන් සරා මහතා සහභාගී වීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම කටයුත්ත සඳහා මුදල් අමාත්‍යාංශය සහ ආයතනය පමණක් සහභාගී වීම සහ අදාල අමාත්‍යාංශය වන, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය ඒ සඳහා සහභාගී නොවීම ගැටළු සහගත බව කාරක සභාව දක්වන ලදී.

**<u>නිර්දේශ</u>**

i. ආචාර්ය රාජන් සරා මහතා මුදල් අමාත්‍යාංශයේ හිටපු උපදේශකයෙකු ද එවකට සිටි මුදල් අමාත්‍යතුමාගේ උපදේශකයෙකු ද යන්න පිළිබඳ කාරක සභාවට වාර්තා කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත නියෝග කරන ලදී

ii. පවත්වන ලද සාකච්ඡාවල කාර්ය සටහන් (Minutes) කාරක සභාවට ලබා දීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PE/AV/SLA/COPE & Audit/2017 හා 2017.11.08 දිනැති ලිපිය මගින් කාරක සභාව වාර්තා කර ඇත්තේ ආචාර්ය රාජන් සරා මහතා එවකට මුදල් අමාත්‍යවරයාව සිටි ගරු රවී කරුණානායක මැතිතුමාගේ මූල්‍ය කළමනාකරණ හා විදේශ ආයෝජන කළමනාකරණ උපදේශක තනතුරට අමතරව ගරු සේවයක් ලෙස කාර්ය සාධන කාර්යක්ෂමතා ඒකකයේ ප්‍රධානී තනතුරෙහිද සේවය කර ඇති බවයි.

අදාල පත්වීමේ ලිපියේ පිටපතක් **ඇමුණුම 37** යටතේ හා අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් **ඇමුණුම 38** යටතේ අන්තර්ගතය.

## 06. <u>විස්තරාත්මක වාර්තා</u>

ගුවන් යානා මිලදී ගැනීම පිළිබඳවත්, එහි ගිවිසුම් අවලංගු කිරීම පිළිබඳවත් විස්තරාත්මක වාර්තා 02ක් විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම සහ ඉන් අනතුරුව එම වාර්තා 02 පදනම් කරගෙන සකසනු ලැබූ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සුදුසු බව කාරක සභාවේ මතය විය.

**<u>නිර්දේශ</u>**

i. අදාල තොරතුරු ඇතුළත් විස්තරාත්මක වාර්තා 02ක් පිළියෙල කර කාරක සභාව වෙත ලබා දීම.

ii. එම වාර්තා පදනම් කර ගනිමින් සකසන ලද වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් උක්ත වාර්තාව පිළියෙල කර කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

**ඇමුණුම 29**

# CABINET MEMORANDUM
*Ministry of Civil Aviation*

Cabinet Paper No: 2013/ 07 Date: 27/03/2013
Reference No:MCA/AV/04/100

## WIDE-BODY FLEET REPLACEMENT

### 1. Background

1.1 The wide-body fleet of SriLankan Airlines (SLA) which consist of 13 Aircraft (6-A 340-300 and 7-A 330-200) need to be replaced at the end of their respective lease terms which fall between 2014 and 2019. The age of the wide body fleet at present ranges from 13to 18 years for the A 340s' and from 9 to 13 for the A 330 aircraft.

1.2 The A 340 aircraft has 4 engines and its operating cost is 10% higher than that of a twin engine A 330 – 300 aircraft and is at least 24% higher than a new generation twin engine aircraft. Furthermore, the average age of the wide body fleet being 13.5 years, it is not only uneconomical to maintain, but makes SLA unattractive to customers vis a vis competition who have modern aircraft fleets.

1.3 SLA hence requires new aircraft to replace the current wide body fleet and this can be timed with the return of all existing wide body aircraft to lessors upon expiry of lease terms.

### 2. Rationale

#### 2.1 Aircraft Selection Process

The Board of Directors appointed an internal team led by the Director/CEO (and includes the Chief Operations Officer, Head of Finance and the Head of Engineering) and an External Consultant to assist and provide expert advice to the internal team in the selection process.

Offers were called by way of an RFP/RFI in August 2012 from the two aircraft manufactures (Boeing and Airbus) and two engine manufactures (namely Rolls Royce (RR) and GE Aviation). Available Aircraft models that meet the Operational Requirements are:

- Boeing 787 (new generation) with RR or GE engine
- Airbus A 350 (new generation) with RR engine
- Airbus A 330 with RR or GE engines

The RFP specifically targeted the above models and offers were received from all the manufacturers as requested. The manufacturers were afforded several rounds for clarifications and opportunities to submit revised offers and a final round of meetings/negotiations with all the manufactures was held in February 2013.

000203

**2.2 Aircraft/Engine selection criteria**

1) Availabulity of aircraft to match the return of the leased wide body fleet which commences in the last quarter of 2014.
2) Operating cost of aircraft
3) Overhaul cost of engines
4) Commonality benefits (spares, training, crew utilization)
5) Availability of lease aircraft to fill gaps
6) Aircraft/Engine purchase price and overall benefits measures in terms of Net Present Value (NPV)
7) Other benefits offered by the manufacturer for the development of the aviation industry in Sri Lanka – facilitation of maintenance, technical training, technology transfer.

**2.3. Replacement of 6A 340 Aircraft**

The aging fleet of A 340 aircraft needs to be replaced in the year 2014/2015 as the leases of these aircraft expire during this time frame and these aircraft are also approaching the end of their useful design life, thus there been no other option than replace them with a suitable available aircraft type. The new generation wide body aircraft were not available with the manufactures until 2019, and with Lessors until 2017. Therefore, also considering the commonality with the current fleet, the Airbus A 330 was selected as the most suitable option to replace the A 340 fleet. The A 330- 300 variant is a larger aircraft compared to the current A 330-200 variant used by SLA and has 299 seats compared with the 269 at present and the range and payload is also more aligned to the mission requirements of the airline and is therefore the preferred option. Airbus offered aggressive discounts for the aircraft whilst the RR engine is preferred as it is the engine used in the current fleet and also as considerable discounts in both price and maintenance cost have been offered by RR. The final pricing of the aircraft is given in the Annexure 1.

**2.4. Replacement of 7A 330-200 Aircraft**

The A 330 – 200 Fleet of SLA needs to be replaced commencing 2017, upon lease expiry, and both the Boeing 787 and Airbus A 350 new generation aircraft were considered as suitable options.

Following a through selection process and negotiations with the manufacturers, the A 350-900 has been chosen as the preferred option to replace the A 330 – 200 fleet.

**2.5. Rationale for choosing Airbus A 350- 900 aircraft compared to Boeing 787**

**More room for growth**

- Favoured more strongly over the B 787 in an high growth scenario as the A 350 has 338 seats compared to the B 787 which has 300 seats in a typical two class configuration. Considering that these aircraft will enter service only in 2017, it is considered prudent to have a larger size aircraft in order to harness the envisaged growth potential, both in Sri Lanka, and the Asian Region.

000204

- Allows greater cargo capacity on long routes, including ample cargo capacity on all European services year- round.
- Wider fuselage enables more flexibility in offering innovative premium cabin seats.

**2.6 Lower Cost per Available Seat Kilometre**

- Critical for competing with the large Middle Eastern Carriers, which all have low cost per kilometer due to their scale. The A 350-900 aircraft offers the least cost per kilometer (refer Annexure 2) compared to all the evaluated aircraft.

**2.7. Commonality Benefits**

Pilot training requirements will be simplified by continuing to operate an all – Airbus wide body fleet and Airbus expects that airlines will be able to cross-utilise pilots between the A 330 and A 350 whilst the selection of Boeing will necessitate a separate set of pilots.

**Airbus has been far more engaged in the negotiation process and currently offers a better financial deal**

- Airbus has negotiated aggressively throughout, offering multiple rounds of discounts and concessions worth more than $ 100 million during the final round of negotiations.
- The offered A 350-900 purchase price is lower than the currently offered B 787-9 ~~purchase price, despite the A 350 being a larger aircraft.~~
- The total NPV of the A 330 – 300 /A 350-900 combination is $40 million better than the A330 300/B787-9 combination (refer Annexure 3).
- Airbus will provide a VIP kit for installation in the aircraft valued at USD 15 million which can be used for official visits by the Head of State.

The final negotiated prices are provided in the Annexure 1.

**2.8 Engine Selection**

RR engines are available in both types of aircraft selected by SLA (A 350 and A 330) whilst GE is available on the A 330. RR has offered a very attractive deal for both types taken together and on a net present value basis (considering purchase price and maintenance cost), is USD 5.5 million more attractive than if the GE engines were considered for A 330 (refer Annexure 4). As the current fleet of A 330 aircraft are operating with RR engines, SLA will not be required to train engineers, no investment in tooling will be required and additional spare engine requirement will be minimal.

000205

### 2.9. Benefits offered to the Country

Airbus has offered a USD 25.0 million credit towards purchases made from Airbus to develop aircraft maintenance (MRO) capability in Sri Lanka. Additionally, Airbus has offered USD 6 million in credits to help set up an advance aircraft technical training centre. Sri Lankan intends to utilize a major part of these credits to develop a modern training facility at the HRI airport.

Boeing has not offered any specific benefits in monetary value.

**Funding Requirement**

It is proposed that the 6 nos A 330 – 300 aircraft be funded through a sale and lease back method. However, USD 45 million will be required for initial pre-delivery payments and rent deposit for the Lessor. Being a current generation aircraft it is not proposed to own any of these aircraft due to the downside risk of accelerated depreciation in the future.

The A 350 aircraft is required in 2017, and as it is not available through the manufacturer. We will have to be leased initially (3 aircraft). It is proposed that SL purchase four A 350 aircraft in 2012/21 to be funded by both Sale and Lease back and/or purchase. The exact number of aircraft to purchase outright need not be decided now as there is sufficient time to make that decision. However the initial payments at the time of ordering amounting to USD 15 million will have to be made immediately.

The total cash required within the next six month period, for the complete wide body re-fleeting plan consisting of 10 aircraft to be procured through the manufactures, will amount to approximately USD 80 million.

### 3. Recommendation

Based on the above approval of Cabinet of Ministers is sought:-

1. To purchase of six (6) A330-300 aircraft powered by Rolls Royce Trent 700 engines for delivery commencing in the last quarter of 2014 to 2015.
2. To purchase of four (4) A350 – 900 aircraft powered by Rolls Royce XWB engines delivery to commence in 2020/2021 as replacement for A330-200 aircraft.
3. To lease aircraft for an additional three (3) A350-900 aircraft to be delivered in 2017 as replacement for A330-200 aircraft.
4. To fund for (1) above on sale and lease back method for all six (6) A330 -300 aircraft. As these are current generation aircraft, it is not proposed to own any of them due to the risk of falling value in the future.
5. To make funding available for USD 80 million required for the SLA wide body re-fleeting programme during the second and third quarter of 2013.

Piyankara Jayarathna
Minister of Civil Aviation

**ඇමුණුම 30**

# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
## நிதி, திட்டமிடல் அமைச்சு
## MINISTRY OF FINANCE AND PLANNING

000212

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office } 2484500 2484600 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax } (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website } www.treasury.gov.

මගේ අංකය / எனது இல. / My No. } PE/33/CM/2013
ඔබේ අංකය / உமது இல. / Your No. } 13/0407/545/007
දිනය / திகதி / Date } 2013.04.

**අමාත්‍ය මණ්ඩල සංදේශය**

**<u>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ</u>**

| | | |
|---|---|---|
| **අමාත්‍යාංශය** | : | සිවිල් ගුවන්සේවා |
| **ශීර්ෂය සහ දිනය** | : | ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ~~පළල් බඳ සහිත ගුවන් යානා~~ ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම<br>2013.03.27 |
| **යෝජනාව/ඉල්ලීම** | : | පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ. |

01. A330-300 ගුවන් යානා 06ක් (Rolls Royce Trent 700 එන්ජින් වලින් බල ගැන්වෙන) 2014 වසරේ අවසන් කාර්තුවේ සිට 2015 වසර දක්වා එයාර් බස් සමාගමෙන් මිළ දී ගැනීමට

02. 2020/2021 වසර වලදී A330-200 ගුවන් යානා ප්‍රතිස්ථාපන කිරීම සඳහා A350-900 ගුවන් යානා 04ක් (Rolls Royce XWB එන්ජින් වලින් බල ගැන්වෙන) මිළ දී ගැනීමට

03. 2017 වසරේ දී A330-200 ගුවන් යානා ප්‍රතිස්ථාපන කිරීම සඳහා අතිරේක A350-900 ගුවන් යානා 03ක් කල්බදු ක්‍රමයට ලබා ගැනීමට

000213

04. මෙලෙස නව මාදිලියේ ගුවන් යානා මිළ දී ගැනීමට සැලසුම් කරන්නේ වර්තමාන පරම්පරාවේ ගුවන් යානා මිළ දී ගැනීමෙන් අනාගතයේ දී කඩිනමින් ඇති වන ක්ෂය වීමේ අවදානමට මුහුණ දීමෙන් වැළකීම සඳහාය. එම නිසා ඉහත 01 හි සඳහන් ගුවන් යානා 06ක් කල්බදු හිමියාට ලබා දී ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් කල්බදු ක්‍රමයට ආපසු ලබා ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට

05. ඉහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ පළල් බඳ සහිත ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 80ක මුදල 2013 දෙවන හා තුන්වන කාර්තු වලදී ලබා ගැනීමට

නිරීක්ෂණ : ශ්‍රී ලංකන් ගුවන් සමාගම ස්වාධීන අධ්‍යක්ෂක මණ්ඩලයක් යටතේ පාලනය වන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද පොදු සමාගමක් වන අතර ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම මීට පූර්ව ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කල පරිදි සිදු කිරීම සභාපති, ප්‍රධාන විධායක නිළධාරී හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් බව නිරීක්ෂණය කරමි.

ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම මූල්‍යමය වශයෙන් ගුවන් සමාගම ශක්තිමත් වන අයුරින් සහ ප්‍රාග්ධනකරණය ශක්තිමත් වන අයුරින් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලාගත යුතු බව වැඩිදුරටත් නිරීක්ෂණය කරමි.

(signature)

මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

රහස්‍යභාවය

000372

RECEIVED
Secretary's Office
25 AUG 2017
Ministry of Public Enterprise Development

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION | අමාත්‍ය මණ්ඩල තීරණය | அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
නීතිපතිතුමා.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක.ලේකම්.
අධිකරණ ලේකම්.
සංවර්ධන උ. හා ජාත්‍යන්තර
වෙ.ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/1757/733/006
2017 අගෝස්තු මස 23 දින.

ක්‍රියා කළ යුතු : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්.

**ශ්‍රී ලංකන් ගුවන් සේවය - A350 - 900 පුළුල් බඳ ගුවන් යානා තුනක් ලබා ගැනීමේ කල්බදු ගිවිසුම අවලංගු කිරීම**

(රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-08-09 දිනැති සංදේශය)

2017 අගෝස්තු මස 15 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:**

26. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1757/733/006-V වූ, "**ශ්‍රී ලංකන් ගුවන් සේවය - A350 - 900 පුළුල් බඳ ගුවන් යානා තුනක් ලබා ගැනීමේ කල්බදු ගිවිසුම අවලංගු කිරීම**" යන මැයෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-08-09 දිනැති සංදේශය - (අමප අංක 17/1535/733/006-IV පිළිබඳව වූ 2017-07-25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

→ 2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2329621 දුරකථන අංකය මඟින් අතිරේක ලේකම් විමසීම මැනවි.

- 2 -

(i) 2017-04-19 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි, අදාළ ගිවිසුමේ කොන්දේසි හා අනුකූල වන බව තහවුරු කරගැනීම පිණිස, එකී ගිවිසුමෙහි අන්තර්ගත කරුණු සැලකිල්ලට ගෙන, මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමා සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමා විසින් ගනු ලැබිය යුතුව ඇති කුමන හෝ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්ට සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ට බලය පැවරීම සඳහා අනුමැතිය ලබා දීම;

(ii) ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් සිදු කරනු ලැබ ඇති පහත සඳහන් ගනුදෙනුවලට අදාළ සිදුවීම් දාමය හා ඒ සම්බන්ධයෙන් වන මූල්‍ය වගකීම් පිළිබඳ තොරතුරු දක්වමින් විස්තරාත්මක වාර්තාවක්, සති දෙකක් (02) තුළ, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටීම:

(අ) A350 - 900 පුළුල් බඳ ගුවන් යානා තුනක් (03) සම්බන්ධයෙන් කල්බදු ගිවිසුමකට එළඹීම; සහ

(ආ) A350 - 900 ගුවන් යානා හතරක් (04) සම්බන්ධයෙන් මිල දී ගැනීමේ ගිවිසුමකට එළඹීම.

ක්‍රියා කළ යුතු: **මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය** - ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**නීතිපතිතුමා** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**අග්‍රාමාත්‍ය ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**අධිකරණ අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

ඇමුණුම 31

CABINET MEMO (01)

CABINET MEMORENDOM

000367

Ministry of Public Enterprise Development

Cabinet Memorandum No. : 2017/16

Reference No : MPED/01/02/CM 2017 Date : 19.04.2017

SriLankan Airlines-Termination of lease Agreement to purchase three A350-900 Airbus wide bodied aircraft

Overview

01. This refers to the Cabinet Memorandum no: අමප අංක 2017/02 and dated 08/02/2017 submitted by Hon. Minister of Public Enterprise Development, the cabinet decision no: අමප අංක 17/0336/733/006 and dated 21/02/2017 and Cabinet Decision on note to the Cabinet submitted by Hon. Minister of Public Enterprise Development, no: අමප අංක 17/0432/733/006-I and dated 28.02.2017 on the captioned matter.

02. SriLankan Airlines had entered into an agreement in 2013 to lease four Airbus A350-900 aircrafts at an approximate cost of US$1.45 million per month per aircraft over a 12 year period. The total cost of this arrangement was to be US$ 835.2 million.

03. With the proposed network optimization initiatives and the review of the airline operations undertaken by the Government of Sri Lanka (GoSL) in early 2015, it became apparent that the four Airbus A350-900 aircrafts were not suitable as new additions to the fleet.

04. International Aviation Specialists Consultants were engaged by SriLankan Airlines to advise the company on restructuring the operations and lead them towards an improvement in their operations. In the course of their analysis, they confirmed that operating the Airbus A350-900 wide bodied aircrafts that were on order would affect the profitability of the airline operations adversely. The Ministries of Finance and Public Enterprise Development were advised accordingly by the consultants.

05. SriLankan Airlines also calculated the revenue and costs associated with the operation of the Airbus aircrafts, which substantiated the findings of the consultants:

06. Consequently, the restructuring plan that was prepared for SriLankan Airlines did not include the operation of these (A350-900) aircrafts.

07. In June 2015, Cabinet approved the Restructuring Plan for SriLankan Airlines.

000368

08. According to SriLankan Airlines, International aviation lawyers were then engaged by Sri Lankan Airlines to advise the company on handling negotiations for the termination of the leases to the 3 airbus A350-900 aircrafts.

**Methodology - Negotiations to terminate lease**

09. Negotiations with the lessor (AerCap) commenced at the end of October 2015 while other avenues of placing the A350-900 aircraft were also explored.

10. SriLankan Airlines managed to negotiate a termination of the lease on the $4^{th}$ aircraft, due for delivery in November 2017 for a termination fee of US$17.7 million.

11. The Cabinet Committee on Economic Management (CCEM) was given a detailed update on the status of the negotiations on 24 August 2016 by SriLankan Airlines.

12. SriLankan Airlines was subsequently authorized by CCEM to negotiate a Termination Fee for the 3 aircrafts within the range of US$ 75-US$85 million.

13. After further negotiations, SriLankan Airlines reported to CCEM on $21^{st}$September 2016 that,

a) The Termination Fee had been renegotiated:
b) The Termination Fee had been reduced from US$ 154 million to US$ 98 million
c) The reduction in the Termination Fee was conditional upon
d) Leasing of a used Airbus 330-200 aircraft and
e) The extension of a lease on an aircraft already leased.
f) SriLankan Air Lines take over the lease on 2 narrow bodied aircrafts owned by AerCap and leased to Mihin Lanka.

14. At the CCEM on 21 September 2016, the Hon Ministers of Finance and Public Enterprise Development agreed to contact the lessor and negotiate directly with them.

15. The CCEM was briefed by SriLankan Airlines on the termination offers at the meeting held on 28 September 2016.

16. The CCEM instructed the Hon. Minister of Finance to obtain a written statement from the lessor stating these conditions. CCEM also instructed the Hon. Minister of Finance to verify with the IMF on whether these payment terms were compliant with IMF conditions. If they were in accordance with the conditions, the agreement was to be accepted. If however the payments terms were incongruent with the IMF conditions. The lessor was to be so informed and the matter was to be negotiated further.

000369

**Outcome**

17. in view of the imminent delivery of the aircraft, based on the discussion and agreement reached at the Finance Ministry on 1 October 2016 , the "No Objection" received from the Ministry of Finance and approval from the Hon Prime Ministers, SriLankan Airlines signed the Termination Agreement in line with the terms agreed by the Ministry of Finance as follows, (for a payment of US$ 154 million which would be reduced to US$98 million on SriLankan Airlines meeting the terms and conditions as stipulated below).

| | US$M |
|---|---|
| • Termination Fee for 3 Airbus A350-900 aircrafts | 154.0 |
| • Reduced Termination Fee for 3 Airbus A350-900 aircrafts | 98.0 |
| • Forfeit Security Deposit( already paid) | (7.5) |
| Cash Payment from SLA | 90.5 |

Schedule of Payments

| | |
|---|---|
| o Immediate | 10.5 |
| o 2 January 2017 | 13.5 |
| o 2 February 2017 | 13.3 |
| o 2 March 2017 | 13.3 |
| o 3 April 2017 | 13.3 |
| o 2 May 2017 | 13.3 |
| o 2 June 2017 | 13.3 |
| o 30 June 2017 | 56.0 * |

* If following conditions are satisfied in full, Lessor agreed to waive the final installment.

Conditions to be satisfied by SriLankan Airlines as part of the settlement Package:

- Pay each instalment of the Termination Fee by the agreed date:
- Extend the current lease on A330-200 MSN 627 aircraft for 10 years by 30 November 2016
- Execute the lease agreement the A330-200 MSN 1008 Aircraft by 30 November 2016
- SriLankan Airlines take over the leases on 2 narrow bodied aircrafts owned by AerCap and leased to Mihin Lanka.

If SriLankan Airlines fails to fulfil any or all of the above conditions, the Terminations fee will not be reduced to US$ 98 million (termination fee US$146.5 + security deposit 7.5). In addition, any delay in payments to accrue an annual interest rate of 3% plus JP Morgan Chase, NY published interest rate.

**Recommendation**

18.To note and place on record accurately ,the sequence of events as they occurred that SriLankan Airlines Ltd confirm the AerCap settlement reached for the termination of the lease relating to three Airbus A350-900 aircrafts was the best possible outcome at the time.

000370

**Approval**

To seek approval of the Cabinet of Ministers for the following:

a) To authorize the Secretary of Treasury and the Secretary of Public Enterprise Development, to note the contents of the agreement and facilitate any actions that may be required by the Ministry of Finance and the Ministry of Public Enterprise Development to ensure compliance with the terms of the agreement.

**Kabir Hashim (M.P.),**
Minister of Public Enterprise Development

**Ravi Karunanayeke (M.P.),**
Minister of Finance.

<u>ඇමුණුම 32</u>

447-1

| Pre-Delivery Payment Schedule - | |
|---|---|
| Payment Value - USD Mn | Settlement Date |
| 10.5 | Oct-16 |
| 13.5 | Jan-17 |
| 13.3 | Feb-17 |
| 13.3 | Mar-17 |
| 13.3 | Apr-17 |
| 13.3 | May-17 |
| 13.3 | Jun-17 |
| **90.5** | |

**ඇමුණුම 33**

රහසිගතයි

000430

RECEIVED
Secretary's Office
04 AUG 2017
Ministry of Public Enterprise Development

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක.ලේකම්.
මුදල් හා ජනමාධ්‍ය ලේකම්.
සංවර්ධන උ.හා ජාත්‍යන්තර වෙ.ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/1535/733/006-IV
2017 අගෝස්තු මස 02 දින.

ක්‍රියා කළ යුතු : අග්‍රාමාත්‍ය ලේකම්.
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්.

**ශ්‍රී ලංකන් ගුවන් සේවයේ A350 - 900 පුළුල් බඳ ගුවන් යානා 03 ක් මිල දී ගැනීමේ කල්බදු <u>ගිවිසුම අවලංගු කිරීම</u>**

(රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-07-12 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන)

2017 ජූලි මස 25 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:**

(I) **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:**

27. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1535/733/006-IV වූ, "ශ්‍රී ලංකන් ගුවන් සේවයේ A350 - 900 පුළුල් බඳ ගුවන් යානා 03 ක් මිල දී ගැනීමේ කල්බදු ගිවිසුම අවලංගු කිරීම" යන මැයෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-07-12 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන - (අමප අංක 17/1210/733/006-III පිළිබඳව වූ 2017-06-27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සටහන, අමප අංක 17/1124/733/006-II වූ, මුදල් ඇමතිතුමා සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමා විසින් මෙම විෂය පිළිබඳවම ඉදිරිපත් කරන ලද 2017-04-19 දිනැති ඒකාබද්ධ සංදේශය සහ මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

→ 2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2329621 දුරකථන අංකය මඟින් ...

1431

- 2 -

(i) මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සිදු කරන ලද නිරීක්ෂණවල අවධාරණය කරනු ලැබ ඇති කරුණු සැලකිල්ලට ගනිමින්, සිය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, මෙම කරුණ, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සභාපතිත්වය දරනු ලබන ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව වෙත යොමු කිරීම; සහ

(ii) ඉහත (i)හි පරිදි, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව විසින් සිදු කරනු ලබන නිර්දේශ, සලකා බැලීම පිණිස, ඇමතිතුමා මඟින් සංදේශයක් ලෙස, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම.

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: **අග්‍රාමාත්‍ය ලේකම්** - ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.

000433

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
## MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் தளங்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: MF/PE/CM/2017/104
ඔබේ අංකය / உமது இல. / Your No.: CP 17/1535/733/006-IV
දිනය / திகதி / Date: 2017.07.2

අමාත්‍ය මණ්ඩල සටහන

<u>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ නිරීක්ෂණ</u>

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය | : | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන |
| ශීර්ෂය සහ දිනය | : | ශ්‍රී ලංකන් ගුවන් සේවයේ A 350- 900 පුළුල් බඳ ගුවන් යානා 03 ක් මිලදී ගැනීමේ කල්බදු ගිවිසුම අවලංගු කිරීම<br>2017.07.12 |
| යෝජනාව/ඉල්ලීම | : | මුදල් අමාත්‍යවරයා සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා විසින් අංක 17/1124/733/006-II දරණ 2017.04.19 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් කරන ලද ඉල්ලීමට අනුමැතිය ලබාදීම සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයේ අවධානය අපේක්ෂා කිරීම |
| නිරීක්ෂණ | : | අ) සටහන් කර ගනිමි.<br>ආ) අංක 17/1124/733/006-II සහ 2017.04.19 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ තොරතුරු අනුව A 350-900 ගුවන් යානා 03 ක් මිලදී ගැනීමේ ගිවිසුම දැනටමත් අවලංගු කර ඇති අතර අමාත්‍ය මණ්ඩලයේ විධිමත් අනුමැතියකින් තොරව ශ්‍රී ලංකන් ගුවන් සමාගම එකඟ වූ සියළු ගෙවීම්ද සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.<br>ඇ). කෙසේවෙතත්, ආර්ථික කළමනාකරණ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් 2016.09.28 දින එහි පැවති රැස්වීමේදී දෙන ලද උපදෙස් පරිදි ගිවිසුම් අවලංගු කිරීමට පෙර නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගෙන තිබේද යන්න පිළිබඳ පැහැදිළි සඳහනක් නොමැත. |

000434

04/07 2017 12:36 RECEIVED FROM +94112484809

ඇ) එසේම මෙම ගිවිසුම් අවලංගු කිරීමේදී පහත සඳහන් කොන්දේසි පිළිබඳව ආර්ථික කළමනාකරණ අමාත්‍ය මණ්ඩල කමිටුවේ අනුමැතිය ලබා ගෙන තිබේද යන්න පැහැදිලිව සඳහන් කර නොමැත.

1.වාරික ගෙවීම පිළිබඳ එකඟ වූ සැලැස්ම

2.AerCap විසින් මිහින් ලංකා සමාගමට කල්බදු ක්‍රමය මත ලබා දී තිබූ පටු බඳ සහිත ගුවන්යානා දෙකක් ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් පවරාගැනීම

ඉ) එබැවින් මේ සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

මංගල සමරවීර, පා.ම.
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

**ඇමුණුම 34**

රහසිගතයි

000443 18 NOV 2016
පාර්ලිමේන්තු කටයුතු අංශය
අග්‍රාමාත්‍ය කාර්යාලය

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION | අමාත්‍ය මණ්ඩල තීරණය | அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා ආර්.
ක.ලේකම්.
මුදල් ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/16/2301/702/003-XXXV
2016 නොවැම්බර් මස 16 දින.

ක්‍රියා කළ යුතු : අග්‍රාමාත්‍ය ලේකම්.
අනෙකුත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්.

**2016 ඔක්තෝබර් 26 දින පැවති ආර්ථික කළමනාකරණය**
**<u>පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභා රැස්වීමේ වාර්තාව</u>**

(ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ 2016-10-31 දිනැති සංදේශය)

2016 නොවැම්බර් මස 08 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්;**

(I) **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:**

06. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/2301/702/003-XXXV වූ, "2016 ඔක්තෝබර් 26 දින පැවති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභා රැස්වීමේ වාර්තාව" යන මැයෙන් අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ 2016-10-31 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය, අතිගරු ජනාධිපතිතුමාගේ සහ මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදුව, අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

(I) සංදේශයේ ඇමුණුම - 1හි සඳහන් විෂය අංක 15 හැර, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව විසින් තීරණය කරන ලද, එහි සඳහන් ක්‍රියාමාර්ග සඳහා සිය එකඟතාව ලබා දීම;

→2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2329621 දුරකථන අංකය මඟින් අතිරේක ලේකම් විමසිම වැනවි.

000449

- 02 -

(II) පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්වරයාට දැනුම් දීම;

(i) සංදේශයේ ඇමුණුම - 1හි සඳහන් විෂය අංක 03, 04, 05 සහ 15 පිළිබඳ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ නිර්දේශ/තීරණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන, ඒ අනුව ක්‍රියා කිරීම;

(ii) අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණවල අවසන් ඡේදයේ දක්වා ඇති පරිදි, පහත සඳහන් කරුණුවලට අදාළව, එනම්:

(අ) රජයේ ප්‍රතිපත්තිමය කරුණු හා සම්බන්ධ වෙනස්වීම්වලට අදාළ කරුණු;

(ආ) රජයේ අරමුදල් සැලකිය යුතු අන්දමින් වැය වන ආකාරයේ යෝජනා; සහ

(ඇ) විශේෂයෙන්ම පාරිසරික බලපෑම් සහිත මහා පරිමාණ ව්‍යාපෘති;

සම්බන්ධයෙන්, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ නිර්දේශ/තීරණ ද සමඟින් වෙන් වෙන් වශයෙන්, අමාත්‍ය මණ්ඩල සංදේශ, සලකා බැලීම පිණිස, සිය අමාත්‍යවරුන් මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ට නියම කිරීම.

ක්‍රියා කළ යුතු: **අග්‍රාමාත්‍ය ලේකම්** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**අනෙකුත් සියලුම අමාත්‍යාංශ** - ඉහත (II) (ii)හි පරිදි ක්‍රියා කිරීම පිණිස - අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**මුදල් අමාත්‍යාංශය** - අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.

000452

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

__නිරීක්ෂණ__

අමාත්‍ය මණ්ඩල සංදේශ අංක : 16/2301/702/003-XXXV

__2016 ඔක්තෝබර් මස 26 වන දින පැවති ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභා රැස්වීමේ (CCEM) වාර්තාව__

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර ඇති උක්ත සංදේශයේ පහත උප ශීර්ෂ පිළිබඳව මාගේ නිරීක්ෂණ දක්වනු කැමැත්තෙමි.

__26/10/2016/03 - බදු සමාව__

යෝජිත බදු සමාවන් ප්‍රකාශයට පත් කරන අවස්ථා වලදී ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

__26/10/2016/04 - යූ බී ෆිනෑන්ස් සමාගම විසින් කරන ලද ඉල්ලීම (2016/09/14 දිනැති CCEM තීරණය ප්‍රකාරව)__

කොළඹ කොටස් වෙළඳපොළ සහ ශ්‍රී ලංකා මහ බැංකුව, යූ. බී. ෆිනෑන්ස් සමාගම කොටස් වෙළඳපොළේ ලියාපදිංචි වීමට යෝග්‍යතාවයක් නොමැති බවට නිර්දේශ ලබාදී ඇති අවස්ථාවක ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව මේ සම්බන්ධව මැදිහත් වී ක්‍රියා කරන්නේ මන්ද යන්න පැහැදිලි නොමැත.

__26/10/2016/05 – පුත්තලම දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක කසල රඳවනයක් ඉදි කිරීම__

යෝජිත සනීපාරක්ෂක කසල රඳවනය ඉදිකිරීමට නියමිත ස්ථාන පිළිබඳ අවසන් වශයෙන් එළඹෙන තීරණය, අමාත්‍ය මණ්ඩලයේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කිරීම සුදුසු යයි නිර්දේශ කරමි.

__26/10/2016/15 - ශ්‍රී ලංකන් ගුවන් සේවය සතු ගුවන් යානා (A330) ත්‍රිත්වයක් අවලංගු කිරීම__

මේ කරුණ වෙනම අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස යොමු කිරීම මැනවි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

000453

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව විසින්, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධ වෙනස්වීම්, විශාල වශයෙන් මහජන අරමුදල් වැය කරන ව්‍යාපෘති හා විශේෂයෙන්ම, පරිසරයට බලපෑම් ඇති කළ හැකි විශාල ව්‍යාපෘතීන් අදාළ අමාත්‍යාංශ මගින් වෙන වෙනම සංදේශ මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු යයි තීරණය කිරීම සුදුසුය.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති

2016 නොවැම්බර් මස 07 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**ඇමුණුම 35**

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
උපාය මාර්ගික ව්‍යා.කළ.
ආය.සභාපති/ප්‍ර.වි.නි.
විගණකාධිපති.

මගේ අංකය: අමප/13/0407/545/007
2013 අප්‍රේල් මස 26 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

ක්‍රියා කළයුතු: සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්.

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ පළල් බඳ සහිත
ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම

(සිවිල් ගුවන් සේවා ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2013-03-27 දිනැති සංදේශය)

2013 අප්‍රේල් මස 18 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය

27. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 13/0407/545/007 වූ, "ශ්‍රී ලංකන් ගුවන් සේවයේ පළල් බඳ සහිත ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම" යන මැයෙන් සිවිල් ගුවන් සේවා ඇමතිතුමා ඉදිරිපත් කළ 2013-03-27 දිනැති සංදේශය - දැනට කල් තබන ලදී.

ක්‍රියා කළයුතු: අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

පිටපත්: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී, උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය

**(B) Agenda Items:**

**(I) Cabinet Papers - General**

27. Cabinet Paper No.13/0407/545/007, a Memorandum dated 2013-03-27 by the Minister of Civil Aviation on **"Wide - Body Fleet Replacement of Sri Lankan Airline"** - was deferred for the time-being.

Action by: **Secretary to the Cabinet**
**My/Civil Aviation**

Copied to: **My/Finance and Planning**
**Chairman/CEO, SEMA**

Checked by : 1..........
2..........

ඇමුණුම 36

Addl: Secy / D. Avi.    'Urgent'

Fax No. 2323740 / 2380151

RECEIVED
Secretary's Office
14 SEP 2017
Ministry of Public Enterprise Development

A-/COPE

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

Web Site: www.cabinetoffice.gov.lk
E-mail: info@cabinetoffice.gov.lk

ජනරජ ගොඩනැගිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01,
குடியரசுக் கட்டடம், சேர் பாரோன் ஜயதிலக்க மாவத்தை, கொழும்பு 01.
Republic Building, Sir Baron Jayathilaka Mawatha, Colombo 01, Sri Lanka.

My No.: 13/0407/545/007-I    Your No.: MPED/AH/01/01/Vol-II    Date: 2017-09-13

Mr. Ravindra Hewavitharana
Secretary,
Ministry of Public Enterprise Development,
Level 7, West Tower, Echelon Square,
Colombo - 01.

**Re-fleeting SriLankan Airlines with wide bodied Aircraft**

Reference is requested to your letter dated 2017-09-11 on the above matter.

02. When the Cabinet Memorandum on "Wide-Body Fleet Replacement", by then Minister of Civil Aviation, dated 2013-03-27 was taken up for discussion at the Cabinet Meeting held on 2013-04-18, the Cabinet decided to defer the matter for the time being, and the Cabinet decision was sent to the relevant line Ministry at the time. I presume that the observation of then Minister of Finance and Planning pertaining to the said Memorandum, which is referred in para 03. I of your letter is the one that should have been transmitted to the then line Ministry, via fax, with the draft decision on the same.

03. On a perusal of the documents attached to your letter, I observe that the said Cabinet Memorandum and the relevant Cabinet decision (draft) are already in your possession. Therefore, in response to your request in para 03. A, I attach herewith a copy of the 'official Cabinet decision' dated 2013-04-18 (Annexure I), which was issued after the confirmation of that decision at the subsequent Cabinet Meeting, and the following observations pertaining to the above-mentioned Cabinet Memorandum.

(i) A signed copy of the observations submitted by the then Minister of Finance and Planning (Annexure II).
(ii) Observations submitted by the then Minister of National Languages and Social Integration, dated 2013-04-17 (Annexure III).
(iii) Observations submitted by the Central Bank of Sri Lanka, dated 2013-04-18 (Annexure IV).
(iv) Observations submitted by Strategic Enterprise Management Agency (SEMA), dated 2013-04-10 (Annexure V).

...retary: 2329620    Additional Secretary: 2325279, 2329621    Senior Assistant Secretary: 2431004

05. I wish to state that further Cabinet decisions or observations are not available according to the records at this office, pertaining to lease or purchase of A350-900 wide bodied aircraft except the one, which has been mentioned in para 03.V of your letter.

**S. Abeysinghe**
Secretary to the Cabinet of Ministers

**ඇමුණුම 37**

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office } (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax } (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website } www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } MF 1 / 01/04/01/47
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2016.03 10

ආචාර්ය රාජන් සාරා මහතා

466/5,7-3

කොල්ලුපිටිය පාර

සී ඇවෙනිව්, කොළඹ 03

මහත්මයාණෙනි,

<u>ගරු මුදල් අමාත්‍යතුමාගේ මූල්‍ය කළමනාකරණ හා විදේශීය ආයෝජන කළමනාකරණ උපදේශක තනතුරට කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම</u>

2016.03.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඔබ, ගරු මුදල් අමාත්‍යතුමාගේ මූල්‍ය කළමනාකරණ හා විදේශීය ආයෝජන කළමනාකරණ උපදේශක තනතුරට 2016.01.01 දින සිට වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති බව සතුටින් දන්වමි.

02. මෙම තනතුර සඳහා ඔබට මසකට රුපියල් 250,000/-ක දීමනාවක් හා අතිරේක ලේකම්වරයෙකුට හිමි අනෙකුත් වරප්‍රසාද ලබාදෙනු ඇත.

03. නව තනතුරේ රාජකාරි භාරගෙන ඒ බව මා වෙත දැන්වීමට කටයුතු කරන්න.

මෙයට විශ්වාසී

(අත්සන)

ආර්.එච්.එස්. සමරතුංග

ලේකම්

පිටපත්

1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු. දැ.ගැ.ස.
4. ගරු මුදල් අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - කරු. දැ.ගැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි, මුදල් අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6. විගණකාධිපති - කරු. දැ.ගැ.ස.

**ඇමුණුම 38**

/හසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය

அமைச்சரவை அலுவலகம்

OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION — අමාත්‍ය මණ්ඩල තීරණය — அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක.ලේකම්.
රාජ්‍ය ව්‍යවසාය සං.ලේකම්.
රාජ්‍ය පරිපාලන හා කළ.ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/0342/719/033
2017 මාර්තු මස 01 දින.

ක්‍රියා කළ යුතු : මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

**කාර්යසාධන හා කාර්යක්ෂමතා**
**කළමනාකරණ ඒකකය (PEM Unit)**

(මුදල් ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-02-13 දිනැති සංදේශය)

2017 පෙබරවාරි මස 21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:**

23. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/0342/719/033 වූ, "**කාර්යසාධන හා කාර්යක්ෂමතා කළමනාකරණ ඒකකය (PEM Unit)**" යන මැයෙන් මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-02-13 දිනැති සංදේශය - (අමප අංක 16/2045/719/088-I පිළිබඳව වූ 2016-10-25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සංදේශයේ හතරවන ඡේදයේ සඳහන් (අ) සහ (ආ) යෝජනා සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

මුදල් ඇමතිතුමාගේ මූල්‍ය කළමනාකරණ හා විදේශීය ආයෝජන කළමනාකරණ උපදේශක ආචාර්ය රාජන් සාරා මහතා නිර්වේතනික පදනම මත, කාර්යසාධන හා කාර්යක්ෂමතා කළමනාකරණ ඒකකයේ ප්‍රධානී වශයෙන් කටයුතු කරන බවද අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2329621 දුරකථන අංකය මගින් අතිරේක ලේකම් විමසීම ...... 2

# මාර්ග සංවර්ධන අධිකාරිය

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය)

*(2018.12.28 දින සිට මෙම ආයතනය මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 සැප්තැම්බර් මස 19 වන දින**

## සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

## 01. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය

ආයතනය සම්බන්ධව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද වාර්තාවට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ පහත කරුණු අනාවරණය වන බව කාරක සභාවේ සභාපති විසින් සඳහන් කරන ලදී.

i. 2016 වර්ෂය අවසන් වන විට වැඩ නිම කිරීමට යෝජිත, කොන්ත්‍රාත් පිරිවැය රු. මිලි. 16,771.37 ක් වූ කොන්ත්‍රාත් 342 ක වැඩ අවසන් කර නොතිබීම හා එම ව්‍යාපෘති වල ප්‍රමාදවීම් වලට හේතු වාර්ෂික ප්‍රගති වාර්තාවේ දක්වා නොතිබීම.

ii. 2016 දෙසැම්බර් 31 වන දිනට ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලි. 7,778.44 ක් වූ ව්‍යාපෘති 114ක වැඩ සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ වී නොතිබීම හා එම ව්‍යාපෘති 114න් 39ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග වලට අදාළ ව්‍යාපෘති වීම.

මෙහිදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවලට අමතරව, ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම සඳහාද භාණ්ඩාගාරය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ප්‍රතිපාදන නිකුත් කරනු ලබන බවයි.

### නිර්දේශ

i. මෙම ව්‍යාපෘති වල වැඩ අවසන් කිරීමට ප්‍රමාද වූ හේතු පිළිබඳ වාර්තාවක් සති 02ක් තුළ විගණකාධිපතිටද පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වෙත නියෝග කරන ලදී.

ii. මෙම ව්‍යාපෘති 114 දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාප්ත වී ඇත්තේ කෙසේද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ලබා දීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත උපදෙස් දෙන ලදී.

iii. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග (Non-RDA) සෑදීමට අවශ්‍ය කරන බලතල හා නීතිමය රාමුව සකසා ගැනීම.

### වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

ඉහත නිර්දේශ අංක i මගින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 02. <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

පහත සඳහන් කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

i. මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සහ මාර්ග නඩත්තු කිරීම් සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, මාර්ග ඉදි කිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම, ප්‍රාග්ධන වත්කම් හා පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබීම.

ii. අධිකාරියේ කාර්ය සාධනය පිළිබඳ පහත දත්ත සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද කාරක සභාව විසින් මධ්‍යගත ප්‍රසම්පාදන සැලැස්මක් නොතිබීම නිසා ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වී ඇති බව අවධාරණය කරන ලදී.

- 2014 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන රු. මිලි. 135,706න් රු. මිලි. 126,000ක් වියදම් කර ඇති බවත්,
- 2015 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන රු. මිලි. 191,214න් රු. මිලි. 173,000ක් වියදම් කර ඇති බවත්,
- 2016 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන රු. මිලි. 171,988න් රු. මිලි. 145,000ක් වියදම් කර ඇති බවත්,

මෙහිදී අධිකාරියේ සභාපති විසින් භාණ්ඩාගාරයෙන් වෙන් වන ප්‍රතිපාදන අනුව ප්‍රාදේශීය වශයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති බවත් එම ප්‍රතිපාදන වෙන් වීමේ ප්‍රායෝගික ගැටලු නිසා මධ්‍යගත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති බවත් හා ඉදිරියේදී නොපමාව එම සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

මෙහිදී, අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලද්දේ, මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන ප්‍රතිපාදන වලින් වැඩි කොටසක් වෙන් වන්නේ ව්‍යාපෘති සඳහා බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා සිදු කරනු ලබන සියලුම ප්‍රධාන මිලදී ගැනීම් වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ප්‍රසම්පාදන සැලසුම් සකස් කරනු ලබන බවත්ය.

<u>නිර්දේශ</u>

i. අමාත්‍යාංශ මට්ටමෙන් සකසනු ලබන ප්‍රසම්පාදන සැලැස්ම, විගණකාධිපතිටද පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාව විසින් ඉල්ලා ඇති ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 03. <u>උපදේශකයන් හා මහජන සම්බන්ධතා නිලධාරීන් පත් කිරීම</u>

2016.07.08 වන දින පැවැති කාරක සභාව විසින් ලබා දී ඇති විධාන ක්‍රියාත්මක කිරීම යටතේ උපදේශකයන් හා මහජන සම්බන්ධතා නිලධාරීන් පත් කිරීම සම්බන්ධව අධිකාරිය විසින් ලබා දී ඇති පිළිතුරු වාර්තාව අනුව නිරීක්ෂණය වන පහත කරුණු සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය.

i. 2006 වසරේ සිට සේවය ලබා ගත් උපදේශකයන්ගේ හා මහජන සම්බන්ධතා නිලධාරීන්ගේ සේවය 2015.01.12 දිනට අවසන් කර ඇති බව.

ii. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය රහිතව 2016.12.31 දිනට නව උපදේශකයන් හා මහජන සම්බන්ධතා නිලධාරීන් 43 දෙනෙකුගේ සේවය ලබා ගෙන ඇති බව.

අධිකාරියේ සභාපති විසින් මෙහිදී පහත කරුණු කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

i. අධිකාරිය යටතේ ඇති ව්‍යාපෘතිවල සේවයේ නියුතු උපදේශකවරුන් 43 කට ආසන්න සංඛ්‍යාවකගේ තනතුරු අහෝසි කර ඇති බවත් හා එම උපදේශකවරුන් ව්‍යාපෘතිවල අවශ්‍යතාවය මත මසකට රු.65,000/-ක උපරිමයකට යටත්ව දීමනාවක් ගෙවමින් ඔවුන්ගේ සේවය ලබා ගෙන ඇති බව සහ එය බඳවා ගැනීමක් නොවන බව.

ii. මාස 03ක් ඇතුළත නව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කළ යුතු බවත් හා එතෙක් නිලධාරීන් බඳවා ගැනීම හා උසස් කිරීම සිදු නොකළ යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව.

iii. ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත උසස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නොමැති බවත්, ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත උසස් කිරීම සම්බන්ධව පාලන අංශයේ නොදැනුවත්කමින් වරදක් සිදු වී ඇති බව අධිකාරියේ සභාපති විසින් පිළිගෙන ඇති බවත් සහ එය නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව.

**<u>නිර්දේශ</u>**

i. මෙම උපදේශකවරුන් හා මහජන සම්බන්ධතා නිලධාරීන්ගේ පහත සඳහන් තොරතුරු ඇතුළත් වාර්තාවක් සතියක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

- නම සහ ලිපිනය
- ගෙවනු ලබන දීමනාව
- අනුයුක්ත කර ඇති ව්‍යාපෘතිය
- බඳවා ගන්නා ලද ක්‍රමවේදය
- අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්
- පත්වීම් දිනය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPH/HWY/ACC/13/2017/28 හා 2017.11.10 දිනැති ලිපිය මගින් පත් කරන ලද උපදේශකවරුන් හා මහජන සම්බන්ධතා නිලධාරීන්ගේ නාම ලේඛනය කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 04. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව

මාතර සිට හම්බන්තොට දක්වා දිවෙන දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව සම්බන්ධයෙන් පහත සඳහන් මූලික කරුණු පිළිබඳව කාරක සභාව වෙත පැහැදිලි කිරීමක් සිදු කරන මෙන් කාරක සභාවේ සභාපති විසින් ඉල්ලීමක් කරන ලදී.

- මෙම මාර්ග දිගුවේ වපසරිය හඳුනා ගත්තේ කෙසේද?
- ඒ සඳහා සකස් කරන ලද ශක්‍යතා අධ්‍යයනය වාර්තාව
- ඇස්තමේන්තු සකස් කරන ලද්දේ කෙසේද?

මෙහිදී, ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- මේ සඳහා, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වර්ෂ 2013දී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබූ බව
- එම ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකස් කිරීම සඳහා මැනුම් දෙපාර්තමේන්තුව වැනි වෙනත් ආයතන වල සහයෝගයද ලබා ගත් බව
- මෙම ව්‍යාපෘතිය අයත් වන්නේ සැලසුම් හා ඉදිකිරීම් ස්වභාවයට (Design & Build) බව
- වර්ෂ 2013දී ලංකා හයිඩ්‍රොලික් ඉන්ස්ටිටියුට් නමැති ආයතනය මගින්, අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අදාළව ජල විද්‍යාත්මක (hydraulic) අධ්‍යයනයක් සිදු කළ බව
- එම වාර්තාවේ අඩංගු කරුණු මොරටුව විශ්වවිද්‍යාලය මගින් නැවත සහතික කර ගැනීමට කටයුතු කළ බව
- ඉන් අනතුරුව borehole investigation ලෙස හඳුන්වන භූමියේ විමර්ශන කටයුතු සිදු කළ බව
- ඉහත අධ්‍යයනයන්ගෙන් පසුව මූලික සැලැස්ම සකස් කරනු ලබන බව

**නිර්දේශ**

පහත සඳහන් වාර්තා සති 02ක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

i. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ ශක්‍යතා අධ්‍යයනයේ වාර්තාව

ii. ව්‍යාපෘතියට අදාළව සිදු කරන ලද EIA වාර්තාව. (Environmental Impact Assessment Report)

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 05. <u>ශක්‍යතා අධ්‍යයන වාර්තාව</u>

මෙහිදී කාරක සභාවේ සභාපති විසින් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් අධිකාරියේ නිලධාරීන් වෙත ඉදිරිපත් කර, එය දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවට අදාළ නිවැරදි ශක්‍යතා වාර්තාවමදැයි විමසන ලද අතර, එම වාර්තාව සැකසූ ආයතනයක් හෝ පුද්ගලයන්ගේ නම් ඇතුළත් නොවන බැවින් එම වාර්තාව සැකසීම සඳහා වගකීම ගනු ලබන්නේ කවුරුන්ද යන්න සහ එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළාද යන්න විමසා සිටින ලදී.

මෙහිදී ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ, එය නිවැරදි ශක්‍යතා අධ්‍යයන වාර්තාව බවත් හා මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය විසින් එය සකස් කර ඇති බවත්ය.

මෙම කරුණ සම්බන්ධව අධ්‍යක්ෂ (සැලසුම්) විසින් පහත කරුණු ඉදිරිපත් කරන ලදී.

i. 2013 වර්ෂයේදී දකුණු අධිවේගී මාර්ගයේ දිගුව සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සැලසුම් අංශය විසින් සකස් නොකළ බව

ii. එම වාර්තාවේ මූල්‍ය කටයුතු වලට අදාළ එක් පරිච්ඡේදයක් පමණක් සැලසුම් අංශය මගින් සකස් කළ බව

iii. එහි එක් එක් පරිච්ඡේද වලට අදාළව එක් එක් අංශ මගින් සකස් කරන ලද වාර්තා එකලස් කර, මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ(සැලසුම්) විසින් අවසන් ශක්‍යතා අධ්‍යයන වාර්තාව සම්පාදනය කර ඇති බව

මොරටුව විශ්වවිද්‍යාලය මගින් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයනයේදී “not feasible” ලෙස දක්වා ඇති බව කාරක සභාවේදී අනාවරණය විය. තවද මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර නොමැති බව සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත් බව ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සනාථ කරන ලදී.

<u>**නිර්දේශ**</u>

i. ශක්‍යතා අධ්‍යයන වාර්තාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත් බවට ලිඛිත සාක්ෂි කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාව විසින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

## 06. <u>දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම</u>

පහත කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

i. ඉංජිනේරු ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත් ප්‍රදානය කළ වටිනාකම අතර ප්‍රමාණාත්මක විචලනයක් දක්නට ලැබීම

ii. අංශ 01 කොටසේ ගලපන ලද ඇස්මේන්තු මුදල අනුව, කොන්ත්‍රාත්කරු සමග එකඟ වූ මුදලේ රේටයන් 40%කින් ඉහළ ගොස් තිබීම.

iii. රේටයන් පිළියෙල කිරීමේදී, මීට පෙර ඉදි කරන ලද අධිවේගී මාර්ග සඳහා ඉදිරිපත් කරන ලද රේටයන් සමග සංසන්දනය කිරීමක් සිදු කළාද යන බව සහ අගයන් අතර වැඩිවීමක් දක්නට තිබේද යන වග

iv. ඉංජිනේරු ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව අතර ඇති වෙනස සඳහා පාදක වන කරුණු මොනවාද යන බව

v. අවසාන ඇස්තමේන්තුවක් සාදා තිබේද යන බව

අධිකාරියේ සභාපති ඇතුළු එක් එක් ව්‍යාපෘති භාර අධ්‍යක්ෂවරු විසින් පහත කරුණු පැහැදිලි කරන ලදී.

i. ඉංජිනේරු ඇස්තමේන්තුව පදනම් වන්නේ BOQ (Bill of Quantity) හි අප විසින් හඳුනා ගන්නා ලද ප්‍රමාණයන් සහ HSR (Highway Schedule of Rates) අනුව බව

ii. කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව පදනම් වන්නේ, අධිකාරියේ HSR මත නොව, ඒ වන විට පවතින වෙළඳපොල වටිනාකම මත තීරණය වූ HSR මත බව

iii. පෙර ඉදි කරන ලද අධිවේගී මාර්ග සමග පිරිවැය සංසන්දනය කිරීමක් සිදු කළ බව

iv. පිරිවැය සංසන්දනය කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා නව අගයන්වල වැඩි වීමක් දක්නට ලැබුනු බව. ( sec 01වල 20%ක්, sec 02 වල 19%ක්, sec 03 වල 32%ක් සහ sec 04 වල 17%ක් ලෙස ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අගයන් වැඩි වී ඇත)

v. Section 01 සඳහා පුරෝකථනය කරන ලද අවසාන ඇස්තමේන්තුව රු. බිලියන 111ක් බව.

vi. Section 02 සඳහා පුරෝකථනය කරන ලද අවසාන ඇස්තමේන්තුව රු. බිලියන 55.1ක් බව සහ අනෙකුත් වියදම් ඇස්තමේන්තුව රු.බිලියන 09ක් බව

vii. Section 03 සඳහා පුරෝකථනය කරන ලද අවසාන ඇස්තමේන්තුව රු. බිලියන 33.5 ක් බව

viii. Section 04 සඳහා පුරෝකථනය කරන ලද අවසාන ඇස්තමේන්තුව රු. බිලියන 52.1 ක් බව

**07.** **මධ්‍යම අධිවේගී මාර්ගය**

මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සම්බන්ධව කාරක සභාව ඉදිරියේ පහත ගැටලු උද්ගත විය.

i. මධ්‍යම අධිවේගී මාර්ගය මංතීරු කීයකින් සමන්විතද?

ii. මාර්ගයේ එක් එක් අදියර වල ඉංජිනේරු ඇස්තමේන්තුව කීයද?

iii. එම එක් එක් අදියර සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කළ වටිනාකම කීයද?

iv. මෙම ව්‍යාපෘති රක්ෂණය කිරීමට උපදෙස් දී ඇත්තේ රාජ්‍ය ආයතන වල වුවද, බොහෝ ව්‍යාපෘති රක්ෂණය කර ඇත්තේ පුද්ගලික සමාගම් වලය. ඒ සඳහා හේතු මොනවාද?

මෙහිදී, අධිකාරියේ සභාපති විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

i. මධ්‍යම අධිවේගී මාර්ගය මංතීරු 04කින් සමන්විත බව

ii. මාර්ගයේ 01 කොටස සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.බිලි.129ක් හා කොන්ත්‍රාත් ප්‍රදානය කළ වටිනාකම රු. බිලි.158ක් බව

iii. මාර්ගයේ 03 කොටස සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.බිලි.126.89ක් හා කොන්ත්‍රාත් ප්‍රදානය කළ වටිනාකම රු. බිලි.137.1ක් බව

iv. මාර්ගයේ 03 කොටස සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.බිලි.123.5ක් හා එම කොන්ත්‍රාත්තුව තවම ප්‍රදානය කර නොමැති බව

v. ව්‍යාපෘති රක්ෂණය කිරීම සිදු කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නොව අදාළ කොන්ත්‍රාත්කරු විසින්ම බව

**නිර්දේශ**

i. මධ්‍යම අධිවේගී මාර්ගයේ ව්‍යාපෘති වල කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා දැනට සිදු කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ සම්පූර්ණ විස්තර ඇතුළත් වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

ii. උක්ත වාර්තාව පදනම් කර ගනිමින්, විගණන පරීක්ෂණයක් සිදු කර එම වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත නියෝග කරන ලදී.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ඉහත නිර්දේශ අංක i මගින් ඉල්ලා ඇති වාර්තාව 2018.03.31 දින වන විටත් කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

# <u>රුහුණ විශ්වවිද්‍යාලය</u>

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 සැප්තැම්බර් මස 21 වන දින**

**<u>සටහන</u>**

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය සතු විශ්වවිද්‍යාලයන් සියල්ල වෙන වෙනම කාරක සභාව ඉදිරියට කැඳවා, එකිනෙක විශ්වවිද්‍යාලයන්හි පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡා කර එම ගැටලු හඳුනාගැනීමටත්, ඒ අනුව සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම උන්නතිය උදෙසා එම හඳුනාගත් ගැටලු සම්බන්ධයෙන් පොදුවේ ගතයුතු ක්‍රියාමාර්ග හා නිර්දේශ ඇතුළත් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කාරක සභාව තීරණය කරන ලදී.

එසේ හෙයින් රුහුණ විශ්වවිද්‍යාලය 2017 සැප්තැම්බර් මස 21 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවා සිදු කරන ලද විමර්ශනයට අදාල තොරතුරු කාරක සභාව විසින් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාව මගින් ඉදිරිපත් කරනු ඇත.

# කැලණිය විශ්වවිද්‍යාලය

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය)
*(2018.12.28 දින සිට මෙම ආයතනය නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ)*

**විමර්ශනය කරන ලද දිනය : 2017 සැප්තැම්බර් මස 22 වන දින**

**සටහන**

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය සතු විශ්වවිද්‍යාලයන් සියල්ල වෙන වෙනම කාරක සභාව ඉදිරියට කැඳවා, එකිනෙක විශ්වවිද්‍යාලයන්හි පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡා කර එම ගැටලු හඳුනාගැනීමටත්, ඒ අනුව සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම උන්නතිය උදෙසා එම හඳුනාගත් ගැටලු සම්බන්ධයෙන් පොදුවේ ගතයුතු ක්‍රියාමාර්ග හා නිර්දේශ ඇතුළත් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කාරක සභාව තීරණය කරන ලදී.

එසේ හෙයින් කැලණිය විශ්වවිද්‍යාලය 2017 සැප්තැම්බර් මස 22 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවා සිදු කරන ලද විමර්ශනයට අදාල තොරතුරු කාරක සභාව විසින් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාව මගින් ඉදිරිපත් කරනු ඇත.

## වාර්තාවේ ඇතුළත් ආයතනයන්හි බදු පෙර ලාභය / (අලාභය) හෝ අතිරික්තය / (ඌණතාවය)

## Profit/ (Loss) before Tax (COPE – 2017)

| No | Entity | Profit / (Loss) before Tax for the year ended 31st December (Rs.) | | |
|---|---|---|---|---|
| | | 2016 | 2015 | 2014 |
| 1 | State Pharmasuiticals Corporation | 1,867,608,521 | 1,230,137,320 | 741,553,839 |
| 2 | Sri Lanka Telecom | 2,643,000,000 | 2,795,000,000 | 4,859,000,000 |
| 3 | Sri Lanka Transport Board | (632,619,173) | (751,260,744) | (1,228,021,529) |
| 4 | Milco (Pvt) Ltd. | 339,331,549 | 3,817,741 | 248,159,134 |
| 5 | State Pharmasuitical Coropration | 441,164,887 | 414,501,247 | 266,481,394 |
| 6 | Sri Lankan Airlines Ltd. | (12,621,690,000) | (16,433,030,000) | (32,357,980,000) |
| 7 | Regional Development Bank | 1,255,599,863 | 971,914,920 | 928,668,064 |
| 8 | Paddy Marketing Board | (5,894,325,856) | (1,771,072,410) | (1,126,977,106) |
| 9 | National Livestock Development Board | 9487,130 | 35,095,663 | 60505,358 |

**Net Surplus/ (Deficit) before Tax (COPE – 2017)**

| No | Entity | Surplus / (Deficit) before Tax for the year ended 31st December (Rs.) | | |
|---|---|---|---|---|
| | | 2016 | 2015 | 2014 |
| 1 | University of Colombo | 176,157,091 | 326,038,151 | 372,221,037 |
| 2 | Sri Lanka Institute of Advanced Technological Education | 81,198,533 | 16,516,167 | 54,087,414 |
| 3 | Road Development Authority | 7,872,136,608 | 1,794,773,606 | (4,962,677,696) |
| 4 | University of ruhuna | (76,040,206) | 29,901,759 | (70,332,415) |
| 5 | University of Kelaniya | 495,212,649 | 474,804,754 | 122,261,416 |
| 6 | Sabaragamuwa University | 26,902,016 | (22,927,315) | (59,919,196) |
| 7 | National Apprentice & Industrial Traning Authority | 21,878,483 | (84,748,374) | (19,566,476) |
| 8 | Hector kobbekaduwa Agrigarian Research & Traning Institute | 10,547,296 | (15,718,659) | (10,364,363) |